HDFC BANK
The Bank for your Home

# වර්ධන ක්‍රමෝපාය

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | වාර්ෂික වාර්තාව 2016

ලාභදායීත්වය උසස් කිරීම

ආදායමට පිරිවැය අනුපාතය කළමනාකරණය කිරීම, අක්‍රිය ණය අනුපාතය පාලනය කිරීම, පොළී ආදායම ඉහළ දැමීම සඳහා ආයෝජන කළඹ ප්‍රසාරණය කිරීම සහ පරිණතතාවයේ නොගැලපීම් කළමනාකරණය කිරීම.

පාරිභෝගික පදනම ඉහළ දැමීම සඳහා ශාඛා ජාලය ප්‍රසාරණය කිරීම, තැන්පතු වර්ධනයක් ඇතිකිරීම, ඉහළ ආදායම් ලබන පාරිභෝගිකයින්, සාංගමික පාරිභෝගිකයින් හා ව්‍යාපෘති මූල්‍යයනය ඉලක්ක කරගනිමින් ණය වර්ධනය වේගවත් කිරීම.

උසස් බැංකුකරණ උපකාරක පහසුකම් සපයන නව හර බැංකුකරණ පද්ධතියක් සහ නව නිෂ්පාදිත සංවර්ධන හැකියාවන්

2020 අවසාන වන විට අපගේ ශේෂ පත්‍රය බිලියන 100 දක්වා වර්ධනය කිරීමට නව සිව් අවුරුදු සාංගමික සැලැස්ම.

උසස් කිරීම් උපාය මාර්ග පිළිබඳ අප විශ්වාස කරන්නෙමු. එය සමාගමේ වර්ධනය ඉලක්ක කරගත් එකක් සේමවඩාත් වැදගත් වන්නේ ඒ තුළින් අපගේ පාර්ශවකරුවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමයි. ආදායම් මට්ටම කුමක් වුවත් සැමටම ජීවය විකල්පයක් සඳහා මූල්‍ය ස්වාධීනභාවයක් සැකසීමේදී සුදුසු පැතිකඩක් සමඟ අප සැමවිටම ක්‍රියාත්මක වන්නෙමු. අපගේ උසස් කිරීම් උපාය මාර්ගය අප සතු උදාර අරමුණු වලට ලඟා විය හැකි අපගේ ව්‍යාපාරයේ සියළුම අංග කෙරෙහි අවධානය යොමු කර ඇති විස්තීර්ණ සැලැස්මක් සහිත දිගුකාලීන ඉලක්ක ඇති උපාය මාර්ගයකි.



**සෑම මට්ටමක වූ ඔබගේ**
**ගමන් මගෙහි**
හැම අදියරකදීම අප
සේවය කරන්නෙමු

# පටුන


| | |
|---|---|
| වාර්තාව පිළිබඳ හැඳින්වීම | 4 |
| අපගේ කථාව | 5 |
| අපගේ ව්‍යාපාර ආකෘතිය | 7 |
| නිෂ්පාදිත කළඹ | 8 |
| අපගේ ජාලය - සිතියම | 10 |
| මූල්‍ය උධෘතයන් | 12 |
| සභාපතිතුමන්ගේ පණිවුඩය | 14 |
| සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිතුමන්ගේ සමාලෝචනය | 17 |
| 2016 මූල්‍ය සමාලෝචනය | 20 |
| 2016 වර්ෂයේදී අපගේ නිෂ්පාදිත වල කාර්යඵලය | 24 |
| 2016 වර්ෂයේදී ප්‍රාග්ධනයන්හි වෙනස්වීම | 26 |
| වර්ධන උපායමාර්ගය | 28 |
| අපගේ අවදානම් කළමනාකරණය | 29 |
| යහපාලනය හා ආචාරධර්ම | 35 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා | 41 |
| අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය | 46 |
| අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ සහතිකවීමේ වාර්තාව | 48 |
| අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්තා | 50 |
| අනුකූලතා සමාලෝචනය | 59 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 90 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු | 92 |
| සාංගමික කළමනාකරණය | 96 |
| සාංගමික කළමනාකරණයේ තොරතුරු | 98 |
| ප්‍රාදේශීය කළමනාකරුවන් | 100 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | 101 |


## මූල්‍ය ප්‍රකාශන


| | |
|---|---|
| මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම | 104 |
| විගණකවරුන්ගේ වාර්තාව | 106 |
| ආදායම් ප්‍රකාශනය | 108 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 109 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 110 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය | 111 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 112 |
| ගිණුම්කරන ප්‍රතිපත්ති | 113 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 119 |
| එකතුකළ වටිනාකම් පිළිබඳ ප්‍රකාශනය | 142 |
| වර්ෂ 10 සඳහා සංඛ්‍යා දත්ත සාරාංශය | 143 |
| මූල්‍ය උපකරණ මිනුම්කරණය | 145 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය | 147 |
| ශේෂ පත්‍ර අනාවරණයන් මත අවදානම ගැලපීම | 148 |
| කොටස් පිළිබඳ තොරතුරු | 149 |
| සාංගමික තොරතුරු | 152 |
| වාර්ෂික මහා සභා රැස්වීම් නිවේදනය | 154 |
| පෙරකලාසි පත්‍රය | 155 |

# වාර්තාව පිළිබඳ හැඳින්වීම

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2016 වාර්ෂික වාර්තාව තවදුරටත් ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ 2013 ඒකාබද්ධ වාර්තාකරණ රාමුවට අනුගත කර ඇති අතර 2016 ජනවාරි 01 සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලසීමාව සඳහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය සහ අනෙකුත් වැදගත් මාතෘකා ආවරණය කර ඇත. ඊට අමතරව කොළඹ කොටස් හුවමාරුව සහ අනෙකුත් අදාළ නියාමන යටතේ වූ අනාවරණයන් මෙම වාර්තාව තුළ අන්තර්ගත වේ. බැංකුව පසුගිය වාර්ෂික වාර්තාවෙන් කිසිදු තොරතුරක් නැවත ප්‍රකාශ කර නැත.

### පාර්ශවකාර සබඳතා

සමාලෝචනයට ලක්වන වසර තුළ බැංකුව විවිධ පාර්ශවකාර කණ්ඩායම් සමඟ සම්බන්ධ වූ අකාරය පිළිබඳව සභාපතිතුමන්ගේ පණිවුඩය තුළ හා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිතුමන්ගේ සමාලෝචනය තුළ විස්තරාත්මකව පැහැදිලි කර ඇත.

වාර්ෂික වාර්තාව මූලික පාර්ශවකාර සන්නිවේදන ක්‍රමවේදයක් හෙයින් මෙම වාර්තාව ඉංග්‍රීසි සහ දමිළ භාෂාවට පරිවර්තනය කර ඇත. ඊට අමතරව මෙම වාර්තාවේ පිටපත් පොදු ව්‍යවසාය අමාත්‍යාංශයට සපයා ඇති අතර වඩා පහසුවෙන් හා ඉක්මණින් ලබාගැනීම සඳහා අපගේ වෙබ් අඩවියටද *(www.hdfc.lk)* ඇතුලත් කර ඇත.

### මෙම වාර්තාව සකස්කිරීමේ හා ඉදිරිපත් කිරීමේ පදනම

ප්‍රධාන පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් සහ නියාමන හා යහපාලන අනාවරණ අවශ්‍යතා මත පදනම්ව සභාපතිතුමන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ ඉහළ කළමනාකාරිත්වය විසින් අනාවරණ සඳහා වැදගත් මාතෘකා තෝරාගන්නා ලදී.

### ඒකාබද්ධ වාර්තාකරණ මූලධර්ම මත පිහිටීම

අපගේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා විගණකාධිපතිවරයා විසින් විශ්වාසනීයභාවය තහවුරු කර ඇති අතර සියළුම අනෙකුත් තොරතුරු අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරුන් අනුමත කර ඇත.

අනාවරණයන් සඳහා වැදගත් මාතෘකා තෝරාගැනීමේ ක්‍රියාවලියක් හරහා සංක්ෂිප්ත වාර්තාවක් නමුත් සම්බන්ධිත හා සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට අප උත්සාහ කර ඇත.

මීට අමතරව, මෙම වාර්තාව සකස් කිරීමේදී සභාපතිතුමන්ගේ, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිතුමන්ගේ හා ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයේ සෘජු දායකවීම හරහා 2016 මූල්‍ය වර්ෂය සඳහා අපගේ කාර්යඵලය හා අනාගත සැලසුම් පිළිබඳ සංගතභාවයක් සහ උපායමාර්ගික ස්වරූපයක් වාර්තාව තුළින් ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව පිළිබඳ අදහස් ප්‍රධාන මූල්‍ය නිලධාරියා වෙත යොමු කළ යුතුය.

**ඩී විදාන පතිරණ මහතා**
විද්‍යුත් තැපැල : cfo@hdfc.lk
දුරකථන : *+ 9411 235 6802/ + 9411 235 6829*

# අපගේ කථාව

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත (2003 අංක 15 සහ 2011 අංක 45 දරන පනත් මගින් සංශෝධිත) යටතේ සංස්ථාපනය කළ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. නිවාස මූල්‍ය විශේෂඥයකු වශයෙන් රටෙහි ප්‍රජාවට නිවාස වලට අදාළව මූල්‍ය උපකාරයන් සම්පාදනය කිරීමේ දශක 03 ක පමණ ඉතිහාසයක් අප සතුව ඇත. නිෂ්පාදිත කළඹ විවිධාංගීකරණය කිරීමෙන් හා නව වෙළෙඳපොළ අංශ වෙත යොමු වීම හරහා බැංකුව 2011 වර්ෂයේ සිට විවිධාංගීකරණ උපායමාර්ගයක් අනුගත කොට ඇත.

## හිමිකාරීත්වය

2016 වර්ෂය අවසාන වන විට රාජ්‍ය ආයතන හරහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 51% ක හිමිකාරීත්වයක් රාජ්‍ය අංශය සතු වූ අතර පෞද්ගලික සමාගම් සහ තනි පුද්ගලයින් සතුව 49% ක හිමිකාරීත්වයක් පැවතිනි.

## ඓතිහාසික මංසලකුණු

### 1984

සමාජය ගොඩනගන්නකු ලෙස සංස්ථාපනය වීම ජාතික නිවාස පනත යටතේ ලියාපදිංචි වීම.

### 1997

නිවාස සම්බන්ධ මූල්‍ය සේවා සම්පාදනයට අධිකාරිය සහිතව රාජ්‍ය සංස්ථාවක් ආරම්භ කිරීම සඳහා 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත පාර්ලිමේන්තුව මඟින් සම්මත කිරීම.

### 2000

1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත ගැසට් කිරීමත් ඉන් අනතුරුව ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විධිමත්ව ස්ථාපිත කිරීම. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ලෙස නම වෙනස් කිරීම (ඉන් අනතුරුව ශ්‍රී ලංකා HDFC බැංකුව ලෙස හැඳින්විය)

### 2003

විශේෂිත බැංකුවක් පිහිටුවීම සඳහා 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත සංශෝධනය කිරීම.

### 2005

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීම හා එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවට පෞද්ගලික අංශයේ අයෝජන ගලාඒම.

### 2011

1980 අංක 30 දරන බැංකු පනතේ ආකෘති iv හි සඳහන් ව්‍යාපාර අවස්ථාවන් ක්‍රියාත්මක කිරීමට බලතල පවරමින් ව්‍යාපාර මෙහෙයුම් පථය පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත තවදුරටත් සංශෝධනය කිරීම.

## අපගේ කථාව



HDFC බැංකුව යනු රටෙහි අවම පහසුකම් ලබන ප්‍රජාවට නිවාස ආශ්‍රිත මූල්‍ය සම්පාදනය කරනු ලබන දශක තුනකට වැඩි ශක්තිමත් ඉතිහාසයක් ඇති නිවාස මූල්‍ය විශේෂඥයෙකි

# අපගේ දැක්ම

සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ නිවාස සිහිනය සැබෑ කරගැනීමට නිවාස ආශ්‍රිත මූල්‍ය සම්පාදනයේ අවිවාදාත්මක වෙළෙඳපොළ නායකයා බවට පත්වීමයි.

වෙළෙඳපොළ කොටස සහ පාරිභෝගික කැමැත්ත තුළ අප වෙළෙඳපොළ නායකත්වය නිර්වචනය කරන්නෙමු. සෑම වසරකම මුදාහල අරමුදල් ප්‍රමාණය සහ මුළු කළඹෙහි කොටස මඟින් වෙළෙඳපොළ කොටස මනිනු ලබයි. සේවය ලබාගැනීමට කැමැති බැංකුව හෝ මූල්‍ය සේවා ආයතනය වීම සහ පාරිභෝගිකයින්ට ලබාදෙන සේවා මට්ටම මත පාරිභෝගික කැමැත්ත මනිනු ලැබේ.

# අපගේ මෙහෙවර

අපගේ කොටස් හිමියන්, පාරිභෝගිකයින්, සේවකයින්, ජාතික ආර්ථිකය, නියාමකයින් සහ ස්වාභාවික පරිසරය යන පුළුල් පරාසය තුළ අපගේ මෙහෙවර අප නිර්වචනය කර ඇත.

- අපගේ කොටස් හිමියන්ට, අපගේ මෙහෙවර වනුයේ ප්‍රතිලාභ උපරිම කිරීමයි.
- අපගේ පාරිභොගිකයින්ට, අපගේ මෙහෙවර වනුයේ ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉලක්ක කරමින් සේවා දායකත්වයන් සැපයීම සහ ඔවුන්ගේ අපේක්ෂාවන් අභිබවා නව්‍ය ලෙස ඔවුන් තෘප්තිමත් කිරීමයි.
- අපගේ සේවකයින්ට, අපගේ මෙහෙවර වනුයේ ඔවුන්ගේ විවිධ දක්ෂතා හැකියාවන් හඳුනාගැනීමත්, ආයතනික හා ජාතික නිවාස දැක්ම සාක්ෂාත් කරගැනීම උදෙසා ඔවුන්ව සංවර්ධනය කිරීම, අභිප්‍රේරණය කිරීම, පිළිගැනීම සහ වරප්‍රසාද ලබාදීමයි.
- ජාතික ආර්ථිකයට සහ ක්ෂේත්‍රයේ නියාමකයින්ට අප ජාතික නිවාස ප්‍රතිපත්තිය හැඩගන්වන සහ එයට මූල්‍ය සම්පාදනය කරන ප්‍රධාන මෙහෙයුම්කරු සහ නායකයා වේ
- අපගේ ස්වාභාවික පරිසරයට, සියළු කටයුතු සඳහා අප තිරසාරත්ව පරිචයන් බලාත්මක කර ඇත.

# අපගේ වටිනාකම්

අපගේ සංවිධාන සංස්කෘතිය පෝෂණය කරන සහ අපගේ සේවකයින්ගේ හැසිරීම් සහ ආකල්ප ඔප මට්ටම් කරන දෑ අපගේ වටිනාකම් වේ. එම නිසා අපගේ වටිනාකම් සියලුම සේවකයින්ට සන්නිවේදනය කිරීම අප වැදගත් කොට සලකන අතර උපාය මාර්ග සංවර්ධනයේදී, තීරණ ගන්නා අවස්ථාවලදී, දෛනික මෙහෙයුම් වලදී සහ බාහිර පාර්ශවකරුවන් සමඟ ගණුදෙනු කිරීමේදී එම වටිනාකම් වලට ඉහළ තැනැක් හිමි වේ.

- සෑම වෙලාවක සිදුවන සෑම ගණුදෙනුවකදීම අවංකභාවය
- වෙළෙඳපොළ වෙනස්වීම් වලට මුහුණ දීමේ හැකියාව හා නම්‍යශීලීත්වය
- සෑම විටම මිත්‍රශීලි හා සහයෝගී සේවා සම්පාදනය
- අපගේ දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා දක්ෂතා, දැනුම සහ පළපුරුද්ද ගොඩනැංවීම.

# අපගේ ව්‍යාපාර ආකෘතිය

## දැක්ම/මෙහෙවර/වටිනාකම්

**ප්‍රධාන ක්‍රියාකාරකම්**
- නිවාස මූල්‍ය
- කල්බදු
- උකස්
- තැන්පතු
- ව්‍යාපාර ණය
- සංවර්ධන ණය

**පාරිභෝගික කාණ්ඩ**
- අඩු ආදායම් ලබන්නන්
- වෘත්තිකයින්
- රාජ්‍ය සේවකයින්
- විශ්‍රාමිකයින්
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්
- ක්ෂුද්‍ර ව්‍යවසායකයින්

**මාධ්‍යය**
- Palmtop බැංකුකරුවන්
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර
- ශාඛා

**ප්‍රධාන හවුල්කරුවන්**
- රාජ්‍ය ආයතන

**අප වටිනාකම් නිර්මාණය කරන්නේ කෙසේද?**
- අපගේ Palmtop බැංකුකරුවන් විසින් ඔබගේ ජීවන කටයුතු පහසුකිරීම සඳහා බැංකු කටයුතු ඔබ අභියසට රැගෙන එනු ඇත.
- සෑම විටම අපගේ පාරිභෝගිකයින්ගේ වර්ධනයට පහසුකම් සපයන දිගු කාලීන සබඳතාවයන් සඳහා අප ඉලක්ක කරනු ලැබේ.
- අපගේ පාරිබෝගියන්ට දැනුවත්භාවයෙන් තීරණ ගැනීමට උපකාරීවීම සඳහා මූල්‍ය සාක්ෂරතාවයට අප ආයෝජනය කර ඇත.

**අපගේ දේශයට දායකත්වය**
- බදු සහ ලාභාංශ වශයෙන් ජාතික භාණ්ඩාගාරයට අප දායක වී ඇත
- රජයේ දිළිඳුබව අඩු කිරීමේ අරමුණු වලට සහයෝගය ලබාදීම සඳහා පහසුකම් නොලත් වෙළෙඳපොළවල් සඳහා අප සංවර්ධන ණය යොමු කිරීම.
- රටෙහි පහසුකම් නොලත් අංශවල මධ්‍ය හා අඩු ආදායම් ලබන ප්‍රජාවන්හි ජීවන තත්ත්වය අප සෘජුව උසස් කිරීම.
- අප විසින් අවිධිමත් ආර්ථික විධිමත් බැංකුකරණ අංශය වෙත රැගෙන ඒම.

**මූල්‍ය ප්‍රාග්ධනය**
- මහජන තැන්පතු අපගේ ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය වේ. ඊට අමතරව අප සතුව හිමිකම් හා ණය ප්‍රාග්ධනයක් පවතී. අපගේ ආදායම්;
- පොළී ආදායම්
- පොළී නොවන ආදායම්
- ආයෝජන ආදායම්
- ගාස්තු පදනම් ආදායම්

**සමාජ හා සබඳතා ප්‍රාග්ධනය**
- HDFC සන්නාමය අපගේ පාරිභෝගිකයින් අතර ඉතා ප්‍රසිද්ධ හා විශ්වාසයට පාත්‍ර වී ඇත. මෙම කීර්තිනාමය වසර ගණනාවක් පුරා උපයා ගත් අතර එය ගණනය කළ නොහැකි වත්කමකි.

**මානව ප්‍රාග්ධනය**
- අපගේ මානව ප්‍රාග්ධනයට පුහුණුව ලත් හා පලපුරුදු ප්‍රධාන කාර්යාලීය හා ශාඛා සේවකයින් සහ වර්ධනය වෙමින් පවතින අපගේ Palmtop බැංකුකරුවන් කණ්ඩායමද ඇතුලත් වේ.

**බුද්ධිමය ප්‍රාග්ධනය**
- මධ්‍ය හා අඩු ආර්ථික කොටස් වල නිවාස මූල්‍යයන පිළිබඳ වසර ගණනාවක ආයතනික දැනුමක් අප සතු වේ. නවීන තොරතුරු තාක්‍ෂණ පද්ධති මඟින් මෙම බුද්ධිමය ප්‍රාග්ධනය සඳහා උපකාරය ලැබී ඇත.

**පාරිසරික වගකීම**
- වගකීම් මුල්කරගත් පරිචයන් හරහා අප පාරිසරික වගකීමක් ඇති ව්‍යාපාර මෙහෙයුම් ඉලක්ක කර ඇත.

බැංකුව හමුවේ ඇති මූල්‍ය හා වෙළෙඳපොළ අවදානම් වලට මුහුණ දීමට සහ බැංකුවේ අනාගත මූල්‍ය තිරසාරත්වය සහතික කිරීම සඳහා සංවර්ධනය කළ නිෂ්පාදිත හා වෙළෙඳපොළ විවිධාංගීකරණ උපායමාර්ගය යටතේ 2013 වර්ෂයේ සිට අපගේ ව්‍යාපාර ආකෘතිය ශක්තිමත්ව වර්ධනය වී ඇත.

අපගේ නිෂ්පාදිත විවිධාංගීකරණ උපායමාර්ගය හරහා බැංකුව විසින් සාම්ප්‍රදායික නිවාස මූල්‍යයනට අමතරව මූල්‍ය නිෂ්පාදිත හා සේවා ගණනාවක් හඳුන්වා දී ඇත. මෙම නව නිෂ්පාදිත මඟින් බැංකුවට අමතර ආදායම් මාර්ග විවර කළ අතර ලාභදායීත්වය වර්ධනය කරන ලදී. ඊට අමතරව බැංකුව නව විශේෂ වෙළෙඳපොළ අංශ වෙත ඉතා ක්‍රියාකාරිව හඹා යන ලදී. HDFC බැංකුව රටෙහි අඩු හා මධ්‍ය ආදායම් ලබන පාරිභෝගික කණ්ඩායම් අතර සාම්ප්‍රදායිකව ක්‍රියාකාරි වන අතරතුර මධ්‍ය හා ඉහළ ආදායම් කාණ්ඩය තුළ වූ විශේෂ පාරිභෝගික කණ්ඩායම් සඳහා නවීන නිෂ්පාදිත හා සේවා සැපයීමට බැංකුවට හැකියාව ලැබී ඇත. මෙම වෙළෙඳපොළ පුළුල් කිරීම් සඳහා 2016 දී දියත් කිරීමට නියමිත තාක්‍ෂණික උසස් කිරීම් උපකාරී වනු ඇත.

ණයකරයක් හරහා ලබාගත් රු. බිලියන 04 ක ප්‍රාග්ධන සම්පාදනය සමඟ 2015 වර්ෂයේදී මූල්‍ය පදනම තවදුරටත් ශක්තිමත් විය. එසේම වර්ධන සැලසුම් වේගවත් කිරීම සඳහා අපගේ මහජන තැන්පතු පදනමද අප විචක්‍ෂණශීලීව පුළුල් කරමින් සිටී.

# නිෂ්පාදිත කළඹ

## ණය නිෂ්පාදිත

**කැදැල්ල**

දේපළෙහි ප්‍රාථමික උකස මත වූ නිවාස ණය යෝජනා ක්‍රමය

**ශ්‍රම උදාන**

සේවක අර්ථසාධක අරමුදල් ශේෂය මත සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයින් සඳහා වූ නිවාස ණය ක්‍රමය

**Lifestyle ණය**

නම්කරන ලද සැපයුම්කරුවන්ගෙන් නිවාස උපකරණ මිලදී ගැනීමට

**සිටු සෙවන**

ඔබගේ ජීවන රටාවට ගැලපෙන වටිනාකමක් එකතුකළ නිවාස ණය

වෘත්තිකයින්ගේ ණය

**වෘත්තිකයින්ගේ ණය**

නිවාස අවශ්‍යතා සඳහා සුදුසුකම් ලත් වෘත්තිකයින්ට ලබාදෙන ණය

**සිරිසර නිවාස ණය**

දැනට සිටින පාරිභෝගිකයින්ගේ ජීවන ප්‍රමිතීන් ඉහළ දැමීම සඳහා උසස් කළ ණයකි.

**රන් ණය**

හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා රත්‍රං වටිනාකම මත ලබාදෙන ණය

**HDFC කල්බදු**

පාරිභෝගිකයින්ගේ පෞද්ගලික හා ව්‍යාපාරික අවශ්‍යතා සැපිරීම සඳහා වූ වේගවත්, වඩාත් පහසු කල්බදු විසඳුම්.

**අධ්‍යාපනික ණය**

අධ්‍යාපනික අවශ්‍යතා සඳහා උකස් මත ලබාදෙන ණයකි.

**ක්ෂුද්‍ර මූල්‍ය**

සාමූහික ඇප මත ස්වයං රැකියා කරන කණ්ඩායම් සඳහා ලබාදෙන මූල්‍ය පහසුකම්

**ව්‍යාපාරික ණය**

උකස් කිරීම් මත ලබාදෙන ව්‍යාපාර උසස් කිරීම් ණය

**දිරිය සහ විරුදිරිය**

රජයේ විශ්‍රාමිකයින් මූල්‍ය අවශ්‍යතා සඳහා සහ දිවි අහිමි වූ යුද විරුවන්ගේ යැපෙන්නන් වෙනුවෙන් විවිධ මූල්‍ය අවශ්‍යතා සඳහා උපකාර වීමට ඇති අසමසම ණය යෝජනා ක්‍රමයකි.

# ඉතුරුම් නිෂ්පාදිත

### ප්‍රතිලාභ

විශේෂ ප්‍රතිලාභ, දිවයින පුරා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මඟින් මුදල් ආපසු ලබාගත හැකි, අන්තර්ජාල බැංකුකරණ පහසුකම් සහිත සහ ජංගම දුරකථන බැංකුකරණ සේවා සඳහා පිවිසිය හැකි සාමාන්‍ය ඉතුරුම් ගිණුමකි.

### තිළිණ

ඉතුරුම් ශේෂය ඉහළ යෑම මත ආකර්ෂණීය ත්‍යාග හිමිවන බාලවයස්කාර ගිණුමකි.

### තිළිණ රැකවරණ

දරුවන්ගේ අනාගත මූල්‍ය ආරක්ෂණය සහතික කිරීමට ඇති අසමසම ආයෝජන සැලැස්මකි.

### අරුම්බු

තිළිණ රැකවරණ තැන්පතුවට සමාන ප්‍රතිලාභ සහිත බැංකුවක් එතෙක් මෙතෙක් දමිළ කථාකරන ප්‍රජාව වෙනුවෙන් නිර්මාණය කල මූල්‍ය උපකරණයකි.

### විශ්‍රාම රැකවරණ

වෙළෙඳපොළෙහි ඉහළ පොළී අනුපාත සහ නම්‍යශීලි තැන්පතු විකල්ප සමඟ සමාන කළ නොහැකි ප්‍රතිලාභ ලබාදෙන විශ්‍රාම සැලසුම් ක්‍රමයකි.

### විශ්‍රාම උදාන

වෙළෙඳපොළ අනුපාත අභිබවා පොළී ඉපයිය හැකි ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා වූ ස්ථාවර තැන්පතුවකි.

# ජාලය - සිතියම

## ශාඛා ජාලය



### බස්නාහිර - දකුණ

- කොළඹ
- හෝමාගම
- හොරණ
- හයිඩ් පාර්ක්
- නුගේගොඩ
- පිලියන්දල
- අවිස්සාවේල්ල

### බස්නාහිර - උතුර

- ගම්පහ
- ජාඇල
- කිරිබත්ගොඩ
- නිට්ටඹුව
- පෑලියගොඩ

### ඌව

- බදුල්ල
- මොනරාගල
- තිස්සමහාරාම
- රත්නපුර
- අම්පාර
- මඩකලපුව
- නුවරඑළිය

### දකුණ

- කළුතර
- අම්බලන්ගොඩ
- ගාල්ල
- මාතර
- තංගල්ල
- ඇඹිලිපිටිය

### වයඹ

- යාපනය
- වවුනියාව
- හලාවත
- කුලියාපිටිය
- නිකවැරටිය
- අනුරාධපුරය
- පොලොන්නරුව
- ත්‍රිකුණාමලය
- දඹුල්ල

### මධ්‍යම

- කෑගල්ල
- මාතලේ
- කුරුණෑගල
- නුවර
- ගම්පොළ

# මූල්‍ය උද්ධෘතයන්

| | 2016 රු.මිලියන | 2015 රු.මිලියන | වෙනස % |
|---|---|---|---|
| **වර්ෂය සඳහා ප්‍රතිඵල** | | | |
| ආදායම | 5,928 | 4,925 | 20 |
| බදු පෙර ලාභය | 848 | 1,009 | (16) |
| බදුකරණය සඳහා ප්‍රතිපාදන | 459 | 500 | (8) |
| බදු පසු ලාභය | 390 | 509 | (23) |
| රජයට ආදායම | 472 | 512 | (8) |
| දළ ලාභාංශය | | | |
| **වර්ෂය අවසානයේදී** | | | |
| කොටස් හිමියන්ගේ අරමුදල | 3,728 | 3,364 | 11 |
| ගණුදෙනුකරුවන්ගෙන් ලද තැන්පතු | 32,123 | 28,593 | 12 |
| ගණුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම් | 31,052 | 27,316 | 14 |
| මුළු වත්කම් | 45,622 | 41,913 | 9 |
| **සාමාන්‍ය කොටසක් සඳහා තොරතුරු** | | | |
| ඉපයුම (මූලික) (රු.) | 6.03 | 7.87 | (23) |
| **මූල්‍ය අනුපාත** | | | |
| කොටස් හිමියන්ගේ අරමුදල් වල සාමාන්‍ය මත ප්‍රතිලාභ (%) | 11.01 | 16.30 | (32) |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (%) | 0.89 | 1.33 | (33) |
| මුළු වත්කම් වලට කොටස් හිමියන්ගේ ප්‍රාග්ධනය (%) | 8.17 | 8.03 | 2 |
| **ව්‍යවස්ථාපිත අනුපාත** | | | |
| ද්‍රවශීල වත්කම් (%) | 29.90 | 35.03 | (15) |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය | | | |
| මට්ටම 01 (%) - අවම අවශ්‍යතාවය 5 % | 14.02% | 13.67% | 3 |
| මට්ටම 02 (%) - අවම අවශ්‍යතාවය 10 % | 12.65% | 12.18% | 4 |
| **වෙනත් තොරතුරු** | | | |
| ශාඛා | 38 | 38 | - |
| සේවක සංඛ්‍යාව | 570 | 561 | 2 |
| ණය ශ්‍රේණිය - ෆිච්/ලංකා රේටින් | BBB(lka) Stable | BBB+ Stable | |

### ණය අත්තිකාරම් සහ තැන්පතු




### මුළු වත්කම්




### ආදායම




### වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම මත ප්‍රතිලාභය




### ලාභ වර්ධනය



# සභාපතිතුමන්ගේ පණිවුඩය



2016 වර්ෂය සඳහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ (HDFC බැංකුවේ) ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අපගේ කොටස්හිමියන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ඉදිරිපත් කිරීමට ලැබීම මා හට ඉමහත් සතුටකි.

අපගේ පාරිභෝගිකයින් හට නිෂ්පාදිත හා සේවා සැපයීමේදී හා සමස්ථ නිවාස ක්ෂේත්‍රය තුළ වූ අපගේ සහභාගීත්වය පුළුල් කිරීමේදී අපගේ ප්‍රවේශයේ වෘත්තීයභාවය ලඟාකරගැනීමේදී HDFC බැංකුව එහි ගමන්මඟ තුළ ස්ථිර ප්‍රගතියක් සතු කරගෙන ඇති බව සතුටින් දන්වා සිටිමි. ප්‍රධාන වශයෙන් අප හට පාලනය කළ නොහැකි බාහිර හේතූන් මත 2015 වර්ෂයට සාපේක්ෂව අපගේ ලාභදායීත්වය තරමක් පහළ ගියද අනාගත කාර්යඵල ඉහළ යෑමට හේතුවන්නා වූ යහපාලන පද්ධති හා මෙහෙයුම් කාර්යක්ෂමතාවන් උසස් කොට ඇත. සමස්ථ ශාඛා ජාලය එකිනෙකට සම්බන්ධ කරනු ලබන 2017 ජනවාරි මාසයේදී ස්ථාපිත කිරීම අවසන් කළ නව තොරතුරු තාක්ෂණ පද්ධතිය වූ අපගේ නව හර බැංකුකරණ පද්ධතිය මෙම සියළුම වර්ධනීය තත්ත්වයන්හි කේන්ද්‍රස්ථානය විය. මීට අමතරව 2020 වර්ෂය අවසානයේදී අපගේ ශේෂ පත්‍රය රුපියල් බිලියන 100 දක්වා වර්ධනය කරගැනීමට අප සිව් අවුරුදු සාංගමික සැලැස්මක් ක්‍රියාවට නංවන ලදී. අපගේ වර්ධන සැලසුම් පිළිබඳ වැඩි විස්තර අනාගත පැතිකඩ කොටසෙහි අන්තර්ගත වේ.

## කොටස්හිමියන්ගේ අපේක්ෂාවන් ලඟාවීම

අනාගත වර්ධනයට සහ තිරසාරත්වයට අපගේ ප්‍රධාන පාර්ශවකරුවන් අත්‍යවශ්‍ය සාධකයක් බව මා විශ්වාස කරන අතර විවිධ පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් අප සමබර කරගත්තේ කෙසේද යන්න ඉතා කෙටියෙන් පැහැදිලි කිරීමට මා මෙය අවස්ථාවක් කරගන්නෙමි.

බහුතරය රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත ව්‍යාපාරයක් ලෙස ආදායම් උත්පාදනය සහ රැකියා නිර්මාණය කිරීම සඳහා වූ රජයේ ආර්ථික ප්‍රතිපත්ති සඳහා සහයෝගය ලබාදීමට අප සතුව වගකීමක් ඇත. මෙම තත්ත්වය තුළ විශේෂයෙන් නිර්මාණය කළ ණය යෝජනාක්‍රම සහ අධ්‍යාපනික හා තාක්ෂණික සහයෝගයන් හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනයට බැංකුව

සැලකිය යුතු දායකත්වයක් ලබාදී ඇත. අප විසින් සුළු පරිමාණ ව්‍යාපාර වලට පමණක් නොව ඔවුන්ගේ සේවකයින්ට පවා උපකාර වන සාකල්‍ය මූල්‍ය පැකේජයන් සංකල්පයන් හඳුන්වාදී දෙන ලදී. පොල් කර්මාන්තය නිදසුනකි. පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ට අප මූල්‍ය උපකාර සම්පාදනය කළ අතර පොල් කර්මාන්තයේ සේවකයින් සඳහා නිවාස මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය සහ පොල් මෝල් හිමියන් සමඟ ත්‍රෛපාර්ශික එකඟතාවක් මත අප මූලික වී ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනාක්‍රමය මඟින් සේවකයින් පොල් කර්මාන්තයෙන් ඉවත් වීම වැලකීමේ පුළුල් ආර්ථික බලපෑමක් ඇති බවත් පසුව එය ක්ෂේත්‍රයේ වර්ධනයට පහසුකම් සපයන බවත් අප දැඩිව විශ්වාස කරන්නෙමු. කිරි කර්මාන්තය තුළ, HDFC බැංකුව තනිවම ජාතික ණය නිකුත් කිරීම් තුළින් 42% ක් වාර්තා කර ඇත.

කෘෂිකාර්මික කලාප යටතේ අපගේ සහභාගීත්වය තවදුරටත් තීක්ෂණ අයුරින් අප පවත්වාගන්නා අතර වගාකරන ප්‍රජාවන්ගේ නිවාස හා සනීපාරක්ෂක පහසුකම් සහ සහ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ඔවුන්ගේ ඉඩම් බලපත්‍ර උකස මත ණය යෝජනා ක්‍රමයක් දියත් කිරීම සඳහා අප දැන් සූදානම්ය. ඉඩම් සඳහා ඔප්පු නොමැති කම හේතුවෙන් උකස් කිරීමට අපොහොසත් වීම නිසා මෙම ප්‍රජාව වාණිජ බැංකු විසින් සාම්ප්‍රදායිකව නොසලකා හරින ලදී. ග්‍රාමීය ප්‍රජාවන්ට සූර්ය්‍ය බලශක්ති පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පළමුව ඉල්ලා සිටියේද HDFC බැංකුවයි. නිවාස තත්ත්වයන් උසස් කිරීමට මූල්‍ය පහසුකම් සැපයීම සමඟ විදුලි බලශක්තිය ලබාදීම, ඉතා දුෂ්කර ග්‍රාමීය පරිසරවල ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය සැලකිය යුතු අන්දමින් ඉහළ දැමීමට මූලික රුකුලක් වන බව අප විශ්වාස කරන්නෙමු. 2017 වර්ෂයේදී ග්‍රාමීය ප්‍රදේශ වලට සූර්ය්‍ය බලශක්තිය ලබාදීමට HDFC බැංකුවට හැකියාව ලැබෙන බව මා විශ්වාස කරමි.

මධ්‍ය ආදායම් පංතිය ශක්තිමත් කිරීම සඳහා වූ රජයේ අරමුණට උපකාර කරන අතරතුර අපගේ හර ව්‍යාපාරයද අප පැහැර හැර නැත. ශ්‍රී ලංකාවේ වාර්ෂික නිවාස අවශ්‍යතාව නව නිවාස 50,000 බව 2015 මහ බැංකු වාර්තාවේ සඳහන් කොට ඇත. 2016 වර්ෂයේදී නිවාස කර්මාන්තය සඳහා පමණක් HDFC බැංකුවේ ආර්ථික දායකත්වය රු. බිලියන 11.8 කි. 2016 වර්ෂය තුළදී නව නිවාස ඒකක සඳහා රු. බිලියන 8 ක් වටිනා ණය නිදහස් කර ඇති අතර එය රටෙහි සමස්ථ අවශ්‍යතාවයෙන් 29% කි. තවද රු. බිලියන 3.8 ක් පවතින නිවාස නවීකරණය කිරීම සඳහා ලබාදී ඇත. 2015 වර්ෂයේදී දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින පුද්ගල සංඛ්‍යාවේ සාමාන්‍ය අඩුවීම සඳහා බැංකුව 2.39% කින් දායක වී ඇති බව එම වාර්තාවේ පෙන්නුම් කර ඇත. එම නිසා නිවාස ක්ෂේත්‍රයේ විශාලම විශේෂඥ ණය සපයන්නා HDFC බැංකුව වන බවට විශ්වාසයෙන් ප්‍රකාශ කළ හැක.



ශ්‍රී ලංකාවේ වාර්ෂික නිවාස අවශ්‍යතාව නව නිවාස 50,000 බව 2015 මහ බැංකු වාර්තාවේ සඳහන් කොට ඇත. 2016 වර්ෂයේදී නිවාස කර්මාන්තය සඳහා පමණක් HDFC බැංකුවේ ආර්ථික දායකත්වය රු. බිලියන 11.8 කි. 2016 වර්ෂය තුළදී නව නිවාස ඒකක සඳහා රු. බිලියන 8 ක් වටිනා ණය නිදහස් කර ඇති අතර එය රටෙහි සමස්ථ අවශ්‍යතාවයෙන් 29% කි. තවද රු. බිලියන 3.8 ක් පවතින නිවාස නවීකරණය කිරීම සඳහා ලබාදී ඇත. 2015 වර්ෂයේදී දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින පුද්ගල සංඛ්‍යාවේ සාමාන්‍ය අඩුවීම සඳහා බැංකුව 2.39% කින් දායක වී ඇති බව එම වාර්තාවේ පෙන්නුම් කර ඇත. එම නිසා නිවාස ක්ෂේත්‍රයේ විශාලම විශේෂඥ ණය සපයන්නා HDFC බැංකුව වන බවට විශ්වාසයෙන් ප්‍රකාශ කළ හැක.

අපගේ කොටස්හිමියන්ගේ මූල්‍ය අපේක්ෂාවන් ඉෂ්ඨ කිරීමේදී අප තරමක පහළ යෑමක් වාර්තා කර ඇති බව මා ප්‍රකාශ කළ යුතුය. අපගේ මූලික ඉලක්කය වනුයේ මෙම අකාර්යක්ෂමතාවයට පිළියම් සෙවීම වන අතර මේ සම්බන්ධයෙන් දැනටමත් ක්‍රියාකර ඇති බවට කොටස්හිමියන්ට මා සහතික වෙමි. සංවිධාන ව්‍යුහයේ වෙනස් වීමක් සමඟ බැංකුවේ සියළුම ක්‍රියාකාරී අංශ නවීකරණය කිරීම අපගේ නව හර බැංකුකරණ පද්ධතිය මගින් දැනටමත් වේගවත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට තොරතුරු තාක්ෂණ සහ අලෙවිකරන විශේෂඥයින් පත්කිරීම මගින් අපගේ නායකත්ව හැකියාවන් වර්ධනය කර ඇති අතර භාණ්ඩාගාර කළමනාකරණ, ණය සංවර්ධනය හා මානව සම්පත් සඳහා උපදේශකයන්ද බඳවාගෙන ඇත. අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළට සභාධිපත්‍ය නිවාස ක්ෂේත්‍රයේ නියෝජනයක් සහ නව්‍ය අලෙවිකරන ප්‍රතිපත්ති අවශ්‍ය බවට මා හඳුනාගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා සේවක මණ්ඩලයේ සහයෝගය ඇතිව අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට බලාපොරොත්තු වේ. වඩාත් කාර්යක්ෂම හා වෘත්තීය මට්ටමේ සේවා සැපයීම හරහා පාරිභෝගික වටිනාකම් නිර්මාණය වර්ධනය කිරීම සඳහා නායකත්ව හැකියාවන් වෙනුවෙන් අප මෙතෙක් සිදුකළ ආයෝජනයන් දැනටමත් දායක වී ඇති මාගේ විශ්වාසයයි

බැංකුවේ විවිධාංගිකරණ උපායමාර්ගය නිසා අපගේ පාරිභෝගික පදනමද විවිධාංගිකරණය වී ඇත. අපගේ සාම්ප්‍රදායික ග්‍රාමීය හා අඩු පහසුකම් ලත් ප්‍රජාවට අමතරව වෘත්තිකයින්, සමාගම් සහ මධ්‍ය හා ඉහළ ආදායම් ලබන අංශ යන නව පාරිභෝගිකයින් හට බැංකුව සේවා සපයනු ලැබේ. මෙම අවශ්‍යතාව දැඩි කොට ඇත්තේ HDFC බැංකුවේ සේවකයින්ගේ සීඝ්‍ර වෘත්තීය සංවර්ධනයයි. සමහර අවස්ථාවන්හි සේවකයින් මෙම පුළුල් වෙනස්වීම් පිළිබඳ විශ්වාසයක් නොමැතිව බැලුවද වෘත්තීයභාවයේ හා පුද්ගල සංවර්ධනයේ ප්‍රතිලාභ පිළිබඳව සේවකයින් අවබෝධ කරගනු ඇතැයි මා විශ්වාස කරමි.

# සභාපතිතුමන්ගේ පණිවුඩය

අපගේ නව වර්ධන ගමන්මගෙහි පැවැත්ම පිළිබඳ මා තුල දැඩි විශ්වාසයක් ඇත.

## නියාමන අවශ්‍යතා

සියළුම බලපත්‍රලාභී විශේෂිත බැංකු රු.බිලියන 05 ක මට්ටට් 01 හි අවම ප්‍රාග්ධනයක් පවත්වාගත යුතු යැයි ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇත. HDFC බැංකුවට එම මට්ටමට ළඟාවීමට 2018 වර්ෂයේ ජනවාරි මාසය තෙක් කාලය ලබාදී ඇත. අපගේ ප්‍රාග්ධන වර්ධන සැලැස්මට අනුව ඉලක්ක කළ මට්ටමට වඩා තරමක අඩු මට්ටමක් 2016 වර්ෂය අවසාන වන විට අප වාර්තා කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොටස්හිමියන් හා රජය සමඟ මෙම තත්ත්වයට මුහුණ දෙන්නේ කෙසේද යන්න පිළිබඳ සාකච්ඡා කිරීම දැනටමත් ආරම්භ කර ඇත. 2017 වර්ෂය තුළදී මේ සම්බන්ධයෙන් හිතකර තීරණයකට එළඹෙනු ඇතැයි මා තුළ විශ්වාසයක් ඇත.

BASEL 111 නීති වල අවශ්‍යතාවයන් අනුව හිමිකාරිත්වය විවෘත කිරීම පිළිබඳ රජය අවධානය යොමු කරන අතරතුර බැංකු නියාමනය ශක්තිමත් කිරීම පිළිබඳවද අවධානය යොමු කරනු ඇත. බැංකුවට ඇති ප්‍රධානම අභියෝගය වනුයේ බැංකුවේ ප්‍රාග්ධනීකරණයට සාපේක්ෂව ණය වර්ධනය ලඟා කරගැනීමයි.

HDFC බැංකුවේ අනුකූලතා මට්ටම පිළිබඳ අමතර තොරතුරු සඳහා යහපාලන සහ අභ්‍යන්තර පාලන පරිච්ඡේදය පරිශීලනය කරන්න.

බැංකුව වෙනුවෙන් අඛණ්ඩව ලබාදෙන සහයෝගය සඳහා විශේෂයෙන්ම කොටස්හිමියන්ට සහ සියළුම පාර්ශවකරුවන්ට ස්තුති කරමින් මෙය අවසාන කිරීමට කැමැත්තෙමි. පසුබැසීම් පැවතියද ශ්‍රී ලංකාවේ නිවාස මූල්‍ය විශේෂඥයා ලෙස HDFC බැංකුවට විශිෂ්ඨ අනාගතයක් ඇති බවට මා තුළ දැඩි විශ්වාසයක් ඇත. වේගය අඩු වුවද වඩා ශක්තිමත් හා වඩා වටිනා ජාතික වත්කමක් ගොඩනැගීමට අපට හැකි වන බවට මා විශ්වාස කරමි.



**ආර්. ජේ සිල්වා**
සභාපති

2017 මැයි 24 වන දින
කොළඹදී

# සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරිතුමන්ගේ සමාලෝචනය



නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC බැංකුව) තුළ සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි ලෙස මාගේ පළමු වසර අවසාන කරමින් කොටස්හිමියන්ට මාගේ කාර්යඵල සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම සතුටකි.

දිගු කාලයක් තිස්සේ බලා සිටි රු. මිලියන 193 පමණ පිරිවැයක් දරා ඇති අපගේ හර බැංකුකරණ පද්ධතිය ප්‍රවර්ථන මූල්‍ය වර්ෂය තුළදී දියත් කරන ලදී. මෙම නවීන තොරතුරු තාක්‍ෂණ පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන විට පෙර පැවති පද්ධති සහ එකිනෙකට වෙනස් තොරතුරු පද්ධති වෙනුවට ප්‍රධාන කාර්යාලය සහ සියළුම ශාඛා අතර තත්කාලීනව කාර්‍ෂම සන්නිවේදනය කළ හැකි සහ උපායමාර්ගික සැලසුම්කරණයට උපකාරිවන සම්පූර්ණයෙන් ඒකාබද්ධ තොරතුරු තාක්‍ෂණ පද්ධතියක් ප්‍රතිස්ථාපන වනු ඇත. අප මේ වන විට මෙම තොරතුරු පද්ධතිය භාවිතා කරන ආකාරය පිළිබඳ අපගේ සේවක මණ්ඩලයට පුහුණුවක් ලබාදෙන අතර විවිධ උපාංග ස්ථාපිත කිරීම සහ පරීක්‍ෂා කිරීම ආරම්භ කර ඇත. ශාඛා කාර්යඵලයන් වඩාත් හොඳින් නිරීක්‍ෂණය කිරීමට පහසු සහ උපායමාර්ගික අරමුණු ලඟාකරගැනීමට උපකාරීවන ප්‍රාදේශිය ව්‍යුහයක්ද අප හඳුනාගෙන ඇත. මෙම සියළුම වෙනස්කම් වල ප්‍රතිලාභ 2017 වර්ෂයේ සිට ඉදිරියට HDFC බැංකුවට භුක්ති විදීමට හැකි වන බවට මා විශ්වාස කරමි.

### මෙහෙයුම් පරිසරය සහ HDFC බැංකුව මත බලපෑම

2007 හා 2008 වර්ෂ වල වූ මූල්‍ය අවපාත තත්ත්වය නිසා ඇතිවූ අහිතකර වෙළෙඳපොළ තත්ත්වයකට හා ඉහළ යන පොළී අනුපාත තත්ත්වයන්ට 2016 දී රට මුහුණ දෙන ලදී. මෙම තත්ත්වය නිසා පාරිභෝගිකයින් හොඳම විකල්පය සොයා යෑමත් සමඟ මූල්‍ය ක්ෂේත්‍රය තුළ මූල්‍ය ආයතන අතර ඉහළ පිරිවැය තරඟකාරිත්වයක් ඇතිවිය. ණය සඳහා වූ ඉල්ලුම අඛණ්ඩව යථා තත්ත්වයට පත්වන අතරතුර ශුද්ධ පොළී ආන්තික අඩු වෙමින් ලාභදායිත්වයන්ට අහිතකර ලෙස බලපෑම් කල අතර මූල්‍ය ආයතන වලට වඩාත් පිරිවැය ඵලදායී වීමට හා ලාභ වර්ධනය පවත්වා ගැනීමට ණය ධාරිතාවන් වැඩි කිරීමට සිදුවිය.

# සාමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරිතුමන්ගේ සමාලෝචනය

මෙම පසුබිම යටතේ රාජ්‍ය අයිතිය ඇති විශේෂිත බැංකුවක් ලෙස HDFC බැංකුවට විශේෂ අභියෝග වලට මුහුණ දීමට සිදුවිය. පළමුව, මෙම පසුබිම තුළ ඉහළ යන අරමුදල් පිරිවැය හා ඉහළ පරිපාලන හා පුද්ගල වියදම් හේතුවෙන් පිරිවැය ව්‍යුහය අවම කිරීම අපහසු කාර්‍යයක් විය. රාජ්‍ය බැංකුවක් වශයෙන් සහනදායී කොන්දේසි මත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වැනි පහසුකම් නොලත් අංශ සඳහා මූල්‍ය පහසුකම් සැපයීම මඟින් රජයේ ප්‍රතිපත්ති වලට සහයෝගය ලබාදිය යුතු නිසා ආන්තික ඉහළ දැමීම අපහසු වීම දෙවන අභියෝගයයි. අවදානම ඉහළ ප්‍රජාවන්ට සේවා සපයන මෙම මෙහෙයුම් ආකෘතිය තුල ඉහළ අක්‍රීය ණය අනුපාතයක් ද වාර්තාවන අතර සුළු ප්‍රමාණයේ ගණුදෙනු විශාල ප්‍රමාණයක් ඇති වීම තුළ සාපේක්ෂව ගණුදෙනුවක් සඳහා ඉහළ පරිපාලන පිරිවැයක්ද දැරීමට සිදුවිය.

මූල්‍යමය වශයෙන් තිරසාර ව්‍යාපාර ආකෘතියක් සංවර්ධනය කිරීමේදී, බැංකුවේ සාම්ප්‍රදායික නිවාස මූල්‍ය උපකරණ වලට අමතරව පුළුල් පරාසයක මූල්‍ය උපකරණ ඉදිරිපත් කිරීම මඟින් 2012 වර්ෂයේ සිට HDFC බැංකුව සිය නිෂ්පාදිත කළඹ විවිධාංගීකරණය කරන ලදී. එසේම බැංකුව ඉහළ පෙළේ පාරිභෝගික කොටස් ඉලක්ක කිරීමටද පෙළඹිණි. නිවාස නොවන මූල්‍ය උපකරණ වල හා නව පාරිභෝගික අංශ වල සුළු වර්ධනීය තත්ත්වයන් සමඟ විවිධාංගීකරණ උපාය මාර්ගයේ යම් ප්‍රගතියක් 2016 වර්ෂය තුළදී දක්නට ලැබිණි. කෙසේ වෙතත් නිෂ්පාදිත වල හා පාරිභෝගික මිශ්‍රණය තුළ හරිත අගයට සැලකිය යුතු වෙනසක් සිදුවී නැත.

එම නිසා 2016 වර්ෂයේ සමස්ථ ණය ලබාදීම් වලින් 85 % ක බහුතර කොටසක් අඛණ්ඩව දිගුකාලීන නිවාස මූල්‍යයන අංශය වාර්තා කළ අතර 15% ක් නිවාස නොවන මූල්‍ය අංශය වාර්තා කරන ලදී. බැංකුවේ අරමුදල් මූලාශ්‍ර ද විශාල වශයෙන් වෙනස් නොවුන අතර සමස්ථ අරමුදල් වලින් 85% ක් කෙටිකාලීන ආයතනික තැන්පතුද 15% ක් ඉතුරුම් තැන්පතුද නියෝජනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස වත්කම් හා වගකීම් වල පරිණතාභාවයේ නොගැලපීම් නම් වූ සාම්ප්‍රදායික ගැටළුවට HDFC බැංකුවට තවදුරටත් මුහුණ දීමට සිදුවිය.

2016 වර්ෂයේදී බැංකුවේ ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය වූයේ තැන්පතුය. සමස්ථ තැන්පතු පදනම 2015 දී පැවති රු.බිලියන 28 සිට රු.බිලියන 32 දක්වා ඉහළ යන ලදී. සමස්ථ ණය ලබාදීම් රු. බිලියන 26 සිට රු.බිලියන 30 දක්වා වර්ධනය වී ඇත. කෙසේ වෙතත් සාමාන්‍ය ණය ලබාදිමේ අනුපාතය 15.80% සිට 14.91% දක්වා පහළ යන අතරතුර 2015 වර්ෂයේදී 11.34% ක් වූ අරමුදල් පිරිවැය 2016 වර්ෂයේදී 12.48% ක් දක්වා ඉහළ ගොස් ඇත්තේ ජාතික සේවාවක් ලෙස බැංකුව හරහා ලබාදෙන සංවර්ධන හා ප්‍රතිමූල්‍ය ණය මත බැංකුව ඉතා අඩු ආන්තික රඳවා ගන්නා හෙයිනි. එහි ප්‍රතිඵලයක් ලෙස එක් වසරක් තුල බැංකුවේ පොළී ආන්තික 2.03% සිට 0.90% දක්වා පහළ ගොස් ලාභදායිත්වයට අහිතකර ලෙස බලපාන ලදී.

2016 වර්ෂය තුළදී නව ශාඛා විවෘත කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අනුමැතිය ලබා නොදුන් නිසා HDFC බැංකුවට ශාඛා පුළුල් කිරීමේ බාධා පැවති අතර වෙනත් යෝග්‍ය මූල්‍ය ආයතනයක් සමඟ HDFC බැංකුව ඒකාබද්ධ කිරීම සඳහා වූ රජයේ යෝජනාව තවමත් ක්‍රියාත්මක වී නැත.

## මූල්‍ය කාර්යසාධනය

ඉහත අභියෝග පැවතියද 2015 වර්ෂයේදී රු.බිලියන 41 වූ HDFC බැංකුවේ වත්කම් පදනම ණය ලබාදීම් වල වර්ධනය නිසා 2016 වර්ෂයේදී රු.බිලියන 46 දක්වා ඉහළ ගොස් ඇති බව සතුටින් දන්වා සිටිමි. 2016 වර්ෂයේදී ණය පොතට එකතු වූ රු.බිලියන 04 න් 27% ක් සේවක අර්ථ සාධක අරමුදල් ශේෂය මත ලබාදෙන නිවාස ණය වූ අතර 3% ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සහ නම්කළ සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිමූල්‍ය යෝජනාක්‍රම හරහා සහනදායී ණය වශයෙන් 5% ක්ද ලබා දෙන ලදී. පරිමාව වශයෙන් ගත්කළ 2016 වර්ෂයේදී HDFC බැංකුවේ ණය පොත වර්ධයෙන් 15% ක් නව ණය ලබාදීම් විය. එමෙන්ම ණය වලින් 57% ක් බස්නාහිර පලාතෙන් පිටතට බෙදාහරින ලද අතර 43% ක් බස්නාහිර පලාත තුළ බෙදාහැර ඇත.

බැංකුවේ ශුද්ධ අක්‍රීය ණය අනුපාතය (සේවක අර්ථ සාධක අරමුදල් ශේෂය මත ලබාදෙන නිවාස ණය හැර) 2015 වර්ෂයේදී පැවති 5.56% සාපේක්ෂව 4.7% ක සාමාන්‍යයක් ගෙන ඇත. මෙය 2016 වර්ෂය සඳහා කර්මාන්ත සාමාන්‍ය වූ 3.2% (දළ) කට වඩා වැඩි අගයක් වූ අතර එසේ වීමට මූලික හේතුව වූයේ පෞද්ගලික වාණිජ බැංකු වලට වඩා HDFC බැංකුවේ ණය කළඹ තුළ අඩු හා මධ්‍ය ආදායම් ලබන ප්‍රජාවෙන් වැඩි කොටසක් නියෝජනය කිරීමයි. අපගේ අක්‍රීය ණය අනුපාතය ඉහළ ප්‍රදේශ වන්නේ අප ප්‍රාථමික මූල්‍ය සේවා සම්පාදකයා වන සහ සාම්ප්‍රදායිකව වාණිජ බැංකුවල පහසුකම් නොලබන වතු ප්‍රජාව ජීවත් වන නුවරඑළිය හා බදුල්ල වැනි ප්‍රදේශයි.

බැංකුවේ මුළු මෙහෙයුම් ආදායම රු.බිලියන 4.9 සිට රු.බිලියන 5.9 දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත් අරමුදල් පිරිවැය ඉහළ යෑම සහ නව සාමූහික ගිවිසුම මත වූ ඉහළ වැටුප් හේතුවෙන් මෙහෙයුම් වියදම් රු.මිලියන 1,287 සිට රු.මිලියන 1,412 දක්වා ඉහළ ගොස් ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස, 2015 වර්ෂයේදී රු.මිලියන 992 ක් වූ බැංකුවේ මෙහෙයුම් ලාභය රු.මිලියන 825 දක්වා පහළ වැටී ඇත. බදු පසු ලාභයද රු.මිලියන 492 සිට රු.මිලියන 397 දක්වා පහත වැටී ඇත.

**සේවක ඵලදායීතාවය**

වසර 03 නව සාමූහික ගිවිසුම හරහා වැටුප් හා ප්‍රතිලාභ සංශෝධනය වීම නිසා වර්ෂය තුළදී සේවක පිරිවැය රු.මිලියන 896 දක්වා 8.21% ඉහළ ගොස් ඇත. බැංකුව වාර්ෂිකව සේවක ඵලදායීතා තක්සේරුවක් සිදු නොකරන අතර නව තොරතුරු තාක්‍ෂණ පද්ධතිය මඟින් සේවක ඵලදායිතාව සැලකිය යුතු අන්දමින් ඉහළ යනු ඇතැයි මා විශ්වාස කරනු ලැබේ. එමෙන්ම 2017 ශාඛා පුළුල් කිරීම සඳහා නව බඳවා ගැනීම් අවශ්‍ය නොවනු ඇත. වෙළෙඳපොල අනුපාත අඛණ්ඩව ඉහළ යන සහ මිලකරණය වඩාත් තරඟකාරී වන පසුබිමක ඉදිරි වර්ෂ කිහිපය තුළ බැංකුවට වඩා තරඟකාරී වීමට නම් සේවක ඵලදායීතාවය උසස් කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වනු ඇත.

**නව මූල්‍ය වර්ෂය සඳහා සැලසුම්**

නව මූල්‍ය වර්ෂය තුළ HDFC බැංකුවේ මූලික ඉලක්කය වනුයේ පිරිවැය සීමා කිරීම සහ ආදායම් උසස් කිරීමයි. අරමුදල් පිරිවැය අඩු කිරීම සඳහා ස්ථාවර තැන්පතු වලට ඉතුරුම් වල කොටස ඉහළ දැමීම සඳහා ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධනය සඳහා අප අවධානය යොමු කර ඇත. ඉතුරුම් ව්‍යාපාරයක් දියත් කිරීම සඳහා 2017 වර්ෂය "ඉතුරුම් වර්ෂය" ලෙස දැනටමත් අප නම් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියට යටත්ව දැනට පවතින ශාඛා 38 ට තවත් ශාඛා 10 ක් එකතු කරමින් අපගේ ණය කළඹ වර්ධනය කරගැනීමටද අප අවධානය යොමු කර ඇත. නව තොරතුරු තාක්‍ෂණ පද්ධතිය හරහා ශාඛා වල සහ සේවකයින්ගේ කාර්යඵල නිරීක්‍ෂණයද උසස් වනු ඇත.

මහ බැංකුවේ මාර්ගෝපදේශකත්වය යටතේ ආදායම් ඉහළ දැමීම සඳහා ගාස්තු සහ අයකිරීම් වැනි වෙනත් ආදායම් මූලාශ්‍ර ගවේෂණයද සිදුකරනු ඇත. රජය සැලසුම් කරමින් සිටින නව නිවාස ඒකක 500,000 ගොඩනැඟීම සඳහා වූ මහා පරිමාණ නිවාස ව්‍යාපෘතියේදී නිවාස සංවර්ධන අධිකාරිය සමඟ HDFC බැංකුව අත්වැල් ගැනීමය නියමිත නිසා 2017 වර්ෂයේදී HDFC බැංකුවේ ආදායම ඉහළ යන බවට මා තුළ දැඩි විශ්වාසයක් ඇත.

ඉහත අභියෝග පැවතියද 2015 වර්ෂයේදී රු.බිලියන 41 වූ ඍජු බැංකුවේ වත්කම් පදනම ණය ලබාදීම් වල වර්ධනය නිසා 2016 වර්ෂයේදී රු.බිලියන 46 දක්වා ඉහළ ගොස් ඇති බව සතුටින් දන්වා සිටිමි. 2016 වර්ෂයේදී ණය පොතට එකතු වූ රු.බිලියන 04 න් 27% ක් සේවක අර්ථ සාධක අරමුදල් ශේෂය මත ලබාදෙන නිවාස ණය වූ අතර 3% ක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සහ නම්කළ සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිමූල්‍ය යෝජනාක්‍රම හරහා සහනදායී ණය වශයෙන් 5% ක්ද ලබා දෙන ලදී. පරිමාව වශයෙන් ගත්කළ 2016 වර්ෂයේදී HDFC බැංකුවේ ණය පොත වර්ධයෙන් 15% ක් නව ණය ලබාදීම් විය. එමෙන්ම ණය වලින් 57% ක් බස්නාහිර පලාතෙන් පිටතට බෙදාහරින ලද අතර 43% ක් බස්නාහිර පලාත තුළ බෙදාහැර ඇත.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාටද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා සහ බැංකු සුපරීක්‍ෂණ දෙපාර්තමේන්තුවටද වර්ෂය තුල ලබාදුන් සහයෝගය සඳහා මාගේ ස්තුතිය පුද කරන අතර ලබාදුන් දායකත්වය වෙනුවෙන් HDFC සේවක මණ්ඩලයට සහ කළමනාකරණයටත් අප හට පක්‍ෂපාතී සියළුම පාරිභෝගිකයින්ටත් මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.



උපාලි හෙට්ටිආරච්චි
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරි

2017 මැයි 24 වන දින
කොළඹදී

# මූල්‍ය සමාලෝචනය 2016

2016 වර්ෂය HDFC බැංකුවට තීරණාත්මක වර්ෂයක් විය. 2015 වර්ෂයට සාපේක්ෂව බදු පෙර ලාභය 12% කින් පහත වැටී ඇත. වර්ෂය පුරා පැවති අහිතකර වෙළෙඳපොළ තත්ත්වයන් මත වූ ඉහළ පොළී පසුබිමෙහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රතිඵල පහත වැටී ඇත. HDFC බැංකුව මූලික වශයෙන් අඩු හා මධ්‍ය ආදායම් පාරිභෝගික කාණ්ඩයකට සේවා සපයන නිවාස බැංකුවක් වීම නිසා ඉහළ යන මූල්‍ය පිරිවැයන් පාරිභෝගිකයින් වෙත යොමු කිරීමේ සීමාකාරී තත්ත්වයක් ඇත.

**මෙහෙයුම් ප්‍රකාශනය**

| | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| පොළී ආදායම | 3,528 | 4,378 | 4,660 | 5,472 |
| පොළී වියදම | (2,469) | (2,535) | (2,539) | (3,509) |
| ශුද්ධ පොළී ආදායම | 1,059 | 1,843 | 2,121 | 1,963 |
| වෙනත් ආදායම් | 275 | 188 | 249 | 456 |
| මෙහෙයුම් ආදායම | 1,334 | 2,031 | 2,370 | 2,419 |
| මෙහෙයුම් වියදම් | 938 | 1,123 | 1,319 | 1,408 |
| හානිකරණ අලාභ | 87 | 131 | 89 | 160 |
| බදු පෙර ලාභය | 309 | 777 | 1,009 | 848 |

එකතු කළ අගය මත බදු හා සමාගම් බදු වල පෙර ලාභය




### පොළී සහ පොළී නොවන ආදායම්

වර්ෂය තුළදී පොළී ආදායම පසුගිය මූල්‍ය වර්ෂයේදී පැවති රු. බිලියන 4.7 සිට රු.බිලියන 5.4 දක්වා 17% කින් වර්ධනය වී ඇත. වර්ෂය තුලදී ඇතිවූ ණය පොතෙහි වර්ධනය සහ ඉහළ පොළී ආදායම් ණය ලබාදීම් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. ඉහළ යන පොළී යන පරිසරයක පවතින ණය කළඹ නැවත මිලකරණයේ සීමාකාරී තත්ත්වයන් සමඟ නව ණය ලබාදීම් ගැලපෙන පොළී පරතරයක මිලකරණය කරන ලදී.

වර්ෂය තුළදී මූල්‍ය ආයෝජනද පොළී ආදායමට ඉහළ මට්ටමකින් දායකත්වයක් සපයන ලදී. මුළු පොළී ආදායමට ආයෝජන සඳහා ලද පොළී ආදායමේ දායකත්වය 2015 වර්ෂයේ 16% ක් වූ අතර එය 2016 වර්ෂයේදී 24% ක් වී ඇත. 2016 වර්ෂයේ ලාභදායීත්වයේ වර්ධනයට විශාල වශයෙන් දායක වී ඇත්තේ වෙනත් ආදායම් වල ඉහළ යාමයි. ආයෝජන දේපළ වල ප්‍රත්‍යාගණන අතිරික්තය හැරුණු විට පොළී නොවන ආදායමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත්තේ ණය ප්‍රලේඛන, නීති ගාස්තු, තක්සේරු ගාස්තු, වාර්ෂික සමාලෝචන ගාස්තු ආදියෙන් ලද ආදායම්ය. අභියෝගාත්මක පොළී අනුපාත පසුබිමක් තුළ පොළී නොවන ආදායම් කෙරෙහි බැංකුවේ ඉහළ අවධානය සහතික කරමින් ගාස්තු පදනම් ආදායම් ඉහළ දැමීම සඳහා පාරිභෝගිකයින් සඳහා වෙනත් සේවා බැංකුව විසින් හඳුන්වා දෙන ලදී.

පොළී ආදායම්




### පොළී වියදම

පොළි ආදායම් 17% ක වර්ධනයක් පෙන්නුම් කලද තැන්පතු පරිණත වීම් සඳහා සැලකිය යුතු ඉහළ ප්‍රති මිලකරණයක් සිදු කිරීම හේතුවෙන් පොළී වියදම තුළ ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. මේ තුළින් ශුද්ධ පොළි ආදායම කෙරෙහි දැඩි පීඩනයක් ඇති කළ අතර එය ලාභදායීත්වය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී. 2016 දෙසැම්බර් 31 වන දිනට ස්ථාවර තැන්පතු කළඹ තුළ මාස 03 සිට 06 දක්වා වූ කාලසීමාවන්හි තැන්පතු වල ඉහළ නියෝජනයක් වාර්තා කරන ලදී.

පොළී වියදම




### මෙහෙයුම් වියදම් සහ ණය අලාභ වෙන්කිරීම්

මෙහෙයුම් වියදම් වර්ෂයෙන් වර්ෂය රු. මිලියන 1,287 සිට රු.මිලියන 1,409 දක්වා 9% කින් ඉහළ ගොස් ඇත. පසුගිය වර්ෂයේ මෙහෙයුම් වියදම් ඉහළ යාමට බලපෑ ප්‍රධාන සාධක වූයේ සේවක උසස් වීම් සහ ව්‍යාපාර සංවර්ධන හා අලෙවිකරණ කටයුතු වල ඉහළ යාමයි. 2015 වර්ෂයේදී රු. මිලියන 89 ක් වූ ණය සඳහා හානිකරණයන් සහ වෙනත් අලාභ ප්‍රවර්තන වර්ෂයේදී රු.මිලියන 160 ක් විය. එයට මාස 18 ට වැඩි සේ.අ.අ ශේෂය මත වූ අක්‍රිය ණය වෙනුවෙන් සිදුකළ සාමූහික හානිකරණ රු මිලියන 77.45 ද ඇතුලත් වේ. මුළු සාමූහික හානිකරණය රු.මිලියන 169.47 ක් වූ අතර ශක්තිමත් විනිශ්චයක් මත පාරිභෝගිකයින් කිහිප දෙනෙකු වෙනුවෙන් සිදුකළ රු. මිලියන 9.1 ක කේවල හානිකරණය මත ලාභයක් ඇත.

### වත්කම් වර්ධනය

සමාලෝචනයට ලක්වන මූල්‍ය වර්ෂය අවසානයේදී HDFC බැංකුවේ මුළු වත්කම් රු.බිලියන 45.6 වූ අතර 2015 වර්ෂය අවසානයේදී එය රු.බිලියන 41.9 කි. ප්‍රධාන ව්‍යාපාර කටයුත්ත වූ ණය හා අත්තිකාරම් සහ ලැබිය යුතු අගයන් වල 13% ක වර්ධනයක සහයෝගයෙන් HDFC බැංකුවේ මුළු වත්කම් වර්ෂයෙන් වර්ෂය 8.8% කින් වර්ධනය වී ඇත. ද්‍රවශීල වත්කම් හා වෙනත් මූල්‍ය ආයෝජන 0.8% ක පමණ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

**වත්කම් හා වගකීම්**

| | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| ණය සහ අත්තිකාරම් | 19,701 | 23,357 | 26,685 | 30,259 |
| ද්‍රවශීල වත්කම් හා ආයෝජන | 6,601 | 9,847 | 14,474 | 14,492 |
| දේපළ පිරියත හා උපකරණ | 290 | 296 | 435 | 443 |
| වෙනත් වත්කම් | 975 | 918 | 319 | 415 |
| **මුළු වත්කම්** | **27,567** | **34,418** | **41,913** | **45,608** |
| | | | | |
| පාරිභෝගික තැන්පතු | 18902 | 24479 | 28592 | 32,122 |
| ණය ගැනීම් | 5257 | 6213 | 9037 | 8,862 |
| වෙනත් වගකීම් | 834 | 840 | 920 | 896 |
| කොටස් හිමියන්ගේ අරමුදල් | 2574 | 2886 | 3364 | 3,728 |
| **මුළු වගකීම්** | **27567** | **34418** | **41913** | **45,608** |

මුළු වත්කම් වර්ධනය




### ණය සහ අත්තිකාරම්

2015 වර්ෂයේ රු. බිලියන 26.684 ට සාපේක්ෂව 2016 රු. බිලියන 30.25 ක් වාර්තා කරමින් අපගේ ණය පොත් වර්ධනය වී ඇත. 2016 දෙසැම්බර් 31 දිනට ණය පොතෙන් 85% ක් වාර්තා කළ ප්‍රධාන ව්‍යාපාරය නිවාස මූල්‍යයනය මඟින් අපගේ ණය කළඹ ප්‍රධාන වශයෙන් හසුරවන ලදී. කල්බදු, ක්ෂුද්‍ර මූල්‍ය ණය හා ව්‍යාපාර ණය ද ණය කළඹෙහි වර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. විවිධ සමාන දේපළ මත සුරක්ෂිත වෙමින් දිවයිනම ආවරණය වන පරිදි ණය පොත සකස් වී ඇත.

# මූල්‍ය සමාලෝචනය 2016

මුළු වත්කම් වර්ධනය




## ආයෝජන කළඹ

වෙනත් උපාය මාර්ගික ආයෝජන මඟින් කාර්යසාධනයට තවදුරටත් උපකාරි වන ලදී. අනිවාර්ය ද්‍රවශීල වත්කම් කලඹ හරුණු විට ලැයිස්තුගත සාංගමික ණයකර, රාජ්‍ය බැඳුම්කර හා වාණිජ පත්‍රිකා ආදියෙහි ආයෝජනය කරමින් එහි කළඹ විවිධාංගීකරණය කිරීම සඳහා බැංකුව උපායමාර්ගික තීරණ ගෙන ගන්නා ලදී.

ආයෝජන කළඹ (රු.බිලියන)

| | 2016 | 2015 |
|---|---|---|
| රජයේ සුරකුම්පත් | 831.54 | 55.68 |
| අලෙවිය සඳහා පවතින මූල්‍ය වත්කම් | 2,053.27 | 2,043.35 |
| පරිණත වීම තෙක් රඳවා ගන්නා මූල්‍ය වත්කම් | 10,737.17 | 11,588.34 |
| ආයෝජන දේපළ | 870.55 | 786.35 |
| | **14,492.53** | **14,473.72** |

HDFC බැංකුවට එහි දිගුකාලීන ණය දීම් හා කෙටිකාලීන වගකීම් අතර නොගැලපීම නිසා නිර්මාණය වූ ඓතිහාසිකව බාධකයක් පවතී. මෙම අවශ්‍යතාවය වටහා ගනිමින් වත්කම් හා වගකීම් වල පරිණතභාවයේ පරතරය කළමනාකරණය කිරීම සඳහා කෙටි කාලීනව වත්කම් ඉහළ දැමීම සඳහා අප වර්ෂය තුළදී විචක්ෂණ කෙටිකාලීන ආයෝජන වේගවත් කරන ලදී. මෙතෙක් උපචිත වී ඇති අපගේ කෙටි කාලීන ආයෝජන මත වූ ලාභ වලින් වත්කම් හා වගකීම් වල සෘණාත්මක පරිණතභාවයේ පරතරය කළමනාකරණය කරගැනීමට උපකාරි වී ඇත.

## තැන්පතු රැස්කිරීම

බැංකුව ස්ථාවර තැන්පතු මත ආකර්ෂණය සඳහා දැඩි අවධානයක් පවත්වා ගනිමින් වර්ෂයෙන් වර්ෂය 12.3% වර්ධනයක් නිරූපනය වන පරිදි එහි තැන්පතු පදනම රු.බිලියන 28.59 සිට රු.බිලියන 32.12 දක්වා සාර්ථකව පුළුල් කරගන්නා ලදී. 2015 වර්ෂයේදී මුළු තැන්පතු වලින් 14% ක් නියෝජනය කළ ඉතුරුම් තැන්පතු 2016 වර්ෂයේදී 16% කට වර්ධනය විය. වර්ෂය තුළදී ඉතුරුම් පදනම වර්ෂයෙන් වර්ෂය 24% සාර්ථක වර්ධනයක් වාර්තා කරන ලදී. අරමුදල් රැස්කිරීම සඳහා ඉහළ දායකත්වයක් සපයන HDFC ජංගම බැංකුකරණ මෙහෙයුම් මඟින් අඩු හා මධ්‍ය ආදායම් ලබන කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් නොවැදගත් ප්‍රදේශයන්ගෙන් අඩු පිරිවැය අරමුදල් රැස්කිරීම තුළින් සාර්ථක ප්‍රතිඵල අත්කරගෙන ඇත. පාරිභෝගික තැන්පතු තුළ ඇතුළත් රු.බිලියන 4.2 ක ඉතුරුම් මුළු තැන්පතු වලින් 14% කි. ඉතුරුම් පදනම ඉහළ දැමීම සඳහා බැංකුව තවදුරටත් අඛණ්ඩ උත්සාහයක් ගනු ලැබේ. 2016 වර්ෂයේදී 27% ක වර්ෂයෙන් වර්ෂය ඉතුරුම් වර්ධනයක් වාර්තා කර ඇත.

තැන්පතු වර්ධනය




## ණය ලබාගැනීම් සහ සාංගමික ණයකර

බැංකුව 2013 වර්ෂයේදී සාර්ථක ණයකරයක් නිකුත් කර අතර නැවත වරක් 2015 වර්ෂයේදී රු.බිලියන 4 ක ණයකරයක් නිකුත් කරන ලදී. 2013 නිකුත් කළ 2016 වර්ෂයේදී කල් පිරෙන රු. මිලියන 500 ක ණයකර ගෙවා නිදහස් කරන ලදී.

## ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය

අපගේ පළමු ප්‍රමුඛතාවය අපගේ කොටස්හිමියන්ට වටිනාකම් නිර්මාණය කිරීම වන අතර සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ කොටස්හිමියන්ගේ අරමුදල් 10.4%කින් වර්ධනය වී ඇත. කොටසක වත්කම් අගය 2015 වර්ෂයේදී පැවති රු.51.98 සිට 2016 වර්ෂයේදී රු. 57.68 දක්වා 10% වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් දුර්වල ඉපයීම් තත්ත්වය නිසා කොටසක ඉපයුම රු 7.87 සිට රු.6.10 දක්වා අඩු වී ඇත.

හර ප්‍රාග්ධන අනුපාතය (මට්ටම 01) සහ මුළු ප්‍රාග්ධන අනුපාතය (මට්ටම 02) නියාමන අවශ්‍යතාවය වූ 5% සහ 10% ට සාපේක්ෂව අවම අවශ්‍යතාවන්ට ඉහළින් පිළිවෙලින් 13.11% ක් හා 11.76% ක් වශයෙන් පවත්වාගෙන ඇත. කෙසේ වෙතත් මූල්‍ය ක්ෂේත්‍ර ඒකාබද්ධ කිරීම මත වූ ප්‍රධාන සැලැස්මට අනුකූලව 2014 ජනවාරි මස 17 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ අංක 02/17/402/0073/002 දරන නියෝගයට අනුව 2016 ජනවාරි මස 01 දිනට බැංකුව එහි හර ප්‍රාග්ධන ශේෂය ලෙස රු. මිලියන 5,000 පවත්වාගත යුතුය. කෙසේ වෙතත් බැංකුවේ ඉල්ලීම මත කාල නිර්ණ ක්‍රියාකාරි සැලැස්මක් සමඟ 2015 ජූලි මස 30 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සැපිරීමේ කාලය දීර්ඝ කරන ලදී. ඒ අනුව බැංකුව 2017 ජනවාරි 01 දින වන විට රු.මිලියන 4,000 සහ 2018 ජනවාරි මස 01 දින වන විට රු.මිලියන 5,000 වෙත ළඟා විය යුතුය. 2017 ජනවාරි 01 දිනට රු.මිලියන 4,000 ක අවම හර ප්‍රාග්ධනය වෙත බැංකුවට ළඟා වීමට නොහැකි වීම නිසා 2016/12/21 දිනැති බැංකුවේ ඉල්ලීම මත 2018 ජනවාරි 01 දිනට රු.මිලියන 5,000 සම්පූර්ණ අවශ්‍යතාව සැපිරීමේ කොන්දේසිය මත කාලය දීර්ඝ කරන ලදී. අවම ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම සඳහා රඳවාගත් ඉපයුම ඉහළ දැමීමට අභ්‍යන්තර ලාභදායීත්වය වර්ධනය කරන අතරතුර ප්‍රාග්ධන උසස්කිරීම සඳහා ඇති විකල්පයන් පිළිබඳ සොයාබැලීමක් බැංකුව මේ වන විට සිදුකරමින් සිටී. බැංකුවේ 51% ක හිමිකාරීත්වයක් බැංකුව දරන නිසා මෙම තත්ත්වය පිළිබඳ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයට සහ මුදල් අමාත්‍යංශ දැනුවත් කර ඇත.

හිමිකම




## ද්‍රවශීලතාවය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පැනවූ විචක්ෂණ සීමා වලට සමගාමීව බැංකුවේ ප්‍රමාණාත්මතාවය හඳුනාගැනීම සඳහා වත්කම් හා වගකීම් කමිටුව නිතිපතා බැංකුවේ ද්‍රවශීලතාවය මිනුම්කරණය හා ඇගයීම සිදුකරනු ලබන අතර ආතති පරීක්ෂාවන් මඟින් උපරිම තත්ත්වයන් යටතේ ප්‍රමාණාත්මතාවය හඳුනාගැනීම සිදුකරනු ලබයි. බැංකුව වර්ෂය පුරා එහි ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාතය 30% කට වැඩි හිතකර මට්ටමකින් පවත්වා ගෙන ඇති අතර එහි නියාමන අවශ්‍යතාවය 20% කි. එසේම බැංකුව එහි ද්‍රවශීලතා ආවරණ අනුපාතය නියාමන අවශ්‍යතාවයට ඉහළින් වර්ෂය පුරාවටම පවත්වාගෙන ඇත. ඊට අමතරව අමතර ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා වෙනත් බැංකු ආයතන වලින් ලබා ගැනීමට අනුමත කළ භාවිතා නොකළ රු. බිලියන 01 ක වැඩි ණය ප්‍රවාහ බැංකුව පවත්වා ගනී.

## වත්කම් වල ගුණාත්මකභාවය

2014 සැප්තැම්බර් මස දී ශ්‍රී ලංකා මහ බැංකු නියමයන්ට අනුව අක්‍රීය ණය වර්ගීකරණ පදනම සංශෝධනය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස වාර්තා කළ මට්ටමට සාපේක්ෂව 3% ක් පමණ පිරිහී ඇත. කෙසේ වෙතත් 2015 හා 2016 වර්ෂ වලදී යෙදූ අමතර උත්සාහය නිසා සේ.අ.අ ශේෂය මත වූ ණය හැර ණය කළඹෙන් 11.33% සිට 6.78% දක්වා වූ උසස් තත්ත්වයක් බැංකුව වාර්තා කොට ඇත. ඉදිරියේදී අක්‍රීය ණය තත්ත්වයන් අඩු කිරීම සම්බන්ධව කළමනාකරණය ඉහළ මට්ටමින් බැඳී සිටින අතර අක්‍රීය ණය ආවරණ කටයුත්ත එක් දෙපාර්තමේන්තුවකින් සිදුනොකොට විමධ්‍යගත කර ඇත. 2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සමස්ථ අක්‍රීය ණය 17.58% කි. වාර්ෂික ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ආවරණය කරගනු ලබන සේ.අ.අ ශේෂය මත ලබාදුන් ණය අධික ලෙස නොගෙවීම නිසා ඉහළ අක්‍රීය ණය තත්ත්වයක් ඇතිවී ඇත.

# 2016 වර්ෂයේදී අපගේ නිෂ්පාදිත වල කාර්යඵලය

## 2016 වර්ෂය - ලබාදුන් ණය කළඹෙහි සංයුතිය

2016.12.31 දිනට

| ණය මාර්ගය | වටිනාකම (රු.මිලියන) | ලබාදුන් ණය |
|---|---|---|
| නිවාස ණය | 25,548 | 84.73% |
| ක්ෂුද්‍ර මූල්‍ය | 1,176 | 3.90% |
| ව්‍යාපාරික ණය | 1,191 | 3.95% |
| රථ වාහන ණය - සේවක | 63 | 0.21% |
| රත්‍රං ණය | 252 | 0.83% |
| කල්බදු | 1,023 | 3.39% |
| ව්‍යාපෘති ණය | 10 | 0.03% |
| වෙනත් | 888 | 2.95% |
| මුළු එකතුව | 30,151 | 100.00% |

## 2016 වර්ෂය- ලබාදුන් ණය කළඹෙහි සංයුතිය



| | |
|---|---|
| නිවාස ණය | 84.73% |
| ක්ෂුද්‍ර මූල්‍ය | 3.90% |
| ව්‍යාපාරික ණය | 3.95% |
| රථ වාහන ණය - සේවක | 0.21% |
| රත්‍රං ණය | 0.83% |
| කල්බදු | 3.39% |
| ව්‍යාපෘති ණය | 0.03% |
| වෙනත් | 2.95% |



HDFC බැංකුව Lanka Pay පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයට එකතු වීම




පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකින් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන



පැලියගොඩ ශාඛාව නව ස්ථානයකට රැගෙන යාම




සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා HDFC බැංකුව හා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සමඟ අත්වැල් බැඳ ගැනීම




ස්වයං රැකියා ප්‍රවර්ධන ක්‍රියාමාර්ග ණය යෝජනා ක්‍රමය සඳහා HDFC බැංකුව හා ශ්‍රී ලංකා මහ බැංකුව අවබෝධතා ගිවිසුමකට අත්සන් කිරීම



පහ(05) වසර සිසුන් සඳහා ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය

# 2016 වර්ෂයේදී ප්‍රාග්ධනයට කළ වෙනස් කිරීම්

HDFC බැංකුවට විශාල වශයෙන් ඉඩම් හා දේපළ හිමිකාරීත්වයක් නොමැත. සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කළ සහ ප්‍රමාණාත්මක වශයෙන් වෙනස් නොවූ නිම කළ වත්කම් ගෘහ භාණ්ඩ හා රථ වාහන වලට පමණක් සීමා විය.

HDFC බැංකුව සතුව කිසිදු ස්වාභාවික ප්‍රාග්ධනයක් නොමැති අතර සේවා සම්පාදකයකු ලෙස බැංකුවේ සෘජු පාරිසරික බලපෑමද සීමිතය. කෙසේ වෙතත් නිවාස සහ ව්‍යාපාර ණය හරහා තුන්වන පාර්ශව කටයුතු සඳහා බැංකුව මූල්‍යයනය කිරීම නිසා ඉඩම් සංවර්ධනය, භූගත ජලය ලබාගැනීම්, බලශක්ති හා ජල පරිභෝජනය සහ පරිසර දූෂණය වැනි දෑ තුළින් වක්‍රව සිදුවන පාරිසරික බලපෑම පිළිබඳව බැංකුව දැනුවත්ව ඇත. තවද වර්තමානය වන විට එවැනි බලපෑම් මිනුම්කරණය කිරීමට බැංකුව සතුව යාන්ත්‍රණයක් නොමැති අතර මෙම කරුණ සම්බන්ධයෙන් වාර්තා කිරීමක් කර නැත. ණය සැපයීමේදී පාරිසරික නියාමනයන් දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම මගින් වක්‍රාකාර සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා බැංකුව ක්‍රියාත්මක වී ඇත.

## HDFC බැංකුවට වැදගත් වන ප්‍රාග්ධනයන්

බැංකුවේ වර්තමාන හා අනාගත තිරසාරත්වයට ඇති වැදගත්කම හේතුවෙන් බැංකුවේ මූල්‍ය, බුද්ධිමය, මානව හා සමාජ ප්‍රාග්ධනයන් වැදගත් ප්‍රාග්ධනයන් ලෙස HDFC බැංකුව හඳුනාගෙන ඇත. විශේෂයෙන් 2016 මූල්‍ය වර්ෂය තුළදී බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධන පදනම තුළ වැදගත් වෙනස් වීම් විශාල ප්‍රමාණයක් දක්නට ලැබිණි.

**බුද්ධිමය ප්‍රාග්ධනය:** අපගේ බැංකුව තුළ සහ ශාඛා තුළ ඇති පද්ධති හා ක්‍රියාවලි (පරිගණක දෘඩාංගද ඇතුළුව) සහ අපගේ සේවකයින්ගේ විශේෂඥතාවන් අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය වේ. නවීන හර බැංකුකරණ පද්ධතිය ස්ථාපිත කිරීමත් සමග 2016 මූල්‍ය වර්ෂය තුළදී අපගේ බුද්ධිමය ප්‍රාග්ධන පදනම තුළ ප්‍රමාණාත්මක වෙනස්වීමක් දක්නට ලැබිණි. පාරිභෝගිකයින් සහ වෙළෙඳපොළ නැඹුරුතාවය ග්‍රහණය කරගැනීමට හැකිවීම සහ දැනට පවතින ක්‍රියාවලි උසස් කිරීම තුළින් නව පද්ධතිය හරහා අපගේ බුද්ධිමය ප්‍රාග්ධන පදනම වර්ධනය වනු ඇත. ස්වයංක්‍රීයකරණය සහ තොරතුරු තාක්ෂණ දක්ෂතා යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය නිසා සෘජුවම මානව ප්‍රාග්ධනයට නව පද්ධතිය මගින් බලපෑම් කර ඇත. පාරිභෝගිකයාට ගැලපෙන ලෙස වෙනස් කළ හැකි නව නිෂ්පාදිත සංවර්ධනය කිරීමට උපකාර කිරීම මගින් සහ නවීන තාක්ෂණය මත පදනම් වූ බැංකුවක් ලෙස එහි සන්නාමය ස්ථාන ගත කිරීම තුළින් එහි සන්නාමය උසස් කිරීම හරහා සමාජ ප්‍රාග්ධනයට නව තාක්ෂණය මගින් සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන බව අපගේ විශ්වාසයයි.

**මානව ප්‍රාග්ධනය:** HDFC බැංකුව සමාන අවස්ථා සපයන නොවෙනස් කම් මූලික කරගත් සේවා යෝජකයෙකි. බැංකුව මේ වන විට මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති උසස් කරමින් සිටී. කෙසේ වෙතත් බඳවාගැනීමේ පටිපාටිවල, සේවක ප්‍රතිලාභවල සහ දුක්ගැනවිලි කළමනාකරණ ක්‍රියාවලි වල සැලකිය යුතු වෙනසක් සිදු වූයේ නැත. කම්කරු නීති හෝ සේවක අයිතීන් කඩ කිරීමකට අදාළව අධිකරණයෙන් හෝ කම්කරු විනිශ්චය සභාවෙන් බැංකුවට එරෙහිව කිසිදු නීතිමය ක්‍රියාමාර්ග ගෙන නැත. දැනට බැංකුවේ සේවකයින්ගෙන් 99% ක්ම වෘත්තීය සමිති සාමාජිකයින් වන අතර නව සාමූහික ගිවිසුමක් 2017 වර්ෂයේදී අත්සන් කරනු ලැබේ. වර්ෂය තුළදී වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් කාර්යය බාධාවන් ඇති වී නැත.

සමාජ ප්‍රාග්ධනය : අපගේ සමාජ ප්‍රාග්ධනය තුළ අඩංගු වන්නේ.

- මෙහෙයුම් සඳහා ඇති අපගේ නීතිමය බලපත්‍රය සහ නියාමය අනුකූලතාවය හරහා වූ අපගේ සමාජ විශ්වාසනීයත්වය.
- අපගේ සේවා සැපයුම් ජාලය හරහා අත්පත් කරගත් සමාජ තුළ වූ අපගේ වපසරිය හා පැවතීම.
- අපගේ සන්නාම පැවැත්ම
- උපායමාර්ගික හවුල්කාරීත්වයන්ද ඇතුළුව අපගේ පාර්ශවකරුවන් සමග සම්බන්ධතාවය.

අනෙක් බැංකු වලට සාපේක්ෂව HDFC බැංකුව කුඩා බැංකුවක් වුවද අප සාම්ප්‍රදායිකව සේවය කරන ප්‍රජාවන් යටතේ ශක්තිමත් සමාජ පිළිගැනීමක් අප භුක්ති විඳී. සාංගමික සමාජ වගකීම් ක්‍රියාකාරකම් මෙන්ම අලෙවිකරණය, සන්නාම ගොඩනැගීම්, ප්‍රචාරණය සහ වාර්ෂික වාර්තාව ඇතුළු වෙනත් බාහිර සන්නිවේදකයන් වැනි දෑ HDFC සන්නාමය ගොඩනැගීමට සිදුකල දායකත්වය නිසා අපගේ සමාජ ප්‍රාග්ධනය නිර්වචනය කිරීමේදී ඇතුලත් කර ඇත. HDFC බැංකුව කිසිදු පරිත්‍යාග යක් හෝ දේශපාලන අරමුදල් සම්පාදනයක් සිදුකර නොමැත. වර්ෂය තුළදී කිසිදු නියාමනයකට අදාළව අනුකූල නොවීමක් සඳහා බැංකුවට එරෙහිව කිසිදු අධිකරණ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

මූල්‍ය ප්‍රාග්ධනය : මෙයට අපගේ ආදායම්, ආයෝජන, හිමිකම් හා වත්කම් අදාළ වේ. වර්ෂය තුලදී සිදුවූ ප්‍රධාන වෙනස්කම් සඳහා මූල්‍ය උධෘතයන් සහ තොරතුරු සඳහා මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්න. බැංකුවේ මූල්‍ය තත්ත්වය පැහැදිලි කරන මූල්‍ය සමාලෝචයක්ද මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

## HDFC බැංකුවේ ප්‍රමාණාත්මක ප්‍රාග්ධනයන් 2016 වර්ෂය තුළදී ප්‍රාග්ධනයට වෙනස්වීම්

| බුද්ධිමය ප්‍රාග්ධනය | මානව ප්‍රාග්ධනය | සමාජ ප්‍රාග්ධනය | මූල්‍ය ප්‍රාග්ධනය |
|---|---|---|---|
| අපගේ බැංකුව තුළ සහ ශාඛා තුළ ඇති පද්ධති හා ක්‍රියාවලි (පරිගණක දෘඩාංගද ඇතුළුව) සහ සියළුම දක්ෂතා<br>▲ මෘදුකාංග සහ පරිගණක<br>▲ පද්ධති<br>▲ පර්යේෂණ හා සංවර්ධනය | ▲ HDFC සේවකයින්<br>▲ ස්ථිර<br>▲ කොන්ත්‍රාත්<br>▲ පරිවාස<br>▲ පුහුණු හා සංවර්ධන | මෙහෙයුම් බලපත්‍ර, බෙදාහැරීම් ජාලය, පාර්ශවකාර සබඳතා සහ සන්නාම හිමිකම යන දෑ වලින් වූ අපගේ සමාජ රුදියාව<br>▲ සේවා බෙදාහැරීම්<br>▲ සන්නාම ශ්‍රේණිගත කිරීම්<br>▲ ප්‍රචාරණය හා අලෙවිකරණය<br>▲ පාර්ශවකාර සබඳතා<br>▲ සාංගමික සමාජ වගකීම් ක්‍රියාකාරකම්<br>▲ උපායමාර්ගික හවුල්කාරීත්වයන් | ▲ ආදායම්<br>▲ ආයෝජන<br>▲ හිමිකම<br>▲ ණය පොත |
| ▲ හර බැංකුකරණ පද්ධති සඳහා සමස්ථ ආයෝජනය රු.මිලියන 193 කි. | ▲ නව බඳවාගැනීම්: 55<br>▲ මුළු සේවකයින්: 679<br>▲ ස්ථිර සේවකයින්: 448<br>▲ පරිවාස සේවකයින්: 23<br>▲ කොන්ත්‍රාත් පදනම මත සේවකයින්: 119<br>▲ සේ.අ.අ සහ සේ.නි.අ මත මුළු වියදම: රු මිලියන 110<br>▲ සේවක ප්‍රතිලාභ මත මුළු වියදම: රු මිලියන 692<br>▲ සේවක වැටුප් වල මුළු වටිනාකම: රු මිලියන 478<br>▲ සේවක පුහුණුව මත මුළු ආයෝජනය: රු මිලියන 6.5 | ▲ බැංකුවේ ශාඛා ගණන 38 ලෙෂ නොවෙනස්ව පැවතියද පාරිභෝගිකයින්ගේ පහසුව සඳහා පෑලියගොඩ, පිළියන්දල සහ අම්පාර ශාඛා නව ස්ථාන වලට රැගෙන යන ලදී.<br>▲ මුළු ජංගම බැංකුකරුවන්: 160<br>▲ සන්නාම ශ්‍රේණිය 58 සිට 51 දක්වා 07 කින් ඉහළ යන ලදී. | ▲ මුළු ආදායම රු.මිලියන 4,925 සිට රු.මිලියන 5,972 දක්වා ඉහළ යන ලදී.<br>▲ මුළු ආයෝජන රු.මිලියන 14,078 කි.<br>▲ හිමිකම රු.මිලියන 364 කින් ඉහළ යන ලදී.<br>▲ මුළු වත්කම් රු.මිලියන 41,912 සිට රු.මිලියන 45,622 දක්වා ඉහළ යන ලදී. |

# වර්ධන උපායමාර්ගය

දිගුකාලීන වර්ධනය පවත්වා ගැනීම සඳහා ව්‍යාපෘති බැංකුව විවිධාංගීකරණ උපායමාර්ගයක් යොදාගෙන ඇත. 2012 වර්ෂයේ සිට නිවාස මූල්‍ය සේවා වලින් එපිටට එහි නිෂ්පාදිත කළඹ විවිධාංගීකරණ කර ඇති අතර නව පාරිභෝගික අංශ ඉලක්ක කරගන්නා ලදී. කෙටි කාලයේ සිට මධ්‍ය කාලය දක්වා නව පාරිභෝගික කණ්ඩායම් සඳහා නව නම්‍යශීලි නිෂ්පාදිත බැංකුව අඛණ්ඩය හඳුන්වා දෙනු ලැබේ.

නව නිෂ්පාදිත සංවර්ධනය | පවතින වෙළෙඳපොළවල් අවබෝධ කරගැනීම | නව වෙළෙඳපොළ අංශ

වර්ධන උපායමාර්ගය

### ඉලක්ක සහ සම්පත් වෙන්කිරීම

HDFC බැංකුවේ නව සිව් අවුරුදු සාංගමික උපායමාර්ග සැලැස්ම මඟින් 2017 සිට 2020 දක්වා කාලය සඳහා බැංකුවේ වර්ධනය වෙනුවෙන් මාර්ගෝපදේශ ලියවිල්ලක් වනු ඇත. නව හර බැංකුකරණ පද්ධතිය තුළින් දෛනික පදනමින් තනි තනි බැංකු ශාඛාවේ කාර්යඵල නිරීක්ෂණය සිදුකිරීමට හැකියාව ලැබෙනු ඇත. ප්‍රගතිය සහ ගැලපීම් සඳහා මෙම සාංගමික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් මාසිකව සමාලෝචනය කරනු ලැබේ.

### වැදගත් ප්‍රතිඵල

- කොටස් හිමියන්ගේ අනුමැතියට යටත්ව 2020 වර්ෂය අවසාන වන විට අපගේ දැනට පවතින රු.බිලියන 3.6 ප්‍රාග්ධනය රු.බිලියන 10 දක්වා ඉහළ දැමීමට අප බලාපොරොත්තු වේ.
- අපගේ දැනට පවතින රු.බිලියන 45 ශේෂ පත්‍රය 2020 අවසාන වන විට දෙගුණයකටත් වඩා වැඩි කරමින් රු.බිලියන 100 දක්වා ගෙන යාම.
- 2016 වර්ෂයේදී රු.මිලියන 360 ක් වූ බදු පසු ලාභය 2020 වර්ෂය අවසාන වන විට රු.බිලියන 1.5 දක්වා වර්ධනය කිරීම.
- වර්තමානයේ 39 ක් වූ ව්‍යාපෘති බැංකුවේ ශාඛා ගණන 2020 අවසානයේදී 60 දක්වා ඉහළ දැමීම.
- වර්තමානයේ 670 ක් වූ අපගේ සේවක පදනම 800 ක් දක්වා ඉහළ දැමීම.

### HDFC බැංකුවේ 2017-2020 සඳහා කාර්යඵල ඉලක්ක

| ඉලක්කය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| ශේෂ පත්‍රය (රු.මිලියන) | 66,800 | 81,800 | 100,000 |
| බදු පසු ලාභය (රු.මිලියන) | 900 | 1,200 | 1,500 |
| හිමිකම (කොටස් හිමියන්ගේ අනුමැතියට යටත්ව) (රු.මිලියන) | 6,300 | 7,500 | 10,000 |

### සාංගමික සැලැස්ම යටතේ සම්පත් වෙන්කිරීම

- ශාඛා පුළුල් කිරීම, ජංගම බැංකුකරණ ඒකක පුළුල් කිරීම (HDFC Palmtop බැංකුකරුවන්) සහ රජයේ හා පෞද්ගලික ආයතන සමඟ උපායමාර්ගික හවුල්කරණය හරහා වෙළෙඳපොළට ඇතුල්වීම HDFC බැංකුව අඛණ්ඩව සිදුකරයි.
- නව වෙළෙඳපොළ අංශ තුළ සන්නාම හඳුනාගැනීමට උපකාරී වීම සඳහා අලෙවිකරණ සහ ප්‍රවර්ධන වැඩසටහන් පවත්වනු ඇත.
- නව නිෂ්පාදිත සංවර්ධනයන්ට සරිලන ධාරිතා උසස් කිරීම් සඳහා සහ පිරිවැය හා ඵලදායීතා වර්ධනය සඳහා පද්ධති සහ ක්‍රියාවලි නව්‍යකරණය සහ උසස් කිරීම අඛණ්ඩව සිදුකිරීම
- සේවක පුහුණුව, විශේෂඥ දක්ෂතා ඇති අය බඳවාගැනීම සහ පාරිභෝගික ප්‍රතිචාර හා සමීක්ෂණ හරහා සේවා සම්පාදනය ශක්තිමත් කිරීම.
- වර්ධනයට සහය වන පසුබිමක් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රමවේද උසස් කිරීම.

# අපගේ අවදානම් කළමනාකරණය කරගනිමින්

බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධතිය ආරක්ෂක ක්‍රියාමාර්ග 03 ක් හරහා නිරන්තර සමාලෝචනය ලක් වේ. 2016 වර්ෂය තුළදී නැඟී එන අවදානම් තත්ත්වයන් හඳුනාගත් අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සමග අදාළ ප්‍රතිචාර දැක්වීම් සිදුකරන ලදී.

## ප්‍රධාන අවදානම් සහ බැංකුවේ ප්‍රතිචාර

2016 අවසානයේදී බැංකුව මුහුණ දුන් සැලකිය යුතු අවදානම් තත්ත්වයන්

- පොළී අනුපාත අවදානම
- තැන්පතු රැස්කිරීමේ අවදානම
- BASAL III අවශ්‍යතාවයන් යටතේ වූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවදානම
- ද්‍රවශීලතා ආවරණ අනුපාතය
- තොරතුරු තාක්‍ෂණ පද්ධති සහ ආරක්‍ෂණ අවදානම
- නව තොරතුරු තාක්‍ෂණ පද්ධතිය සමග බද්ධ වූ මානව සම්පත් අවදානම

| අවදානම් මට්ටම | අවදානම් වර්ගය | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| | **පොළී අනුපාත අවදානම** | ▲ වෙළෙඳපොළ වෙනස් වීම් වලට ප්‍රතිචාර ලෙස ණය ප්‍රතිමිලකරණය කිරීම.<br>▲ බාලවයස්කාර ගිණුම් සහ දිගුකාලීන අරමුදල් වෙනුවෙන් වේගවත් ප්‍රවර්ධනයක් ලබාදීම.<br>▲ ප්‍රතිමූල්‍ය අරමුදල්කරණය සමග ආයතනික ණය යෝජනා ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම. |
| | **තැන්පතු රැස්කිරීමේ අවදානම** | ▲ ආයතන කිහිපයකගෙන් වූ ස්ථාවර තැන්පතු මත රැස්කිරීම් අවම කිරීමට සහ මහජන ඉතුරුම් තැන්පතු වර්ධනය සඳහා වෙහෙසක් දැරීම. |
| | **ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය**<br>කෙටි කාලීන තැන්පතු අරමුදල් දිගු කාලීන ණය වලට පරිවර්තනය වීම නිසා වූ පරිණතාභාවයේ නොගැලපීම නිසා 60%ක් වූ ද්‍රවශීලතා ආවරණ අනුපාතය ලඟා කරගැනීමට බැංකුවට නොහැකි විය. | ▲ බැංකුව කෙටි කාලීන ණය කළඹ ප්‍රවර්ධනය කල අතර නියාමන අවශ්‍යතා සැපිරීම සඳහා ආයෝජනය කිරීම. |
| | **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අවදානම**<br>2018 ජනවාරි මස 01 දින වන විට බැංකුව රු. බිලියන 5 ක අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයකට අනුකූල විය යුතුය. කෙසේ වෙතත් එය සම්පූර්ණ කිරීම සඳහා තවත් රු. බිලියන 1.3 ක ශේෂයක් සම්පූර්ණ කළ යුතුය. | ▲ ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා බැංකුව උපායශීලිය කටයුතු කරමින් සිටී.<br>▲ ප්‍රාග්ධන යෙදවීමක් සඳහා රජය නියෝජනය කරන කොටස්හිමියන් සමග සාකච්ඡා කරමින් සිටී. |
| | **තොරතුරු තාක්‍ෂණ පද්ධති අවදානම**<br>අභ්‍යන්තරව ගොඩනැගූ තොරතුරු තාක්‍ෂණ පද්ධති වෙනුවට නව හර බැංකුකරණ පද්ධතියක් බැංකුව ස්ථාපිත කර ඇත. | ▲ ස්ථාපනය වෙමින් පවතින නව හර බැංකුකරණ පද්ධතියේ ප්‍රගතිය තොරතුරු තාක්‍ෂණ මෙහෙයුම් කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු මඟින් සමාලෝචනය කරනු ලැබේ.<br>▲ ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ තොරතුරු තාක්‍ෂණ උපාය මාර්ග සැලැස්මක් හා තොරතුරු තාක්‍ෂණ ප්‍රතිපත්ති සහිත පළපුරුදු සහ සුදුසුකම් ලත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතු ව්‍යුහගත තොරතුරු තාක්‍ෂණ අංශයක් බැංකුව සතුව ඇත. |

# අපගේ අවදානම් කළමනාකරණය කරගනිමින්

| අවදානම් මට්ටම | අවදානම් වර්ගය | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| | **තොරතුරු ආරක්ෂණ කළමනාකරණය** | තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය<br>අභ්‍යන්තර විගණන අංශය මගින් පද්ධති විගණනය සහ සංවර්ධනය සිදුකිරීම.<br>සැසඳීම හා දෛනික සමබරකිරීමේ ක්‍රියාවලි<br>කළමනාකරණ සමාලෝචන සඳහා නිතිපතා පද්ධති මඟින් ලබාදෙන කළමනාකරණ තොරතුරු. |
| | **මානව සම්පත් අවදානම** | නව තෙරතුරු පද්ධතිය සහ පවතින ක්‍රියාවලි වලට වූ වෙනස් වීම් සම්බන්ධව සියළුම සේවකයින් සඳහා පුහුණු කිරීම් ආරම්භ කිරීම.<br>මානව සම්පත් ප්‍රතිපත්ති හා ක්‍රමවේද සකස් කර තිබීම.<br>වෘත්තීය සමිති සමඟ සාමූහික ගිවිසුම්.<br>පුහුණුව හා සංවර්ධනය, වරප්‍රසාද හා පිළිගැනීම රැකියා ජීවිතයේ සමබර කිරීම වැනි දෑ තුළින් නිතිපතා ධාරිතා උපරිම කිරීම. |
| | **ණය රැස්කිරීම** | තනි ණය ගැනීමේ සීමාවන් මත වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ වලට අනුකූල වෙමින් ණය ප්‍රතිපත්තිය සහ උපරිම ණය සීමාවන් ස්ථාපිත කර ඇත.<br>ක්ෂේත්‍රය, යෝජනාක්‍රමය, ආදායම් කණ්ඩායම, ප්‍රදේශය සහ සුරැකුම යන අංශයන් සඳහා අවධානය යොමු කරමින් කළඹ කළමනාකරණය කිරීම.<br>අයවැය පාලනයන් හරහා උපායමාර්ගික ලාභ කළමනාකරණය. |
| | **ණය ප්‍රතිපත්තිය සහ ණය අයකරගැනීම් කළමනාකරණය** | අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය සහ ණය සාමාලෝචන පද්ධතිය සාමාලෝචනය සහ උසස් කිරීම.<br>ණය අනුමතකිරීමේ කාලය අවම කිරීමට සහ සමීප නිරීක්ෂණයට පහසුකම් සැලසීමට ණය ඇගයීමේ ක්‍රියාවලිය පරිගණකගත කිරීම සහ අන්තර්ජාලයට සම්බන්ධ කිරීම. සේ.අ.අ ණය එක් වැඩ කරන දිනකදී ලබාදීමට ශාඛා බැංකුවට හැකියාව ඇත.<br>ඊට අමතරව, ණය ප්‍රතිපත්තිය හා ක්‍රමවේද නිරන්තර සමාලෝචනයට ලක් කරන (දැනට රු.මිලියන 2.5 වැඩි ණය අවදානම් නිලධාරීන් විසින් සමාලෝචනය කරනු ලැබේ) අතර කාර්යඵල උසස් කිරීම සඳහා අයකරගැනීම් දෙපාර්තමේන්තුව සමාලෝචනය කරනු ලැබේ.<br>ණය තොරතුරු කාර්‍යාංශ අවශ්‍යතාවයන් සමඟ අනුකූලතාවය සහතික කිරීම. |
| | **ක්‍රියාවලි හෝ හැසිරීම් අවදානම**<br>(වංචා සහගත කටයුතු වැලැක්වීම | ගණුදෙනුවල නිතිපතා අනුකූලතා සමාලෝචනය<br>නව නිෂ්පාදිත හා ක්‍රම වේද හඳුන්වාදෙන විට අවදානම් හඳුනාගැනීම සඳහා අවදානම් සහ අනුකූලතා තක්සේරුවක් සිදුකිරීම.<br>පද්ධති හා ක්‍රමවේද මත අඛණ්ඩ පුහුණුව<br>අන්තර් දෙපාර්තමේන්තු අභ්‍යන්තර පාලන<br>හදිසි අවස්ථා සැලැස්මක් ලෙස ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් පවතී. |

| අවදානම් මට්ටම | අවදානම් වර්ගය | බැංකුවේ ප්‍රතිචාරය |
|---|---|---|
| | අවදානම් පාලනය ප්‍රමාණවත් නොවීමේ හා කළමනාකරණ අවදානම් | - සියළුම වර්ගයේ අවදානම් වලට මුහුණ දීමට හැකිවන පරිදි අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රමාණවත්ව ස්ථාපිත කොට ඇත.<br>- ඇතිවිය හැකි අවදානම් තත්ත්වයන් වලින් ආරක්‍ෂා වීමට ගැලපෙන අවදානම් සංස්කෘතියක් ඇති කිරීම.<br>- අධ්‍යක්‍ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව මගින් අවදානම් කළමනාකරණය මත ණය ප්‍රතිපත්ති සමාලෝචනය කරනු ලැබේ. |
| | නෛතික හා නියාමන අනුකූලතවය | - නියාමන අවශ්‍යතාවයන් පිළිපැදීම සමාලෝචනය කරනු ලබන අනුකූලතා නිලධාරීවරයා අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවට, ශ්‍රී ලංකා මහ බැංකුවට සහ කොළඹ කොටස් හුවමාරුවට කාර්තුමය පදනමින් වාර්තා කරනු ලැබේ.<br>- නීති- සහකාර සාමාන්‍යාධිකාරවරයෙකුගේ ප්‍රධානත්වයෙන් හා සුදුසුකම් ලත් නීතීඥවරු 15 දෙනෙකුගෙන් සමන්විත වෙනමම නීති දෙපාර්තමේන්තුවක් පැවතීම.<br>- සුදුසුකම් ලත් සමාගම් ලේකම්වරයෙකු<br>- ප්‍රතිපත්ති හා ක්‍රමවේද<br>- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරවරයෙක් ප්‍රධානත්වය දරන මූල්‍ය අංශයක් |
| | ඒකාබද්ධ වීම් අවදානම | - ඒකාබද්ධ වීමේ නැගී එන අවශ්‍යතාවලට ගැලපෙන හැකියාවන් හා සන්නාම වටිනාකම් බැංකුව උසස් කර ඇත |

### අවදානම් රුචිකත්ව විෂයපථය

අවදානම් රුචිකත්ව විෂයපථය තුළ හඳුනාගත් අවදානම් ක්ෂේත්‍ර සඳහා අවදානම් රුචියන් හා දරාගත හැකි මට්ටම් පැහැදිලිව නිර්ණය කර ඇති අතර පෙර නිර්ණය කරන ලද දරාගත හැකි මට්ටම් තුළ නිරීක්‍ෂණය කළ සියළුම මට්ටම් තුන හා අවදානම් කළමනාකරණය මත අඛණ්ඩව ස්ථාපිත කර ඇත. අනාගත සාර්ව ආර්ථික පීඩනයන් බැංකුවට අවශෝෂණය කරගැනීම ඇති හැකියාව සහතික කිරීම සඳහා ආතති පරීක්‍ෂාවක් සිදුකරනු ලැබේ.

### අවදානම් පාලන ව්‍යුහය

### ආරක්‍ෂක ස්ථර තුන

**අධ්‍යක්‍ෂ මණ්ඩලය මට්ටමේ අවදානම් කළමනාකරණය**

- අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
- අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව
- සම්බන්ධිත පාර්ශව ගණුදෙනු කමිටුව

▶

**කළමනාකරණ මට්ටමේ**

- වත්කම් හා වගකීම් කමිටුව
- ණය කමිටුව
- ආයෝජන කමිටුව
- තොරතුරු තාක්‍ෂණ මෙහෙයුම් කමිටුව
- අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලි සමාලෝචන කමිටුව
- උපාය මාර්ගික ක්‍රියාවලි ස්ථාපන සමාලෝචන කමිටුව

▶

**අවදානම් දෙපාර්තමේන්තුව**

- බැංකුවේ දෛනික අවදානම් නිරීක්‍ෂණය

# අපගේ අවදානම් කළමනාකරණය කරගනිමින්

## අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතා සමග සමගාමීව අවදානම් නිරීක්ෂණය, හඳුනාගැනීම සහ කළමනාකරණය සඳහා සෘජුවම සම්බන්ධ වන අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු 03 බැංකුව සතුව ඇත.

| අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව | අරමුණ | සංයුතිය |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව | ▲ විවිධ ඒකාබද්ධ අවදානම් තත්ත්වයන් නිර්ණය කිරීම<br>▲ ශක්තිමත්, පුළුල් හා ඒකීය අවදානම් කළමනාකරණ විෂය පථයක් පවත්වාගැනීම. | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයකු සභාපතිධුරය දරනු ලබයි.<br>▲ විධායක නොවන අධ්‍යක්ෂවරු 05<br>▲ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරු 10 |
| අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව | ▲ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණාත්මකභාවය හා සඵලදායීත්වය විභාග කිරීම.<br>▲ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය<br>▲ නියාමන අවශ්‍යතාවයන් සඳහා අනුකූලතාවය තක්සේරු කිරීම<br>▲ අභ්‍යන්තර විගණන වාර්තාවල අන්තර්ගතය සලකා බැලීම | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයකු සභාපතිධුරය දරනු ලබයි.<br>▲ විධායක නොවන අධ්‍යක්ෂවරු 05<br>▲ රජයේ විගණකගෙන් එක් නියෝජිතයකු<br>▲ සාංගමික කළමනාකරණයෙන් එක් සාමාජිකයකු |
| සම්බන්ධිත පාර්ශව ගණුදෙනු නිරීක්ෂණ කමිටුව | ▲ නියාමන අවශ්‍යතා මත වූ නීති හා මූලධර්ම වලට, සුපරීක්ෂණ ක්‍රම වේද වලට හා වෙළෙඳපොළ මනා පරිචයන්ට අනුව සම්බන්ධිත පාර්ශව ගණුදෙනු වල අනුකූලතාවය සහතික කිරීම. | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂවරයකු සභාපතිධුරය දරනු ලබයි.<br>▲ විධායක නොවන අධ්‍යක්ෂවරු 05 |

## කළමනාකරණ මට්ටමේ කමිටු

අවදානම් මාතෘකා යටතේ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු දැනුවත් කරන කළමනාකරණ කමිටු බැංකුව සතුව ඇත. මෙම කමිටු මඟින් එකිනෙකට වෙනස් ව්‍යාපාර ක්‍රියාවලි සමග වෙනස් අවදානම් හිමිකරුවන් සම්බන්ධීකරණය කරනු ලැබේ. අභ්‍යන්තර විගණන ශ්‍රිතය, මෙහෙයුම් අංශය, භාණ්ඩාගාර අංශය, මූල්‍ය අංශය සහ අනුකූලතා අංශය මෙම අවදානම් හිමිකරුවන් වේ.

| කළමනාකරණ කමිටු | අරමුණු | සංයුතිය |
|---|---|---|
| වත්කම් හා වගකීම් කමිටුව | ▲ ද්‍රවශීලතාවය, වත්කම් හා වගකීම් වල පරිණතාභාවයේ පරිතරය, තැන්පතු හා ණය මිලකරණය,වෙළෙඳපොළ විචල්‍යයන් සඳහා සංවේදීතාවය වැනි දෑ මාර්ගෝපදේශ හා ප්‍රමිතීන් වට අනුව නිතිපතා නිරීක්ෂණය හා කළමනාකරණය | ▲ භාණ්ඩාගාර ප්‍රධානී<br>▲ සාංගමික කළමනාකරණයෙන් එක් සාමාජිකයකු |
| ණය කමිටුව | ▲ එහි සීමාවන් තුළ ණය අනුමත කිරීම<br>▲ අනුමත සීමාව ඉක්මවා පහසුකම් සපයන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.<br>▲ ණය අවදානම අවම කිරීම සඳහා ණය ඇගයීම, පරිපාලනය හා අයකරගැනීමේ ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම | ▲ සාමාන්‍යාධිකාරිවරයා<br>▲ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය)<br>▲ සහකාර සාමාන්‍යාධිකාරි(ව්‍යාපාර සංවර්ධන හා අලෙවිකරණ)<br>▲ ප්‍රධාන කළමණාකාර (ණය)<br>▲ ජ්‍යෙෂ්ඨ කළමනාකාර (අයකරගැනීම්) |
| ආයෝජන කමිටුව | ▲ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සිදුකරන ආයෝජන ඇගයීම හා නිරීක්ෂණය | ▲ සාංගමික කළමනාකරණයෙන් එක් සාමාජිකයකු |

| කළමනාකරණ කමිටු | අරමුණු | සංයුතිය |
|---|---|---|
| තොරතුරු තාක්‍ෂණ මෙහෙයුම් කමිටුව | ▲ බැංකුවේ තොරතුරු තාක්‍ෂණ සාංගමික සැලැස්ම සහ ක්ෂේත්‍ර සංවර්ධනයන්ට සමගාමීව තොරතුරු තාක්‍ෂණ සංවර්ධනයන් නිරීක්‍ෂණය | ▲ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්‍ෂණ)<br>▲ සාංගමික කළමනාකරණයෙන් එක් සාමාජිකයකු |
| උපාය මාර්ගික ක්‍රියාවලි ස්ථාපන සමාලෝචන කමිටුව | ▲ බැංකුවේ ශක්තිමත්භාවය තහවුරු කිරීමට ව්‍යාපාර මෙහෙයුම් සඳහා උපායමාර්ගික ක්‍රියාවලි නිර්ණය කිරීම | ▲ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීතුමන් ඇතුළු සාංගමික කළමනාකරණය |
| අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු ක්‍රියාවලි සමාලෝචන කමිටුව | ▲ විවිධ ඒකාබද්ධ අවදානම් තත්ත්වයන් සඳහා බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරුවක් සිදුකිරීම.<br>▲ එවැනි අවදානම් සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන පහසුකම් පවත්වා ගැනීම | ▲ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීතුමන් ඇතුළු සාංගමික කළමනාකරණයේ සාමාජිකයින් |
| අවදානම් කළමනාකරණ අංශය | ▲ අවදානම් හඳුනාගැනීම,නිරීක්‍ෂණය හා විශ්ලේෂණය කිරීම<br>▲ කලානුරූපීව ඇගයීම් වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීම<br>▲ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ කාර්යක්‍ෂමව ස්ථාපිත කිරීම සහතික කිරීම | ▲ ජ්‍යෙෂ්ඨ කළමනාකාර - අවදානම් කළමනාකරණ<br>▲ අවදානම් සහයකයින් දෙදෙනෙකු |

## 2016 මූලික අවදානම් ක්‍රියාමාර්ගය

බැංකුවට පවතින සියළුම ප්‍රමාණවත් අවදානම් ආවරණය වන පරිදි එහි අවදානම් රුචිකත්ව විෂයපථය බැංකුව සමාලෝචනය කරන අතර අවදානම් කළමනාකරණ ශ්‍රිතය ශක්තිමත් කරමින් හොඳින් අවදානම්-ප්‍රතිලාභ සහතික වන ආකාරයට ගැලපෙන අවදානම් සීමා සකස් කිරීම. හර බැංකුකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට සමගාමීව ඇති විය හැකි මෙහෙයුම් අවදානම් තත්ත්වයන් අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අවදානම් තත්ත්වයන් ඉලක්ක කර ගනිමින් පුහුණු වැඩසටහන්ද පවත්වා ඇත.

පොළී අනුපාත, අක්‍රීය ණය අනුපාත, ප්‍රාග්ධන අවශ්‍යතා වැනි දැඩි අවදානම් ක්ෂේත්‍ර වෙනුවෙන් ආතති පරීක්‍ෂාවන් සහ වෙනත් තත්ත්ව විශ්ලේෂණයන් සිදු කරන ලදී.




# අපගේ මාධ්‍යයන් උසස් කිරීම තුළ ඔබගේ වර්ධනය සඳහා වූ දේවල් අප පහසු කරන්නෙමු

# සාංගමික යහපාලනය සහ ආචාර ධර්ම

**සාංගමික යහපාලනය මත සභාපතිතුමන්ගේ ප්‍රකාශනය**

අප අපගේ 2016 සාංගමික යහපාලන වාර්තාව ඉමහත් සතුටකින් යුතුව ඉදිරිපත් කරන්නෙමු. මෙම වාර්තාව මඟින් සාංගමික යහපාලනයේ මූලික ක්ෂේත්‍ර පැහැදිලි කිරීමක් කරනු ලැබේ. සමස්ථ යහපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා අපගේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය උසස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව කටයුතු කරන අතර කාර්යක්‍ෂම බැංකුකරණ මෙහෙයුම් සඳහා වගවීම හා විනිවිදභාවය සහිත හොඳින් නිර්ණය කළ ආචාරශීලි සංස්කෘතියක් සැකසීමේ වැදගත්කම අවධාරණය කර ඇත.

බැංකුකරණ පනතට, ශ්‍රී ලංකා මහ බැංකුවේ සාංගමික යහපාලන නියමයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති වල වගන්ති 7.10 යටතේවූ අඛණ්ඩ ලැයිස්තුගත වීමේ නීති වලට HDFC බැංකුව අනුගත වී ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් දැනුම් දෙමි.

තවදුරටත්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ සංගමය මඟින් සංවර්ධනය කළ සාංගමික යහපාලනය මත මනා පරිචය සංග්‍රහයට අප ස්වේච්ඡාවෙන් අඛණ්ඩව අනුගත වී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සාංගමික යහපාලන නියමයන්ට බැංකුවේ අනුකූලතාවය පිළිබඳ සමාලෝචනයක් බාහිර විගණකවරුන් විසින් සිදුකරන ලදී. "අදාළ සේවා මත ශ්‍රී ලංකා ප්‍රමිත (SLSRS) 4,400" යටතේ විගණකයින් නිකුත් කළ සත්‍ය සොයගැනීම් වාර්තාවෙහි සියළුම සොයා ගැනීම් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

අපගේ සාංගමික යහපාලන පද්ධතිය පිළිබඳ වැඩි විස්තර සඳහා අවදානම් කළමනාකරණ පරිච්ඡේදය පරිශීලනය කරන්න.



**ආර්. ජේ ද සිල්වා මහතා**
සභාපති

# සාංගමික යහපාලනය සහ ආචාර ධර්ම

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීම - 2016

| නම | 2016/12/31 දිනට අධ්‍යක්ෂධූරයේ තත්ත්වය | පැවැත්වූ රැස්වීම් ගණන - 2016 | හිමිකම ලැබූ රැස්වීම් ගණන - 2016 | සහභාගී වූ රැස්වීම් ගණන - 2016 |
|---|---|---|---|---|
| ආර්. ජේ. සිල්වා මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ (සභාපති) | 21 | 21 | 21 |
| එම්. සුරේන්ද්‍රන් මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 21 | 21 |
| ප්‍රසාද් ගල්හේන මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 21 | 18 |
| ආර්. එච්. මීවක්කල මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 21 | 16 |
| එල්. එස්. පලන්සූරිය මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 21 | 16 |
| පී. එස්. පුංචිහේවා මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 21 | 19 |
| එස්. එම්. ජී. ජයරත්න මහතා (2016 පෙබරවාරි මස පත්කළ) | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 19 | 13 |
| ලයනල් ජයසිංහ මහතා (2016 ජුනි මස පත්කළ) | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 11 | 09 |
| ඩී. පී. විමලසේන මහතා (2016 ජුනි මස පත්කළ) | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 11 | 08 |
| ආර්. ඒ. චූලානන්ද මහත්මිය (2016 අගෝස්තු මස පත්කළ) | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 09 | 08 |
| බී. ජී. එස්. ගුණතිලක මහත්මිය (2016 ජූලි මස ඉවත් වූ) | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 10 | 09 |
| ආර්. එම්. ජේ. රත්නායක මහතා (2016 ජුනි මස ඉවත් වූ) | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ | 21 | 10 | 10 |

නාමයෝජනා කමිටු රැස්වීම් - 2016

| නම | 2016/12/31 දිනට අධ්‍යක්ෂධූරයේ තත්ත්වය | පැවැත්වූ රැස්වීම් ගණන - 2016 | හිමිකම ලැබූ රැස්වීම් ගණන - 2016 | සහභාගී වූ රැස්වීම් ගණන - 2016 |
|---|---|---|---|---|
| ආර්. ජේ. සිල්වා මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ (කමිටුවේ සභාපති) | 01 | 01 | 01 |
| ආර්. එච්. මීවක්කල මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 01 | 01 | 01 |
| එම්. සුරේන්ද්‍රන් මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 01 | 01 | 01 |
| බී. ජී. එස්. ගුණතිලක මහත්මිය | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 01 | 01 | 01 |
| එස්. එම්. ජී. ජයරත්න මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 01 | 01 | 01 |

මානව සම්පත් හා පාරිතෝෂික කමිටු රැස්වීම් - 2016

| නම | 2016/12/31 දිනට අධ්‍යක්ෂධූරයේ තත්ත්වය | පැවැත්වූ රැස්වීම් ගණන - 2016 | හිමිකම ලැබූ රැස්වීම් ගණන - 2016 | සහභාගී වූ රැස්වීම් ගණන - 2016 |
|---|---|---|---|---|
| එම්. සුරේන්ද්‍රන් මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ (කමිටුවේ සභාපති) | 04 | 04 | 04 |
| ආර්. ජේ. සිල්වා මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 04 | 04 | 04 |
| ප්‍රසාද් ගල්හේන මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 04 | 04 | 04 |
| ආර්. එච්. මීවක්කල මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 04 | 04 | 03 |
| එස්. එම්. ජී. ජයරත්න මහතා (2016 පෙබරවාරි මස පත්කළ) | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 04 | 04 | 04 |
| ලයනල් ජයසිංහ මහතා (2016 ජුනි මස පත්කළ) | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 04 | 02 | 01 |

# සාංගමික යහපාලනය සහ ආචාර ධර්ම

### ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් - 2016

| නම | 2016/12/31 දිනට අධ්‍යක්ෂධූරයේ තත්ත්වය | පැවැත්වූ රැස්වීම් ගණන - 2016 | හිමිකම ලැබූ රැස්වීම් ගණන - 2016 | සහභාගී වූ රැස්වීම් ගණන - 2016 |
|---|---|---|---|---|
| එම්. සුරේන්ද්‍රන් මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ (කමිටුවේ සභාපති) | 02 | 02 | 02 |
| ආර්. ජේ සිල්වා මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 02 | 02 | 02 |
| ආර්. එච් මීවක්කල මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 02 | 02 | 02 |
| ප්‍රසාද් ගල්හේන මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 02 | 02 | 02 |
| ලයනල් ජයසිංහ මහතා (2016 ජුනි මස පත්කළ) | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 02 | 01 | 01 |
| ආර්. එම්. ජේ රත්නායක මහතා (2016 ජුනි මස ඉවත් වූ) | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 02 | 01 | 01 |

### අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් - 2016

| නම | 2016/12/31 දිනට අධ්‍යක්ෂධූරයේ තත්ත්වය | පැවැත්වූ රැස්වීම් ගණන - 2016 | හිමිකම ලැබූ රැස්වීම් ගණන - 2016 | සහභාගී වූ රැස්වීම් ගණන - 2016 |
|---|---|---|---|---|
| එම්. සුරේන්ද්‍රන් මහතා | විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ (කමිටුවේ සභාපති) | 08 | 08 | 07 |
| ප්‍රසාද් ගල්හේන මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 08 | 08 | 07 |
| ආර්. එච්. මීවක්කල මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 08 | 08 | 03 |
| ඩී. පී. විමලසේන මහතා (2016 ජුනි මස පත්කළ) | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 08 | 05 | 03 |
| ලයනල් ජයසිංහ මහතා (2016 ජුනි මස පත්කළ) | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 08 | 05 | 05 |
| ආර්. එම්. ජේ. රත්නායක මහතා (2016 ජුනි මස ඉවත් වූ) | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 08 | 03 | 03 |
| බී. ජී. එස්. ගුණතිලක මහත්මිය (2016 ජූලි මස ඉවත් වූ) | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 08 | 03 | 03 |

සම්බන්ධිත පාර්ශව ගණුදෙනු නිරීක්ෂණ කමිටු රැස්වීම් - 2016

| නම | 2016/12/31 දිනට අධ්‍යක්ෂධූරයේ තත්ත්වය | පැවැත්වූ රැස්වීම් ගණන - 2016 | හිමිකම ලැබූ රැස්වීම් ගණන - 2016 | සහභාගී වූ රැස්වීම් ගණන - 2016 |
|---|---|---|---|---|
| ආර්. ජේ. සිල්වා මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ (කමිටුවේ සභාපති) | 01 | 01 | 01 |
| ආර්. එච්. මීවක්කල මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 01 | 01 | 0 |
| එම්. සුරේන්ද්‍රන් මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 01 | 01 | 01 |
| බී. ජී. එස්. ගුණතිලක මහත්මිය (2016 ජූලි මස ඉවත් වූ) | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 01 | 01 | 01 |
| පී. එස්. පුංචිහේවා මහතා | විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ | 01 | 01 | 01 |



ඔබගේ ජීවන රටාව
උසස් කිරීමට අවශ්‍ය
ඕනෑම දෙයකට අප
සතුව ගැලපෙන
නිෂ්පාදිතයක් ඇත

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

### 01. සාමාන්‍ය

1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතේ, 2007 අංක 07 දරන සමාගම් පනතේ, 1988 අංක 30 දරන බැංකු පනතේ සහ කොලඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගතකිරීමේ නීතී වල අවශ්‍යතාවයන් ඉෂ්ඨ කරමින් බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණකගේ වාර්තාව සමඟ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා සතුටින් කොටස් හිමියන්ට ඉදිරිපත් කරමි.

2017 මැයි මස 22 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර අනුමත කරන ලද අතර මෙම වාර්තාව නියාමන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලටත්, මනා ගිණුම්කරන පරිචයන්ටත් අනුකූලව සකස් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැදගත් යැයි සැලකු හා බැංකුවේ සහ කොටස් හිමියන්ගේ යහපත උදෙසා වන තොරතුරු අනාවරණය කර ඇත.

### 02. මූලික ක්‍රියාකාරකම්

සාමාලෝචනයට ලක්වන කාලසීමාව බැංකුව, නිවාස සහ නිවාස සංවර්ධන කටයුතු සඳහා මූල්‍යනය කිරීම වූ බැංකුවේ මූලික ව්‍යාපාර ක්‍රියාකාරකම් නියලුන අතර ඊට අමතරව බලපත්‍රලාභී විශේෂිත බැංකවක් ලෙස අනෙකුත් සාමාන්‍ය බැංකු සේවාවලද නියලෙන ලදී. සලකා බලන මූල්‍ය වර්ෂය තුළදී බැංකුවේ මූලික ව්‍යාපාර ක්‍රියාකාරකම් වල ස්වභාවයෙහි සැලකිය යුතු වෙනසක් සිදුවී නැත.

### 03. ව්‍යාපාර සමාලෝචනය

බැංකුවේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශනය වාර්තාවේ පිටු අංක 06 හි අන්තර්ගත කර ඇත.

සලකා බලන කාලසීමාව තුළ සමස්ථ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, සබඳතා වල තත්ත්වය හා සිදුවූ වැදගත් සිදුවීම් පිළිබඳ පිටු අංක 14 සිට 16 දක්වා ඇති සභාපතිතුමන්ගේ පණිවුඩය තුළ හා පිටු අංක 17 සිට 19 දක්වා ඇති සමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරීතුමන්ගේ සමාලෝචනය තුළ අන්තර්ගත කර ඇත.

මෙම වාර්තාව අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ අන්තර්ගත කොටසක් වේ.

### 04. අනාගත සංවර්ධනයන්

බැංකුවේ අනාගත සංවර්ධනයන් ඍෂ පනතට අනුව සහ නිවාස සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්ති තීරණ මත සිදුකරනු ලැබේ. වැඩිදුර තොරතුරු පිටු අංක 14 සිට 16 දක්වා ඇති සභාපතිතුමන්ගේ පණිවුඩය තුළ හා පිටු අංක 17 සිට 19 දක්වා ඇති සමාන්‍යාධිකාරි/ප්‍රධාන විධායක නිලධාරීතුමන්ගේ සමාලෝචනය තුළ අන්තර්ගත කර ඇත.

### 05. මූල්‍ය ප්‍රකාශන

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතා වලට අනුකූලව පිළියෙල කර ඇත. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කොටසක් වේ.

### 06. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදාගත් වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති වාර්ෂික වාර්තාවෙහි අංක 113 සිට 118 දක්වා පිටු වල අන්තර්ගත වේ. ස්කන්ධය වෙනස්වීම සඳහා බලපෑම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 111 හි අන්තර්ගත වේ.

### 07. විගණකවරුන්ගේ වාර්තාව

අදාළ මූල්‍ය වර්ෂය සඳහා ඍෂ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මත විගණනය බැංකුවේ විගණක වන ශ්‍රී ලංකා විගණකාධිපති විසින් සිදුකරන ලද අතර අදාළ විගණන වාර්තාව වාර්ෂික වාර්තාවෙහි 106 සිට 107 පිටු වල අන්තර්ගත වේ.

### 08. අඛණ්ඩ පැවැත්ම

පුරෝකථනය කල හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට ඍෂ බැංකුව සතුව සම්පත් පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කර සෑහීමකට පත්වී සිටී. එම නිසා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනමට අනුව එය සිදුකරනු ලැබේ.

### 09. ආදායම

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ ආදායම රු. මිලියන 5,928 කි. ආදායම පිළිබඳ විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශන වල සටහන් 01,03 සහ 04 හි දැක්වේ.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

### 10. ලාභ සහ විසර්ජනයන්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු වලට හා ආදායම් බදු වලට පෙර ලාභය රු මිලියන 848 ක් වූ අතර එකතුකළ අගය මත බදු වලට හා ආදායම් බදු වලට පසු ලාභය රු මිලියන 390 ක් විය.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 2016 | 2016 රු. මිලියන | 2015 රු. මිලියන |
|---|---|---|
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VAT) | 162 | 175 |
| බදු සඳහා ප්‍රතිපාදන | 270 | 294 |
| බදු පසු සාමාන්‍ය කටයුතු වලින් ලද ලාභය | 390 | 509 |
| ඉදිරියට ගෙන ආ රඳවාගත් ලාභය/(සමුච්චිත අලාභය) | 2,117 | 1,558 |
| විසර්ජනය සඳහා පවතින ලාභය | 2,549 | 2,091 |
| යෝජිත පළමු සහ අවසාන ලාභාංශ සඳහා විසර්ජනය | 49 | 39 |
| සංචිත අරමුදලට මාරු කිරීම | 59 | 76 |
| ඉදිරියට ගෙන ගිය රඳවාගත් ලාභය | 2,445 | 2,117 |

### 11. සංචිත

2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු සංචිත රු මිලියන 2,766 කි. ඊට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල පිටු අංක 111 හි වූ ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය තුල දැක්වේ.

### 12. පරිත්‍යාග

වර්ෂය තුළ බැංකුව විසින් රු. 49,800 ක පරිත්‍යාග සිදුකර ඇත.

### 13. ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුමට හා විශ්වාසයට අනුව රජයට හා සේවකයින්ට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට සෑහීමට පත්වෙයි.

### 14. බදුකරණය සඳහා ප්‍රතිපාදන

බැංකුවේ මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ බද්දට යටත් ආදායම මත 28% 2016 වර්ෂයේ ආදායම් බදු ලෙස සම්පාදනය කරන ලදී. එය වාර්ෂික වාර්තාවේ පිටු අංක 122 හි වූ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 09 හි අනාවරණය කර ඇත.

### 15. ලාභාංශ

බැංකුවට රු.බිලියන 05 ක අනිවාර්ය ප්‍රාග්ධන අවශ්‍යතාවයක් සම්පූර්ණ කිරීමට ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016 වර්ෂය සඳහා කිසිදු ලාභාංශයක් (අවසාන) නිර්දේශ නොකරනු ලැබේ.

### 16. දේපළ ,පිරියත හා උපකරණ, සින්නක්කර දේපළ

දේපළ, පිරියත හා උපකරණ මත ප්‍රාග්ධන වියදම් රු. මිලියන 125 ක් වන අතර ඒ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 17 හි දක්වා ඇත.

සින්නක්කර දේපළ පිළිබඳ විස්තර පිටු අංක 126 සිට 129 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 17 හි දක්වා ඇත.

### 17. සින්නක්කර දේපළ වල වෙළෙඳපොළ අගය

සින්නක්කර දේපළ වල වෙළෙඳපොළ අගය පිළිබඳ විස්තර පිටු අංක 129 හි වූ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 17.2 හි දක්වා ඇත.

### 18. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපිය යුතු හෝ අනාවරණය කළ යුතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදු වූ ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් නොමැත.

### 19. ප්‍රකාශිත ප්‍රාග්ධනය

2016 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය කොටස් 64,710,520 කින් සමන්විත බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 962 කි.

## 20. කොටස් පිළිබඳ තොරතුරු

කොටස් වලට අදාළ තොරතුරු වාර්ෂික වාර්තාවේ පිටු අංක 149 සිට 151 දක්වා අන්තර් ගත කර ඇත.

## 21. ණයකර

බැංකුව 2013 වර්ෂයේදී මුහුණත අගය රු. මිලියන 2,000 ක ලැයිස්තුගත කළ නිදහස් කල හැකි ආරක්ෂිත ණයකර නිකුත් කල අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට නොගෙවූ ණයකර පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ පිටු අංක 133 සිට 135 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන වල සටහන් 23 හි අන්තර් ගත වේ.
තවදුරටත් බැංකුව 2015 වර්ෂයේදී මුහුණත අගය රු. මිලියන 4,000 ක ලැයිස්තුගත කළ නිදහස් කල හැකි අනාරක්ෂිත ණයකර නිකුත් කල අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට නොගෙවූ ණයකර පිළිබඳ තොරතුරු වාර්ෂික වාර්තාවේ පිටු අංක 133 සිට 135 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන වල සටහන් 23 හි අන්තර් ගත වේ. බැංකුව මෙම ණයකර කොළඹ කොටස් වෙළෙඳපොලෙහි ප්‍රධාන පුවරුවෙහි ලැයිස්තුගත කර ඇත.

## 22. සියළුම පාර්ශවකරුවන්ට සමානාත්මතාවයෙන් සැලකීම

පාර්ශවකරුවන්ට නිකුත් කළ මුල් වගන්ති වලට අනුකූලව සියළුම පාර්ශවකරුවන්ට සමානාත්මතාවයෙන් සලකා ඇත.

## 23. අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්පූර්ණ ලැයිස්තුව සහ ඔවුන්ගේ සුදුසුකම් සහ අත්දැකීම් සඳහා පිටු අංක 90 සිට 95 දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩලය යන පරිච්ඡේදය පරිශීලනය කරන්න.

**සලකා බලන කාලච්ඡේදය තුළ HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම්**

1. එස්. එම්. ගෝඨාභය ජයරත්න මහතා
   - 2016 පෙබරවාරි මස 31 සිට බලපැවැත්වෙන පරිදි
2. ඩී. පී. විමලසේන මහතා
   - 2016 ජුනි මස 23 සිට බලපැවැත්වෙන පරිදි
3. ප්‍රසාද් ගල්හේන මහතා
   - 2016 ජුනි මස 30 සිට බලපැවැත්වෙන පරිදි
4. ලයනල් ජයසිංහ මහතා
   - 2016 ජුනි මස 30 සිට බලපැවැත්වෙන පරිදි
5. ආර්. ඒ. චූලානන්ද මහත්මිය
   - 2016 අගොස්තු මස 08 සිට බලපැවැත්වෙන පරිදි

**සලකා බලන කාලච්ඡේදය තුළ HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත් වීම්.**

1. ආර්. එම්. ජේ. රත්නායක මහතා
   - 2016 ජුනි මස සිට බලපැවැත්වෙන පරිදි
2. බී. ජී. එස්. ගුණතිලක මහත්මිය
   - 2015 ජුලි මස 26 දින සිට බලපැවැත්වෙන පරිදි

## 24. අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

බැංකුවේ පාලනය සහ කළමණාකරනය සඳහා සමස්ථ වගකීම හා වගවීම අධ්‍යක්ෂ මණ්ඩලය දරන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ හා කොළඹ කොටස් වෙළෙඳපොලෙහි සාංගමික යහපාලන නියමයන්ගේ අවශ්‍යතාවය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විවිධ ක්ෂේත්‍ර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු පත්කර ඇත.
ඉහත අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වල කාර්යයන්, වගකීම් සහ කාර්යසාධනය වාර්ෂික වාර්තාවේ පිටු අංක 50 සිට 58 දක්වා අන්තර්ගත කර ඇත.

## 25. අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

පිටු අංක 36 සිට 39 දක්වා ඇතුලත් අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු වල පැමිණීමේ වාර්තාව පරිශීලනය කරන්න.

## 26. මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

HDFC බැංකුවේ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපනය වන ආකාරයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිම සඳහා අධ්‍යක්ෂවරු වගකීම දරනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කොටසක් වන මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය පිටු අංක 104 සිට 105 දක්වා අන්තර්ගත වේ.

## 27. බැඳීම පිළිබඳ ලේඛනයෙහි ඇතුලත් කිරීම්.

2007 අංක 07 දරන සමාගම් පනතෙහි වගන්ති වල අවශ්‍යතාවය මත බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම් පිළිබඳ ලේඛනයක් පවත්වාගනී. බැංකුවේ අධ්‍යක්ෂවරු ඔවුන්ගේ බැඳීම පිළිබඳ අවශ්‍ය ප්‍රකාශයන් ලබාදිය යුතු අතර ඒවා බැඳීම පිළිබඳ ලේඛනයෙහි වාර්තා කර ඇත.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

එම අනාවරණයන් වලට අමතරව අධ්‍යක්ෂවරුන්ට බැංකුව සමඟ ගිවිසුම්ගත හෝ යෝජිත ගිවිසුමක් මගින් හෝ සෘජු හෝ වක්‍ර බැඳීමක් නොමැත. අධ්‍යක්ෂවරුන්ට බැඳීමක් ඇති කිසිදු කරුණක් සම්බන්ධ සාකච්ඡාවකට, අනුමත කිරීමකට හෝ ඡන්දයකට එම අධ්‍යක්ෂවරුන් සහභාගී වී නැත.

## 28. අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය පහත පරිදි වේ.

| | 31/12/2016 | 01/01/2016 |
|---|---|---|
| ආර්. ජේ. සිල්වා මහතා (සභාපති) | - | - |
| එම්. සුරේන්ද්‍රන් මහතා | 1000 | 1000 |
| ප්‍රසාද් ගල්හේන මහතා | 1000 | 1000 |
| ආර්. එච්. මීවක්කල මහතා | - | - |
| එල්. එස්. පලන්සූරිය මහතා | - | - |
| පී. එස්. පුංචිහේවා මහතා | - | - |
| එස්. එම්. ජී. ජයරත්න මහතා | - | - |
| ඩී. පී. විමලසේන මහතා | - | - |
| ලයනල් ජයසිංහ මහතා | 1000 | 1000 |
| ආර්. ඒ. චූලානන්ද මහත්මිය | - | - |

## 29. ගිවිසුම් සහ යෝජිත සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා HDFC බැංකුව ඇතිකරගත් ගිවිසුමකට හෝ යෝජිත ගිවිසුමකට සෘජු හෝ වක්‍ර බැඳීමක් අධ්‍යක්ෂවරුන්ට නොමැත. තොරතුරු වාර්ෂික වාර්තාවේ පිටු අංක 141 හි අන්තර්ගත වේ.

බැඳීමක් ඇති කිසියම් කරුණක් සම්බන්ධයෙන් ඡන්දයෙන් වැලකීම සහතික වීම සඳහා අධ්‍යක්ෂවරු ඔවුන්ගේ බැඳීම (ඇත්නම්) පිළිබඳ හෙළිදරව් කල යුතුය.

## 30. ණයකර වල අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

අධ්‍යක්ෂවරුන්ගේ ණයකර හිමිකාරීත්වය පහත දැක්වේ.

| 2016 දෙසැම්බර් 31 දිනට | 2016 | |
|---|---|---|
| | ණයකර ගණන | වටිනාකම |
| ආර්. ජේ. සිල්වා මහතා (සභාපති) | - | - |
| එම්. සුරේන්ද්‍රන් මහතා | - | - |
| ප්‍රසාද් ගල්හේන මහතා | - | - |
| ආර්. එච්. මීවක්කල මහතා | - | - |
| එල්. එස්. පලන්සූරිය මහතා | - | - |
| පී. එස්. පුංචිහේවා මහතා | - | - |
| එස්. එම්. ජී. ජයරත්න මහතා | - | - |
| ඩී. පී. විමලසේන මහතා | - | - |
| ලයනල් ජයසිංහ මහතා | - | - |
| ආර්. ඒ. චූලානන්ද මහත්මිය | - | - |
| එකතුව | - | - |

## 31. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කරගනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 24 " සම්බන්ධිත පාර්ශව ගණුදෙනු" ට අනුව සම්බන්ධිත පාර්ශව ගණුදෙනු ලෙස වර්ගීකරණය වන ගණුදෙනු ඇත්නම් ඒවාද අධ්‍යක්ෂවරුන් අනාවරණය කර ඇත. අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කොටසක් වන මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 32 හි අධ්‍යක්ෂවරුන් අනාවරණය කල ගණුදෙනු දක්වා ඇත. තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධිත පාර්ශව ගණුදෙනු කමිටු වාර්තාව පරිශීලනය කරන්න.

## 32. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිටු අංක 121 හි මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 07 හි අන්තර් ගත කර ඇත.

## 33. පරිසර සංරක්ෂණය

අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුමට අනුව බැංකුව අදාළ පරිසර නීති සහ නියාමනයන්ට අනුකූල වී ඇත. පරිසරයට හානිදායක කිසිදු ක්‍රියාකාරකමක බැංකුව නියලී නැත.

### 34. අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

බැංකුවේ අවදානම් කළමණාකරණ යනු නිරන්තර ක්‍රියාවලියකි. පිටු අංක 53 සිට 54 දක්වා අන්තර්ගත අවදානම් කළමණාකරන වාර්තාව පරිශීලනය කරන්න.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරන කමිටුව මගින් සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් අධ්‍යක්ෂවරු නිරන්තරව එම ක්‍රියාවලිය සමාලෝචනය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය නිතිපතා සමාලෝචනය කරනු ලබයි.

එම උප කමිටු දෙකම අවශ්‍ය නිර්දේශ සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරනු ලැබේ. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනුමට අනුව බැංකුවේ කටයුතු වඩාත් හොඳින් සිදුකිරීමට බැංකුව සතුව ශක්තිමත් අවදානම් කළමණාකරන සහ අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින බවට කොටස් හිමියන්ට සහතික වෙයි.

පිටු අංක 57 සිට 58 දක්වා වූ විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න.

### 35. සාංගමික යහපාලනය

පිටු අංක 35 හි වූ සාංගමික යහපාලනය සම්බන්ධයෙන් සභාපතිවරයාගේ ප්‍රකාශනය පරිශීලනය කරන්න. අදාළ සේවා මත ශ්‍රී ලංකා ප්‍රමිත (*SLSRS*) 4,400 යටතේ විගණකයින් නිකුත් කළ "සත්‍ය සොයගැනීම් වාර්තාවෙහි" සොයා ගැනීම් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කළ සාංගමික යහපාලනය නියෝගයේ අවශ්‍යතාවයට අනුව වෙනමම සාංගමික යහපාලනය මත වාර්තාවක් පිටු අංක 59 සිට 89 දක්වා අන්තර්ගත කර ඇත.

### 36. අදාළ නීති සහ නියාමනයන්ට අනුකූලතාවය

බැංකුවට අදාළ වන්නා වූ පාලන නීතීන් වල අදාළ අනුකූලතා තත්ත්වය ඒකාබද්ධ අවදානම් කමිටුවට හා කළමනාකරණයට වාර්තා කරන අනුකූලතා නිලධාරියෙක් බැංකුව පත්කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩව අදාළ නියාමන සහ සුපරීක්ෂණ ආයතන සමඟ තොරතුරු සන්නිවේදනය කරන අතර රටෙහි පවත්නා නීති සහ නියාමනයන්ට අනුව තීරණ ගෙන ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ දැනුමට අනුව බැංකුව අනාවරණය කල යුතු කිසිදු ක්ෂේත්‍රයක සෘජු හෝ වක්‍ර නීති හෝ නියාමනයන් උල්ලංඝනය කිරීමක් සිදු කර නැති අතර බැංකුවට ප්‍රමාණාත්මක මූල්‍ය බලපෑමක් ඇති කල හැකි සේවක කළමනාකරණයෙහි කිසිදු අකටයුත්තක් ද සිදු වී නැත.

### 37. විගණකයින් පත්කර ගැනීම

1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතට අනුව බැංකුවේ විගණක ලෙස විගණකාධිපතිවරයා අඛණ්ඩව කටයුතු කරනු ලබයි.

### 38. විගණකයිගේ පාරිශ්‍රමික සහ බැංකුව සමඟ ගිවිසුම්ගත බැඳීම

බැංකුව විසින් විගණන ගාස්තු ලෙස 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 507,600 ක් විගණකයින්ට ගෙවා ඇත. විගණකයින් සමඟ බැංකුවට වෙනත් බැඳීමක් හෝ ගිවිසුම්ගත බැඳීමක් නොමැත.

### 39. විගණන කමිටුව

විගණන කමිටුවේ සංයුතිය සහ ඔවුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 57 සිට 58 දක්වා අන්තර්ගත වේ.

### 40. රැස්වීම් නිවේදනය

බැංකුවේ 32 වෙනි වාර්ෂික මහා සභා රැස්වීම 2017 ජුනි මස 30 වන දින පෙ.ව 10.00 ට අංක 10, ඩීන්ස් පාර, හේජ් කෝට්, කොළඹ 10 හි පිහිටි බුකර් රික්‍රියේෂන් ප්‍රයිවට් ලිමිටඩ් හි පළමු මහලේ ගාර්ඩර්නියාර් ශාලාවේ දී පැවැත්වේ.

රැස්වීම් නිවේදනය වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 154 හි අන්තර් ගත කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුව අත්සන් කර ඇත.



**ආර්. ජේ. ද සිල්වා මහතා**
*සභාපති*



**කේ. ටී. ඩී. ඩී ද සිල්වා මහත්මිය**
*සමාගම් ලේකම්*

# අභ්‍යන්තර පාලනයන් මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය

මෙම වාර්තාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය මඟින් නිකුත් කළ මාර්ගෝපදේශ වලට පදනම්ව සකස් කර ඇති අතර 2007 අංක 12 දරන බැංකුකරණ පනතේ වගන්ති 3 (8) (ii) (b) නියමයට සමගාමීව නිකුත් කර ඇත.

බැංකුව තුළ ප්‍රමාණවත් හා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කොට පවත්වාගෙන යන බවට සහතික වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. කෙසේ වෙතත් එවැනි පද්ධතියක් මඟින් බැංකුවේ ව්‍යාපාරික අරමුණු සපුරාගැනීමට නොහැකි වීමේ අවදානම ඉවත් කිරීම වෙනුවට පිලිගත හැකි අවදානම් පරාමිතීන් තුල බැංකුවේ වැදගත් අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය සඳහා නිර්මාණය කර ඇත. ඒ අනුව අභ්‍යන්තර පාලන පද්ධති මඟින් ලබාදිය හැකිවන්නේ මූල්‍ය හා කළමනාකරණ වාර්තා වල ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශයන් සම්බන්ධයෙන් හෝ මූල්‍ය පාඩු හෝ වංචා සම්බන්ධයෙන් පූර්ණ ආරක්ෂණයක් නොව සාධාරණ මට්ටමක ආරක්ෂණයකි.

බැංකුවට මුහුණ දීමට සිදුවන ප්‍රමාණාත්මක අවදානම් හඳුනාගැනීමේ, ඇගයීමේ හා කළමනාකරණය කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇති අතර ව්‍යාපාර පරිසරයෙහි සහ නියාමන අවශ්‍යතාවල හා වෙනත් මාර්ගෝපදේශවල යම් වෙනසක් ඇති වන අවස්ථාවන් වලදී අභ්‍යන්තර පාලන පද්ධති උසස් කිරීම එම ක්‍රියාවලියේ කොටසකි. මෙම ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය නිතිපති සමාලෝචනය කරන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය මඟින් නිකුත් කළ අභ්‍යන්තර පාලනයන් මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා වූ මාර්ගෝපදේශ වලට අනුකූල වේ.

### ප්‍රමාණවත් හා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කොට ඇති බව සහතික කිරීමට යොදාගත් මූලික ක්‍රියාපටිපාටි.

- අනුමත කරන ලද සාංගමික අරමුණු, උපායමාර්ගයන්, ප්‍රතිපත්ති සහ ව්‍යාපාර දිශානතීන් වලට අනුකූලව බැංකුවේ මෙහෙයුම් කටයුතු සිදුවන බවට සහතික විම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය ලබාදීමට අවශ්‍ය විෂයපථයන් සහ ශ්‍රිතයන් සහිතව විගණන කමිටුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, විධායක තොරතුරු තාක්‍ෂණ උපායමාර්ග කමිටුව, මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව, අයකරගැනීම් කමිටුව සහ සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සමාලෝචන කමිටුව වැනි අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු ස්ථාපිත කිරීම.
- මීට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ මෙහෙයුම් කටයුතු සමීපව නිරීක්ෂණය සඳහා විශේෂ කාර්ය බලකාය, සාංගමික සැලසුම් සමාලෝචන කමිටුව සහ අයවැය ප්‍රතිශංස්කරණ වැනි විශේෂ සමාලෝචන කමිටු වර්ෂය තුළදී පිහිටුවා ඇත.
- බැංකුවේ මූලික ව්‍යාපාර මෙහෙයුම් වල ඵලදායී කළමනාකරණය සහ සුපරීක්‍ෂණය සහතික කිරීම සඳහා අදාළ බලතල සහිතව වත්කම් හා වගකීම් කමිටුව, ණය කමිටුව, ආයෝජන කමිටුව හා තොරතුරු තාක්‍ෂණ මෙහෙයුම් කමිටුව වැනි විවිධ කළමනාකරණ කමිටු ස්ථාපිත කොට ඇත.
- අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් බැංකුවේ සමස්ථ ව්‍යාපාර උපායමාර්ග සහ වැදගත් ප්‍රතිපත්ති අනුමත කිරීම සහ සමාලෝචනය සිදුකරන අතර බැංකුව තුළ ඇති මූලික අවදානම් අවබෝධ කරගැනීමත් එම අවදානම් හඳුනාගැනීමට, මිනුම්කිරීමට, නිරීක්‍ෂණයට සහ පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය මෙහෙයවීම සිදුකරයි.
- අභ්‍යන්තර පාලන පද්ධති වලට සහ අදාළ නීති සහ නියාමන වලට අනුකූලතාවය සහතික කරමින් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇතුලත් මෙහෙයුම් අත්පොත්, මාර්ගෝපදේශ හා නියෝග බැංකුව නිකුත් කර ඇත.
- සේවකයින්ට ඔවුන්ගේ වගකීම් ඉෂ්ඨ කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණුවත් හා දක්‍ෂතාවක් ඇති බව සහතික කිරීම සඳහා සේවකයින් බඳවා ගැනීමේ හා ඉවත් කිරීමේ නිසි මාර්ගෙ ්පදේශ, සේවකයින් සඳහා විධිමත් පුහුණු වැඩසටහන්, වාර්ෂික කාර්යඵල ඇගයීම් සහ වෙනත් ක්‍රියාපාටිපාටි පිහිටුවා ඇත. සලකා බලන මූල්‍ය වර්ෂය තුළදී බැංකුවේ විනය සංග්‍රහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කොට අනුමත කර ඇත.
- අභ්‍යන්තර විගණන අංශය මඟින් අභ්‍යන්තර පාලන පද්ධති වල කාර්යක්‍ෂමතාවය සහ ඵලදායීතාවය මත ස්වාධීන සහතික වීමක් ලබාදෙන අතර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමඟ අනුකූලතාවය නිරීක්‍ෂණය කිරීම සහ අනුකූල නොවීම් වලට අදාළ සොයාගැනීම් වාර්තා කිරීම. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අනුමත කළ වාර්ෂික විගණන සැලැස්මට අනුව සියළුම ශාඛා සහ දෙපාර්තමේන්තු වල විගණන සිදුකරනු ලැබේ. ශාඛා සහ දෙපාර්තමේන්තු වල විගණන සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ තක්සේරු කළ අවදානම් මට්ටම් මඟිනි. අභ්‍යන්තර විගණන වල සොයාගැනීම් රැස්වීම් වලදී සමාලෝචනය කිරීම සඳහා විගණන කමිටුවට යොමු කරනු ලැබේ.

## තහවුරු කිරීම

ඉහත කී ක්‍රියාපටිපාටි පදනම් කරගෙන, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසවන්තභාවය සම්බන්ධයෙන් සාධාරණ සහතික වීමක් සැපයීම සඳහා බවත් සහ බාහිර කටයුතු සඳහා මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත වලට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතා වලට අනුව බවත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

## බාහිර විගණකවරුන්ගේ ප්‍රකාශනය පිළිබඳ සමාලෝචනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාව තුල ඇතුලත් කරන ලද අභ්‍යන්තර පාලනයන් මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය බාහිර විගණකවරුන් සමාලෝචනය කර ඇති අතර බැංකුවේ මූල්‍ය වාර්තාකරණය වෙනුවෙන් වූ අභ්‍යන්තර පාලන පද්ධති වල සැකැස්ම හා ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය යොදා ගත් ක්‍රියාපටිපාටි පිළිබඳ තම වැටහීමට අනුව එකඟවිය නොහැකි කිසිවක් ඇතැයි තමන්ට විශ්වාස කිරීමට හේතුවන කිසිවක් තම අවධානයට යොමු වී නැතැයි අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කොට ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කළ ඔවුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු අංක 48 - 49 දක්වා අන්තර්ගත කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි

**උපාලි හෙට්ටිආරච්චි මහතා**
*සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී*

**එම් සුරේන්ද්‍රන් මහතා**
*සභාපති - විගණන කමිටුව*

**ආර්. ජේ ද සිල්වා මහතා**
*සභාපති*

කොළඹදී
2017 මැයි මස 24

# අභ්‍යන්තර පාලන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ සහතිකවීමේ වාර්තාව

මෙම සහතික වාර්තාව බැංකුව විසින් සිංහලට පරිවර්තනය කරන ලදී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } BAF/01/C/HDFCB/IC/2016/14 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதි / Date } ෴ May 2017

සභාපති
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය මත අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදෙන විගණකාධිපති සහතික වාර්තාව**

## හැඳින්වීම

මෙම වාර්තාව මඟින්, 2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවෙහි ඇතුලත් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය ("ප්‍රකාශනය") පිළිබඳ සහතික වීමක් ලබාදෙනු ලැබේ.

## කළමනාකරණයේ වගකීම

2007 අංක 11 බැංකු පනත් නියමයෙහි වගන්ති 3(8)(II)(ආ) සමඟ අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කළ "අභ්‍යන්තර පාලනයන් මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා මාර්ගෝපදේශයට" අනුකූලව ප්‍රකාශනය සකස් කිරීමට හා ඉදිරිපත් කිරීමට කළමනාකරණය වගකීමෙන් බැඳේ.

## සහතිකවීම් මැදිහත්වීම මත ශ්‍රී ලංකා ප්‍රමිත 3050 (SLSAE 3050) සමඟ මාගේ වගකීම සහ අනුකූලතාවය

ක්‍රියාවට නැංවූ කාර්යයන් සම්බන්ධයෙන් වූ ප්‍රකාශනය මත අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාවක් නිකුත් කිරීම මාගේ වගකීමයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය විසින් නිකුත් කළ සහතිකවීම් මැදිහත්වීම මත ශ්‍රී ලංකා ප්‍රමිත 3050 - අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය මත බැංකුව සඳහා සහතිකවීම් වාර්තාව යන ප්‍රමිතියට අනුව මාගේ මැදිහත්වීම සිදුකරන ලදී.

## ක්‍රියාවට නැංවූ කාර්යය සාරාංශය

අධ්‍යක්ෂවරුන් සකස් කළ හෝ අධ්‍යක්ෂවරු වෙනුවෙන් සකස් කළ ලිපිලේඛන වල සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සාමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරු ක්‍රමවේද යොදාගෙන තිබීම ගැලපෙන ලෙස පිළිබිඹු කිරීම යන දෙයාකරයේම ආධාරයෙන් ප්‍රකාශනය සිදුකර ඇති බවට තක්සේරු කිරීම සඳහා මාගේ තක්සේරුව සිදුකරන ලදී.

මෙම අරමුණ ඉටු කරගැනීම සඳහා පහත ක්‍රමවේද ක්‍රියාවට නැංවීම තුළින් අදාළ සාක්ෂි ලබාග න්නා ලදී.

- සකස් කිරීමට අදහස් කරන ප්‍රකාශනයට උපකාරීවන අධ්‍යක්ෂවරුන් සකස් කළ හෝ අධ්‍යක්ෂවරු වෙනුවෙන් සකස් කළ ලිපිලේඛන සමාලෝචනය කරන ලදී.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

- අධ්‍යක්ෂ මණ්ඩල, අදාළ මණ්ඩල කමිටු සහ කළමනාකරණ කමිටු රැස්වීම් යෝජනා සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සමාලෝචනයට ලක්වන වර්ෂය ආවරණය වන බවට සහ ඕනෑම පැන නඟින වැදගත් කරුණු හඳුනාගනීමට ප්‍රමාණවත් ක්‍රමවේද පවතින බවට සලකා බලන ලදී.

බැංකුවේ පුද්ගලයින්ගේ විමසීම් වලට සහ අධ්‍යක්ෂ මණ්ඩලය යොදාගත් ක්‍රමවේද වලට ආධාර වූ ලිපිලේඛන නියදි ලෙස පැවතීම නිසා ක්‍රියාවට නැංවූ ක්‍රමවේද මූලික වශයෙන් සීමාකාරී විය.

ප්‍රකාශනය මඟින් බැංකුවේ සියලුම අවදානම් සහ පාලනයන් ආවරණය වූයේද හෝ බැංකුවේ අවදානම් සහ පාලන පද්ධති වල ඵලදායීතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට SLSAE 3050 මඟින් මා හට පැවරී නැත. එමෙන්ම වාර්ෂික වාර්තාවෙහි අනාවරණය කළ ඕනෑම වැදගත් ගැටළුවක ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන පද්ධති අංගයක් සමඟ ගණුදෙනු කිරීමට විස්තර කළ ක්‍රමවේද ගැටළුවට පිළියමක් වේද යන්න පිළිබඳව සලකා බැලීමට පවා SLSAE 3050 අනුව මා හට පැවරී නැත.

## නිගමනය

ක්‍රියාවට නැංවූ ක්‍රමවේද වලට අනුව, බැංකුවේ අභ්‍යන්තර පාලන නිර්මාණය කිරීම සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය යොදාගෙන ඇති ක්‍රමවේද පිළිබඳ මාගේ තේරුම් ගැනීම සමඟ වාර්ෂික වාර්තාවේ ඇතුලත් ප්‍රකාශනයෙහි නොගැලපීමක් ඇති බවට විශ්වාස කිරීමට හේතුවන කිසිවක් මාගේ අවධානයට යොමුවී නැත.

එච් එම් ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්තා

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව**

සමස්ථ සංවිධානයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය සමඟ බැදී ඇති වැදගත්ම අංගය මානව සම්පත බවට කමිටුව දැනුවත් වී ඇත. ඒ අනුව සේවක දක්ෂතා තක්සේරු, ධාරිතා ගොඩනැගීම්/ පුහුණු/සංවර්ධනය සහ වරප්‍රසාද හරහා මානව සම්පත් සංවර්ධනය බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය තුළ මූලික කොටස් ලෙස අඛණ්ඩව සිදුකරනු ඇත.

එයට අමතරව, සේවක විනය, බාහිර, අභ්‍යන්තර පාරිභෝගිකයින් හා තෙවන පාර්ශවයන් සමඟ සබඳතා කළමනාකරණය, නිවැරැදි අයදුම්කරුවන් බඳවාගැනීම, සේවකයින් රඳවාගැනීම සහ අනුප්‍රාප්තික සැලසුම් වැනි දෑ බැංකුවේ මානව සම්පත් හා ඒකාබද්ධ වූ අනෙක් වැදගත් සාධක ලෙස සලකා ඇත.

බැංකුවේ නව හර බැංකුකරණ පද්ධතිය ස්ථාපිත කිරීම හරහා එහි තොරතුරු තාක්‍ෂණ පද්ධති යාවත්කාලීන කිරීම නිසා 2016 මූල්‍ය වර්ෂය බැංකුවට අභියෝගාත්මක වර්ෂයක් විය. නව යාවත්කාලීන පද්ධති සමඟ පාර්ශවකරුවන්ට සේවා සැපයීමට අවශ්‍ය නිවැරැදි දැනුම, දක්ෂතා හා හැකියාවන් සේවකයින් සතු බව සහතික කිරීම සඳහා පුහුණුව හා සංවර්ධනයේදී වැදගත්කම කමිටුව මඟින් බොහෝ අවස්ථාවලදී පැහැදිලි කර ඇත. ඒ අනුව බැංකුව විසින් සේවකයින් ඇගයීමේ කාල පදනම සහ අභියෝගාත්මක පරිසරයක සේවය කිරීමට ඇති ප්‍රවීණත්ව මට්ටම තක්සේරු කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබේ. ඉහත කී ඇගයීම් අරමුණු සඳහා අවෘත/විවෘත ග්‍රන්ථ විභාග, ඉදිරිපත් කිරීම් හා සම්මුඛ සාකච්ඡා සහ HDFC බැංකුවේ සේවක කාණ්ඩ සහ අවශ්‍යතාවය සලකා බලමින් ඒවාට ගැලපෙන වෙනත් ක්‍රම ආදිය වැනි විවිධ ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

නව හර බැංකුකරණ පද්ධති ව්‍යාපෘතිය මත අපේක්ෂා කරන දක්ෂතා මට්ටම් වලට අමතරව කමිටුව මඟින් 2016 පුහුණු දින දර්ශනය යොදාගැනීම තුළින් සියළුම විධිමත් පුහුණු අවශ්‍යතා කලින්ම ආවරණය කරන ලදී. එම නිසා සලකා බලන මූල්‍ය වර්ෂය තුළදී සේවකයින්ගේ රැකියා අවශ්‍යතාවය මත විවිධ පුහුණු වැඩසටහන් ලබාදෙන ලදී. බාහිර පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලට සේවකයින් නම් කිරීම වැනි විධිමත් සේවක පුහුණු ක්‍රම වලට අමතරව රැකියාව තුළින් ලබාදෙන පුහුණු වැඩසටහන් පුහුණු දින දර්ශනයෙහි අත්‍යවශ්‍ය අංගයක් බවට කමිටුව දැනුවත් වී ඇත.

සේවකයින්ගේ වෘත්තීය හැකියාවන් තවදුරටත් ඉහළ දැමීම සඳහා දේශීය පුහුණු වැඩසටහන් වලට අමතරව විදේශීය පුහුණු අවස්ථාවන්ද සේවකයින්ට හා කළමනාකරණයට ලබාදේ.

මූල්‍ය වර්ෂය තුළදී බැංකුවේ ප්‍රතිලාභ ප්‍රමිතියට අවශ්‍ය සංශෝධනය කරමින් සේවකයින්ට අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ලබාගැනීම සඳහා ප්‍රතිලාභ අවස්ථා ලබා දී ඇත.

සලකා බලන මූල්‍ය වර්ෂය තුළදී කාර්යඵල හොඳින් පෙන්නුම් කර ඇති සේවකයින් හදුනාගැනීම සහ ප්‍රතිලාභ ලබාදීමේ ප්‍රතිපත්තියට දක්ෂතා පදනම මත උසස් වීම් ඇතුලත් කරමින් සංශෝධනය කර ඇත. බැංකුවේ අනාගත ප්‍රතිලාභ ලබාදීමේදී සලකා බලන ප්‍රධාන සාධකය සේවක කාර්යඵල බව කමිටුව දැනුම් දී ඇත. නිවැරැදි හඳුනාගැනීමකට සුදුසුකම් ලබන දක්ෂතා ඇති සේවකයින්ට වරප්‍රසාද ලබාදීමේ වැදගත්කමද කමිටුව හඳුනාගෙන ඇති අතර 2016 වර්ෂය තුළදී ලබාදුන් සියළුම උසස් වීම් සහ ප්‍රතිලාභ දක්ෂතා පදනම මත බවට කමිටුව සහතික කරනු ලැබේ.

ඊට අමතරව විනයානුකූල සංස්කෘතියක් පිහිටුවීම, විගණනය ශක්තිමත් කිරීම සහ අවදානම් ඇගයීම් ශ්‍රිතයන්හි වැදගත්කමද කමිටුව ඉතා ඉහළින් සලකා බලනු ලැබේ. ඒ අනුව බැංකුව නව විනය සංග්‍රහයක් පිහිටු වූ අතර විගණන සහ අවදානම් අංශ තවදුරටත් ශක්තිමත් කරන ලදී.

මානව සම්පත් කළමනාකරණ උපදේශකයකු ලෙස පළපුරුද්දක් සහිත විශේෂඥයකුගේ සේවය ලබාගැනීම සඳහා කමිටුව ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එම උපදේශකයාගේ උපදෙස් මත සමස්ථ මානව සම්පත් අංශයේ කටයුතු නිසි පරිදි සිදුවනු ඇත. මෙම උපදේශකවරයා බඳවා ගනු ලැබුයේ කාර්යක්ෂමතා/ඵලදායීතා පරිශ්‍රම සහ ප්‍රාග්ධන වෘද්ධි සැලැස්මට අනුව බඳවා ගත් භාණ්ඩාගාර හා සාංගමික ණය ක්ෂේත්‍ර ශක්තිමත් කිරීම සඳහා බඳවා ගත් උපදේශකවරු දෙදෙනාට අමතරවය.

තවදුරටත් 2007 වර්ෂයේදී ආරම්භ කළ Palm Top මෙහෙයුම් කටයුතු වල ආරම්භයේ සිටම එහි ලාභදායීත්වය සම්බන්ධයෙන් ඇතිවූ ගැටළු කිහිපයක් විසඳීම සඳහා ක්‍රමානුකූල අධ්‍යයනයක් කමිටුව විසින් සිදුකර ඇති අතර එහි මෙහෙයුම් සඳහා ඉදිරි කටයුතු තීරණය කිරීම සාර්ථක වී ඇත.

ඊට අමතරව, කළමනාකරණය කලින් තීරණය කළ සාංගමික සහ පුද්ගල ඉලක්ක වලට සාර්ථකව දායක වීම නිසා Palm Top පුහුණුව ලබන්නන් 14 දෙනෙකු බඳවා ගැනීමටද කමිටුව නිර්දේශ කරන ලදී. Palm Top යනු බැංකුවේ ප්‍රධාන තැන්පතු රැස්කිරීමේ අංශයයි.

ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වූ බැංකුවේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය බැංකුවට දක්ෂතා ඇති අය ආකර්ෂණය කරගැනීමට සහ රඳවා ගැනීමට ප්‍රමාණාත්මක බවට කමිටුව සහතික වී ඇත. සෑම ප්‍රධාන කළමණාකාර පිරිස් සාමාජිකයෙකු සඳහා වූ වාර්ෂික අයවැය ඉලක්ක සහ වෙනත් කාර්යඵල ඉලක්ක මත පදනම්ව එම පිරිසි ඇගයීමද කමිටුව මඟින් සිදුකරනු ලබයි.

යොමු කොන්දේසි වලට සහ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කළ කරුණු වලට අනුව බැංකුවේ මානව සම්පත් කළමනාකරණයට බලපෑම් කරන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවට බලය ලැබී ඇත.

සාමාන්‍යයෙන් කමිටුව විසින් සේවකයින්ට අදාළ වැදගත් මානව සම්පත් ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග මෙන්ම කොන්දේසි හා වගන්ති සමාලෝචනය කරනු ලැබේ. කමිටුව මඟින් ප්‍රධාන කළමනාකරුවන්ගේ සහ අනෙක් සේවකයින්ගේ වාර්ෂික වැටුප් ඉහළ දැමීම් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරනු ලැබේ.

අවසාන වශයෙන් "ශිෂ්ට සම්පන්න රැකියාව" යන්නට අදාළවූ 08 වෙනි තිරසාරත්ව සංවර්ධන ඉලක්ක වලට සමගාමීව බැංකුවේ මානව සම්පත් පරිචයන්, ප්‍රතිපත්ති සහ ක්‍රමවේද අඛණ්ඩව උසස් කරන බව කමිටුව වාර්තා කරන අතර HDFC බැංකුවට අදාළ සාංගමික යහපාලන ව්‍යුහයට නිසි හඳුනාගැනීමක් සහිතව HDFC බැංකුව තුළ විනයානුකූල සංස්කෘතියක් ඇතිකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට උපරිය සහයෝගය ලබාදෙන බවට කමිටුව සහතික වන ලදී.

කමිටුවේ සංයුතිය සහ රාජකාරි ඉටු කරන ආකාරය.
2016 වර්ෂය තුළදී කමිටුව 04 වතාවක් රැස්වී ඇත. කමිටුවේ සාමාජිකත්වය සහ රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ පිටු අංක 37 හි අන්තර්ගත කර ඇත.

**එම් සුරේන්ද්‍රන් මහතා**
*සභාපති*

**දර්ශනී ද සිල්වා මහත්මිය**
*සමාගම් ලේකම්*

කොළඹදී
2017 මැයි මස 24 දින

# අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්තා

## අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

HDFC බැංකුවේ කොටස්හිමි අධ්‍යක්ෂවරු පත්කිරීම් වල නාමයෝජනා වලට අදාළව අවශ්‍ය නිර්දේශ කිරීම් සිදුකිරීම සඳහා වූ අධිකාරිය සහ බලතල නාමයෝජනා කමිටුවට හිමි වී ඇත.

පත්වනු ලබන අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව, අදාළ නියාමන අවශ්‍යතා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ කලානුරූපි අවශ්‍යතාව සමඟ අනුකූල වන පරිදි අයදුම්කරුවන් හඳුනාගැනීමත් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ක්‍රමවේදයකට නම් කරනු ලබන අයගේ අදාළ පළපුරුද්ද, දක්ෂතාවය, විශේෂඥතාවයන් හා හැකියාවන් පිළිබඳ සලකා බැලීමට කමිටුව බැඳී සිටී.

ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරාගැනීම/පත්කිරීමට අදාළව නාමයෝජනා සහ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු හරහා ගැලපෙන ප්‍රතිපත්ති හා ක්‍රම වේද යොදාගැනීමටද බලය සහ අධිකාරිය කමිටුවට ලැබී ඇත.

ඊට අමතරව අවශ්‍යතාව මත පහත කාර්යයන් ඉටු කිරීමට කමිටුව වගකීමෙන් බැඳේ.

1. නව අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරාගැනීමට සහ පත්කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.
2. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ඉෂ්ඨ කිරීම සලකා බලා කාර්යඵලය හා දැක්වූ දායකත්වයද සැලකිල්ලට ගෙන දැනට සිටින අධ්‍යක්ෂවරු නැවත පත්කිරීම හෝ නොකිරීම නිර්දේශ කිරීම.
3. ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වශයෙන් පත්වීමට සහ උසස් වීමට සුදුසුකම් ලැබීමට සලකා බලන සුදුසුකම්, පළපුරුද්ද වැනි නිසි කරුණු නිර්ණය කිරීම.
4. ව්‍යවස්ථාවේ සහ ශ්‍රී ලංකා මහ බැංකු නියමයන් තුළ විශේෂයෙන් සඳහන් කළ කරුණු වලට අනුව තම රාජකාරී සිදුකිරීමට ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් යෝග්‍යතාවය සපුරන පුද්ගලයින් බවට සහතික වීම.
5. අමතරව අවශ්‍ය විශේෂඥතාවයන් සහ විශ්‍රාම යන අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අනුප්‍රාප්ති සැලසුම් වැනි දෑ කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම.
6. කමිටුවේ සභාපතීත්වය ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් දැරිය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරුගේ බහුතරයකින් සමන්විත වීම වඩාත් යෝග්‍ය වේ.

ඒ අනුව ඉහත ප්‍රතිපත්ති හා ක්‍රමවේද වල නිර්ණය කරන ලද ආකාරයට කමිටුවේ රාජකාරි ඉෂ්ඨ කරනු ලැබේ. ඊට අමතරව අවශ්‍යතාවය මත පවතින ප්‍රතිපත්ති සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා මානව සම්පත් උපදේශකවරයාට කාර්යය පවරා ඇත.

## කමිටුවේ සංයුතිය සහ රාජකාරි ඉටු කරන ආකාරය.

2016 වර්ෂය තුලදී කමිටුව එක් (01) වතාවක් රැස්වී ඇත. කමිටුවේ සාමාජිකත්වය සහ රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ පිටු අංක 37 හි අන්තර්ගත කර ඇත.



**ආර් ජේ සිල්වා මහතා**
සභාපති



**දර්ශනී ද සිල්වා මහත්මිය**
සමාගම් ලේකම්

කොළඹදී
2017 මැයි මස 24 දින

## අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

අවදානම් කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ව්‍යවස්ථාපිත කමිටුවකි. ණය, වෙළෙඳපොළ, මෙහෙයුම් සහ අනෙකුත් අවදානම් කළමනාකරණය කිරීම සඳහා භාවිතා කළ වැදගත් ප්‍රතිපත්ති හා ක්‍රම වේද ඇතුළත් HDFC බැංකුවේ අවදානම් කළමනාකරණ විෂය පථය නිරීක්ෂණය කිරීමට අදාළ වගකීම් නිසියාකාරව සපුරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම කමිටුවේ අරමුණයි. කමිටුව මඟින් බැංකුවේ ප්‍රධාන කටයුතු සඳහා අරමුදල් සම්පාදනයේදී පැනනගින ද්‍රවශීලතා අවදානම් මෙන්ම ප්‍රාග්ධන කළමනාකරණය හා බැඳි අවදානම් වලට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමවේද නිරීක්ෂණය කිරීම සිදුකරයි.

වඩා උසස් තොරතුරු ආරක්ෂණ කළමනාකරණයක් සහ ක්‍රියාකාරි පද්ධතියක් සහතික කරමින් නව හර බැංකුකරණ පද්ධතිය ස්ථාපිත කිරීමේදී විය හැකි අවදානම් අවම කිරීමට ගැලපෙන උපායමාර්ග සහ ක්‍රියාමාර්ග බැංකුව ක්‍රියාවට නංවන ලදී. 2016 වර්ෂය තුළදී ගැලපෙන අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවන අතරතුර අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සැපිරීමේ උපායමාර්ග අවදානම්, තැන්පතු සහ ණය රැස්කිරීමේ අවදානම් කෙරෙහි අවදානය යොමු කරන ලදී. අවදානම් රුචිකත්ව විෂය පථයන්, ආතති පරීක්ෂණ ආකෘති සහ අවදානම් දැරීම් මට්ටම් වැනි දෑ ප්‍රතිනිර්ණය කිරීම මඟින් ශක්තිමත් අවදානම් කළමනාකරණ පරිචයන් ස්ථාපිත කිරීමට කමිටුව සහතික වී ඇත.

අවදානම් කළමනාකරණ කමිටුවේ විෂය පථය

a) ගැලපෙන අවදානම් දර්ශකයන් සහ ලබාගත් කළමනාකරණ තොරතුරු යොදාගනිමින් ණය, වෙළෙඳපොළ, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් ඇගයීම.
b) කළමනාකරණ මට්ටම් කමිටු වල ප්‍රමාණාත්මකභාවය සහ සඵලදායීත්වය සමාලෝචනය කිරීම.
c) බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන හා සුපරීක්ෂණ අවශ්‍යතා වලට අනුව විචක්ෂණ මට්ටම් ඉක්මවා ඇති විශේෂිත අවදානම් පාලනය කිරීම සඳහා අවදානම් අවම කිරීමේ උපායන් සහ යාන්ත්‍රණ යොදා ගැනීම. අනුකූලතා අවශ්‍යතා හා අදාළ නීති, නියාමකයින්ගේ නියෝග සහ මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් හා අනුමත ප්‍රතිපත්ති වලට බැංකුව අනුකූල බවට කමිටුව සහතික වීම.
d) විශේෂිත අවදානම් හඳුනාගැනීමට නොහැකි වූ වගකිය යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සහ කමිටුව මඟින් නිර්දේශ කල හා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂවරයා නියෝග කල අකාරයට අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.
e) නියමිත කාර්යයන් ඉෂ්ඨ කල හැකි අනුකූලතා නිලධාරිවරයෙකු පත්කිරීම මඟින් බැංකුවේ සියළුම කාර්යයන්ට අදාළ බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා අනුකූලතා ශ්‍රිතයක් ස්ථාපිත කිරීම.
f) ණය අවදානම්, වෙළෙඳපොළ අවදානම්, මෙහෙයුම් අවදානම් සහ උපායමාර්ගික අවදානම් ආවරණය වන පරිදි සමස්ථ අවදානම් ඇගයීම් විෂය පථයක් ස්ථාපිත කිරීම.
g) නියාමන තත්ත්වයන්ට අදාළව අනුකූලතා නිලධාරී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ලබාදෙන වාර්තා සමාලෝචනය කිරීම. නව නියාමනයන් සහ ඒවාට බැංකුවේ අනුකූලතාවය මෙන්ම අනුකූලතා ශ්‍රිතයට අදාළ සියළු කාරණා සමාලෝචනය.
h) අනුකූලතා නිලධාරිවරයෙක් පත්කිරීම සහ අනුකූලතා ශ්‍රිතයට අදාළ මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය සහ සඵලදායීත්වය සහතික වීම.
i) සමහර අවස්ථාවන්හිදී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අවදානම් ඇතිවන කටයුතු වල නිරත වූ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නියෝග දීම.

බැංකු සුපරීක්ෂණය අධ්‍යක්ෂවරයා සහ මුදල් මණ්ඩලය පෙන්වා දුන් සහ බැංකුව ගනු ලැබූ ක්‍රියාමාර්ග සමඟ මහජනයාට ප්‍රසිද්ධ කල යුතු මහ බැංකු නියෝග සඳහා අනුකූල නොවීම් හෝ බැංකුවේ අවදානම් කළමනාකරණය සම්බන්ධ කිසිදු අතපසුවීමක් හෝ නියාමන හා සුපරීක්ෂණ සැලකිල්ලක් නොමැති බවට කමිටුව සහතික වේ.

## කමිටුවේ සංයුතිය සහ රාජකාරි ඉටු කරන ආකාරය.

කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් පත්කරනු ලැබේ. වර්ෂය තුලදී කමිටුව දෙවතාවක් (02) රැස්වී ඇත. එසේ තිබියදීත් ප්‍රමාණවත් අවදානම් ප්‍රතිපත්ති, ක්‍රමවේද හා පරිචයන් ජ්‍යෝෂ්ඨ කළමනාකාරීත්වය මඟින් ස්ථාපිත කර ඇති බවට කමිටුව සහතික වේ. නැඟී එන අවදානම් මත අවදානම් අංශය මඟින් නිකුත් කළ අවදානම් අනතුරු ඇඟවීම් වලට අමතරව කාර්තු පදනමින් බැංකුවේ සමස්ථ අවදානම් තත්ත්වය තක්සේරු කිරීමට කමිටුව සඳහා සමස්ථ අවදානම් පාලක පුවරුවක් පවතී.

# අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්තා

කමිටුවේ සාමාජිකත්වය සහ රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ පිටු අංක 38 හි අන්තර්ගත කර ඇත. ආරාධනය මත උපාලි හෙට්ටිආරච්චි මහතා (ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී), ඩී වී පතිරණ මහතා (ප්‍රධාන මූල්‍ය නිලධාරි), ජේ ජේ අතුකෝරාල මහතා (ප්‍රධාන අභ්‍යන්තර විගණක), සී ආර් පී බාලසූරිය මහතා (සහකාර සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාර), ඩබ් ඩබ් ඩී එස් සී පෙරේරා මහත්මිය (සහකාර සාමාන්‍යාධිකාරී - නීති), එච් එස් ගුණතිලක මහත්මිය (සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාපාර සංවර්ධන සහ අලෙවිකරණ), ඩී එම් ඩී එම් කේ දිසානායක මහතා (ප්‍රධාන කළමනාකරු - ණය), කේ ආර් එම් ඒ බණ්ඩාර මහතා (අනුකූලතා නිලධාරී), අයි නිශාන්ත මහතා (අවදානම් නිලධාරී) යන අය සහභාගී වී ඇත.



**එම් සුරේන්ද්‍රන් මහතා**
*සභාපති*



**දර්ශනීද ද සිල්වා මහත්මිය**
*සමාගම් ලේකම්*

කොළඹදී
2017 මැයි මස 24 දින

## අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශව ගණුදෙනු නිරීක්ෂණ කමිටුව

ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව වැනි ආයතන නිර්ණය කර ඇති ආකාරයට බැංකුවට අදාළ වන්නා වූ සම්බන්ධිත පාර්ශව ගණුදෙනු පාලන නීති සමඟ බැංකුවේ අනුකූලතාවය සහතික කිරීම සඳහා සියළුම සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සමාලෝචනය කිරීම කමිටුවේ ප්‍රධාන අරමුණ වේ. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සඳහා වන කොන්දේසි සහ නියමයන් ඇගයීමට හා සමාලෝචනය කිරීමටත් සම්බන්ධිත පාර්ශවයන් හිතකර වන ආකාරයේ කිසිදු සැලකිල්ලක් නොවූ බවට සහතික වීමට කමිටුවට බලය හිමි වී ඇත. ගණුදෙනු වල යෝග්‍යභාවය, ගත හැකි ක්‍රියාමාර්ග වල ස්වභාවය සහ බැංකුවේ හා එහි පාර්ශවකරුවන්ගේ යහපත උදෙසා ඇති නියමයන්ගේ සාධාරණත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීමට කමිටුව වගකීමෙන් බැඳේ. කමිටුවට විශේෂඥ අදහස් ලබාගත හැක (අවශ්‍ය නම්)

කොළඹ කොටස් හුවමාරුවේ නීති 9.3.2 (a) ට අනුකූලව වාර්ෂික වාර්තාවේ අනාවරණය කල යුතු හෝ ශ්‍රී ලංකා මහ බැංකු නියෝග 3 (7) (iv) ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ලබාගත යුතු හෝ 3 (7) (iii) නියෝගය යටතේ පැහැදිලි කර ඇති ආකාරයේ සම්බන්ධිත පාර්ශවයන්ට වැඩි හිතකර කොන්දේසි ඇතුලත් නැවත නැවතත් සිදු නොවන ස්වභාවයේ සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සමාලෝචනයට ලක්වන මූල්‍ය වර්ෂය තුළ දී බැංකුව සමඟ සිදුවී නොමැති බව කමිටුව දැනුම් දෙනු ලැබේ.

තවදුරටත්, සමාලෝචනයට ලක්වන මූල්‍ය වර්ෂය තුළ දී බැංකුව විසින් පර්පෙචුවල් ට්‍රෙසරීස් ලිමිටඩ් සමඟ නැවත නැවතත් සිදුවන ස්වභාවයේ ගණුදෙනු සිදුකර ඇති බව කමිටුව දැනුම් දෙනු ලැබේ. (HDFC බැංකුවේ අධ්‍යක්ෂ එම් සුරේන්ද්‍රන් මහතා ගණුදෙනු කාලසීමාව තුළ අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කර ඇත.) සාපේක්ෂව ඉහළ ඵලදාවක් ලැබීම මත අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල ආයෝජන ප්‍රතිපත්තිය තුළ ආයෝජන කමිටුව විසින් මෙම ආයෝජන සිදුකර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය අවශ්‍ය නොවේ. පර්පෙචුවල් ට්‍රෙසරීස් ලිමිටඩ් ප්‍රාථමික වෙළෙන්දෙක් වන අතර බැංකුවට ගණුදෙනු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය දී ඇත. බැංකුව පර්පෙචුවල් ට්‍රෙසරීස් ලිමිටඩ් හි ආයෝජනය කර නොතිබුණද ආයෝජනයේ ඒකාබද්ධ වටිනාකම 2016 වර්ෂයේ දළ ආදායමෙන් 10% ඉක්මවන නිසා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති 9.3.2 (b) යටතේ අනාවරණය කිරීම අවශ්‍ය වේ.

| නම | සබඳතාවය | ගණුදෙනුවේ ස්වභාවය | කාලසීමාව තුළ සිදුකළ ගණුදෙනු වල වටිනාකම | මුළු ගණුදෙනු වටිනාකම ශුද්ධ ආදායමේ % ලෙස | සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවල කොන්දේසි සහ නියමයන් |
|---|---|---|---|---|---|
| පර්පෙචුවල් ට්‍රෙසරීස් ලිමිටඩ් | පොදු අධ්‍යක්ෂධූර | භාණ්ඩාගාර බිල්පත් 1/4/16 - 15/7/16 | රු. මිලියන 450 | | පරිණතභාවයට ඵලදාව 8.75 % |
| පර්පෙචුවල් ට්‍රෙසරීස් ලිමිටඩ් | පොදු අධ්‍යක්ෂධූර | භාණ්ඩාගාර බිල්පත් 22/4/16 - 21/10/16 | රු. මිලියන 200 | | පරිණතභාවයට ඵලදාව 9.35 % |
| පර්පෙචුවල් ට්‍රෙසරීස් ලිමිටඩ් | පොදු අධ්‍යක්ෂධූර | භාණ්ඩාගාර බැඳුම්කර 15/6/16 - 15/7/16 | රු. මිලියන 200 | | පරිණතභාවයට ඵලදාව 10 % |
| පර්පෙචුවල් ට්‍රෙසරීස් ලිමිටඩ් | පොදු අධ්‍යක්ෂධූර | භාණ්ඩාගාර බැඳුම්කර 22/4/16 - 21/10/16 | රු. මිලියන 200 | | පරිණතභාවයට ඵලදාව 9.3 % |
| මුළු වටිනාකම | | | රු. මිලියන 1,050 | 17.78% | |

වාර්ෂික වාර්තාවේ පිටු අංක 141 හි වූ මූල්‍ය ප්‍රකාශන සටහන් 32 හි තවදුරටත් සම්බන්ධිත පාර්ශව ගණුදෙනු පිළිබඳ තොරතුරු ඇතුලත් වේ.

# අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්තා

**කමිටුවේ සංයුතිය සහ රාජකාරි ඉටු කරන ආකාරය.**

සලකා බලන මූල්‍ය වර්ෂය තුලදී කමිටුව එක් (01) රැස්වීමක් පවත්වා ඇත. කමිටුවේ සාමාජිකත්වය සහ රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ පිටු අංක 39 හි අන්තර්ගත කර ඇත.

**ආර් ජේ සිල්වා මහතා**
සභාපති

**දර්ශනී ද සිල්වා මහත්මිය**
සමාගම් ලේකම්

කොළඹදී
2017 මැයි මස 24 දින

### අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

කොළඹ කොටස් හුවමාරුවේ "ලැයිස්තුගත කිරීමේ නීති" වලට සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය හා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ඒකාබද්ධව නිකුත් කළ "සාංගමික යහපාලනය මත මනා පරිචය සංග්‍රහයට" සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සාංගමික යහපාලන අවශ්‍යතා වලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා ඉහත වාර්තාව විගණන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබේ.

### විගණන කමිටුවේ සංයුතිය

2007 අංක 12 දරන බැංකුකරණ පනතේ සඳහන් සංයුති අවශ්‍යතාවයන්ට අනුකූලව විධායක නොවන අධ්‍යක්ෂවරු 05 දෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත. විගණන කමිටුවේ සභාපතිවරයා වන එම් සුරේන්ද්‍රන් මහතා විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර මූල්‍ය/විගණන පසුබිමක් ඇති විශේෂඥයෙකි. වර්ෂය තුළදී පහත සඳහන් අධ්‍යක්ෂවරු විගණන කමිටුව තුළ සේවය කර ඇත.

| අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාමාජිකයාගේ නම | අධ්‍යක්ෂධූර තත්ත්වය |
|---|---|
| එම් සුරේන්ද්‍රන් මහතා | ස්වාධීන නොවන |
| ප්‍රසාද් ගල්හේන මහතා | ස්වාධීන |
| ආර් එච් මීවක්කල මහතා | ස්වාධීන |
| එල් ජයසිංහ මහතා | ස්වාධීන |
| ඩී පී විමලසේන මහතා | ස්වාධීන |

සාමාජිකයින්ගේ තොරතුරු පිටු අංක 92 සිට 95 දක්වා අන්තර්ගත කර ඇත.

### විගණන කමිටු ප්‍රඥප්තිය

විගණන කමිටු ප්‍රඥප්තිය තුළ කමිටුවේ විෂය පථය පැහැදිලිව නිර්වචනය කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කලානුරූපිව සමාලෝචනය කර සංශෝධනය කර ඇත. මෙම ක්‍රියාවලිය තුළින් නව සංවර්ධනයන් සහ ගැටළු වලට ප්‍රමාණාත්මක ප්‍රතිචාර දැක්වීම කර ඇති බව සහතික කර ඇත. අවසාන වශයෙන් 2016 දෙවන කාර්තුවේදී විගණන කමිටු ප්‍රඥප්තිය අධ්‍යක්ෂ මණ්ඩලය සාමාලෝචනය කර අනුමත කරන ලදී.

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම දරන අතර නිතිපතා එහි කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබේ. මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර විගණනය සහ අභ්‍යන්තර හා බාහිර විගණන වලට අදාළ කාර්යයන් මත විගණන කමිටුවේ සාමාන්‍ය අධීක්ෂණ වගකීම තුලින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම සඳහා විගණන කමිටුවේ කාර්යයන් සැකසී ඇත.

### විගණන කමිටු රැස්වීම්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තුලදී කමිටුව රැස්වීම් අටක් (08) පවත්වා ඇත. රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම වාර්ෂික වාර්තාවේ සාංගමික යහපාලන කොටසෙහි අන්තර්ගත කර ඇත.

ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී සාමාන්‍යයෙන් රැස්වීම් වලට සහභාගී වේ. ප්‍රධාන අභ්‍යන්තර විගණක කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි. ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, අවදානම් නිලධාරී සහ අනුකූලතා නිලධාරී ආරාධනය මත රැස්වීමට සහභාගී වේ. අවශ්‍යතාවය මත අනෙක් නිලධාරීන්ට රැස්වීමට ආරාධනා කරනු ලැබේ. වර්ෂය තුළදී කමිටුවේ ආරාධනය මත බැංකුවේ බාහිර විගණක 06 වෙනි රැස්වීමට සහභාගී වී ඇත.

### කමිටුව භාවිතා කරන ක්‍රමවේදය

- අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමට පෙර අනාවරණය කිරීම සඳහා සකස් කළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ අතුරු මූල්‍ය ප්‍රකාශන වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා එම ප්‍රකාශන සමාලෝචනය කිරීම.
- මූල්‍යයට සම්බන්ධ කරුණු හෝ බැංකුවට සම්බන්ධ වෙනත් කරුණු විභාග කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයට, නියාමන අධිකාරීවලට, කළමනාකරණයට සහ වෙනත් පාර්ශවකරුවන්ට නිවැරැදි, ගැලපෙන හා නියමිත වේලාවට තොරතුරු සම්පාදනය කිරීම සඳහා ශක්තිමත් හා කාර්යක්ෂම මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් තිබෙන බවත් මනාව කළමනාකරණය කරන බවත් සහතික කිරීම.
- සාංගමික යහපාලන පරිචයන්හි ඉහළ ප්‍රමිතියක් ලඟාකරගැනීමට බැංකුව අවංකව බැඳී සිටින ප්‍රතිපත්ති බැංකුව යොදාගෙන ඇති බව සහතික වීම.
- ගිණුම්කරන ප්‍රතිපත්ති වල අනුරූපතාවය සහ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවලටත් අදාළ ගිණුම්කරන ප්‍රමිත වලටත් අනුකූලතාවය සමාලෝචනය කිරීම.

# අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්තා

- අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ පාලන දුර්වලතා, ක්‍රියාපටිපාටි උල්ලංඝනය කිරීම් සහ වංචා හා වැරදි අවම කිරීම සඳහා කළමනාකාරීත්වය සමඟ එක්ව පූර්වෝපායික ක්‍රියාමාර්ග ගැනීම.
- බාහිර විගණන හා ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා සමාලෝචනය කිරීම සහ ඔවුන්ගේ සොයාගැනීම් හා නිර්දේශ අනුව කටයුතු කිරීම.

### කටයුතු වල සාරාංශය

වර්ෂය තුලදී පහත කටයුතු ක්‍රියාවට නංවන ලදී.

- **මූල්‍ය වාර්තාකරණය**
  වැදගත් මූල්‍ය වාර්තාකරණ ගැටළු, ගිණුම්කරන ප්‍රතිපත්ති සහ පරිචයන්හි වෙනස්වීම් සහ මූල්‍ය වාර්තාකරණයට අදාළ වෙනත් ගැටළු සමාලෝචනය කිරීම හරහා වාර්ෂික සහ අතුරු මූල්‍ය වාර්තා ඇතුළු මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය කාර්යඵලය සම්බන්ධ වෙනත් ඕනෑම නිවේදනවල නිරවද්‍යතාවය කමිටුව නිරීක්ෂණය කරනු ලැබේ.

- **අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණ පද්ධති සහ අනුකූලතා අවශ්‍යතාවයන්**
  බැංකුව මුහුණ දෙන සියළුම ප්‍රමාණාත්මක අවදානම් හඳුනාගැනීම සහ කළමනාකරණය කිරීම සහ ක්‍රියාපටිපාටි ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවන්ට අනුකූල වන බව සහතික කරමින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ අවදානම් කළමනාකරණ පද්ධති කමිටුව යටතේ සමාලෝචනය වේ. එසේම කමිටුව මඟින් අනිවාර්ය අවශ්‍යතාවන්ට අනුකූල වීම් නිරීක්ෂණය කරන අතර එම අවශ්‍යතාවන්ට ක්‍රියාවලිවල සහ පද්ධතිවල අනුකූලතාවය සහතික කරනු ලැබේ.

- **අභ්‍යන්තර විගණනය**
  බැංකුවේ සමස්ථ අවදානම් කළමනාකරණ පද්ධතිය තුළ අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථයේ, ශ්‍රිතයන්ගේ සහ සම්පත් වල ප්‍රමාණාත්මකභාවය කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ. විගණන කටයුතු වල අභ්‍යන්තර විගණන ශ්‍රිතයන් ස්වාධීන බවට කමිටුව සහතික වනු ලැබේ.

  කමිටුව මඟින් අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය, තක්සේරු කිරීම සහ අනුමත කිරීම සිදුකරනු ලබයි. ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට අනුව අභ්‍යන්තර විගණන ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ඇගයීම් සිදුකරනු ලැබේ.

- **බාහිර විගණනය සහ වෙනත් ව්‍යවස්ථාපිත විගණන**
  ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් පවත්වනු ලබන ව්‍යවස්ථාපිත විභාග කිරීම් සහ බාහිර විගණකවරුන්ගේ සොයාගැනීම් සමාලෝචනය කිරීම සහ බාධාකාරී උල්ලංඝනය කිරීම් සහ වංචා හා වැරදි සඳහා කළමනාකාරීත්වය සමඟ එක්ව පූර්වෝපායික ක්‍රියාමාර්ග ගැනීම.

### ආචාරධර්ම සහ යහපාලනය

කමිටුව මඟින් අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය සාමාලෝචනය කිරීම සහ අනුමත කිරීම මඟින් අභ්‍යන්තර විගණන සේවකයින් අතර යහපාලනය ප්‍රවර්ධනය කිරීම සහ සේවකයින්ගේ ආචාරශීලි වටිනාකම් ඉහළ දැමීමට අඛණ්ඩව අවධාරණය කිරීම සිදුකරනු ලබයි. මේ සඳහා මනා පරිචය සංග්‍රහයක් ස්ථාපිත කර ඇති අතර ඕනෑම වැරදි ක්‍රියාවක් හෝ අයථා කටයුත්තක තොරතුරු සියළුම සාමාජිකයිගෙන් ලබාගැනීම සඳහා සාංගමික කළමනාකරුවන් දෙදෙනෙකු පත්කර ඇත. මේ තුළින් බැංකුව යහපාලනය සම්බන්ධයෙන් උසස් ප්‍රමිතීන් පවත්වාගන්නා බව සහ අනුගමනය කරන බව සහතික කර ඇත.

### අභ්‍යන්තර මූල්‍ය පාලනයන්, ගිණුම්කරන පරිචයන් සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන

බැංකුවේ ආරක්ෂණ සම්පාදකයන්ගේ කාර්යයන්ට පදනම්ව බැංකුවේ අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධති සහ ගිණුම්කරන පරිචයන් තුළින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා අවිශ්වාසදායක පදනමක් සපයන බවට කමිටුවේ අවධානයට යොමු වී නැත. සමාගම් පනතෙහි සහ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්තීන්හි අවශ්‍යතා සමඟ සෑම ආකාරයෙන්ම බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අනුකූල වී ඇති බවට කමිටුව සෑහීමකට පත්වන අතර මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂවරුන්ගේ අනුමැතිය සඳහා නිර්දේශ කර ඇත.



**එම් සුරේන්ද්‍රන් මහතා**
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
2017 මැයි මස 24 දින

# අනුකූලතා සමාලෝචනය

බැංකුවේ සාංගමික යහපාලන රාමුව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ බැංකුවේ කාර්යයන්හි විනිවිදභාවය, සාධාරණත්වය සහ වගවීම ශක්තිමත් කිරීම වේ. එම නිසා බැංකුව සකස් කළ සාංගමික යහපාලන ප්‍රමිතීන් ආරක්ෂා කරගැනීම සඳහා අපගේ සාංගමික යහපාලන ව්‍යුහය මට්ටම් තුනක් මත ගොඩනගා ඇත. ඒවා නම් 01. ආචාරධර්ම සහ වටිනාකම්, 02. අභ්‍යන්තර පාලන පද්ධති, 03. නායකත්වය හා සේවක දායකත්වය

ශ්‍රී ලංකා මහ බැංකුව, ලැයිස්ගත සමාගම් සඳහා කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම සකස් කළ සාංගමික යහපාලන රාමුවෙහි නියාමන අවශ්‍යතාවන්ට අදාළව පහත පරිදි අපගේ අනුකූලතා මට්ටම වර්තා කරනු ලැබේ.

මෙම වාර්තාව තුළ අදාළ වන්නා වූ යහපාලන විෂය පථය වෙනම කොටස් 03 ක් යටතේ තක්සේරු කර ඇත.

**පළමු කොටස**

බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා මහ බැංකු යහපාලන නියමයන් සඳහා අනුකූලතාවය.

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(1) අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් | | | |
| 3(1) (ස) අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන්<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත තත්වයන් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම තුලින් බැංකුවේ සුරක්ෂිතතාවය හා තිරසාර බව ශක්තිමත් කළ යුතුය. | | | |
| (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ උපායමාර්ගික අරමුණු සහ සාංගමික වටිනාකම් බැංකුව තුළ සන්නිවේදනය වන බවට සහතික වීම. | අනුකූල වී ඇත<br><br>උපායමාර්ගික සාංගමික සැලැස්ම බලපැවැත්වෙන කාලය 2014-2016 | | නැත |
| (ආ) මැනිය හැකි අරමුණු සහිතව සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රමවේද සහ යාන්ත්‍රණයකින් යුක්ත අවම වශයෙන් ඉදිරි වර්ෂ 03 සඳහා සමස්ත ව්‍යාපාරික උපාය මාර්ගය. | අනුකූල වී ඇත<br><br>මේ සම්බන්ධයෙන් වූ විගණන සොයාගැනීම් පරිශීලනය කරන්න.<br><br>අධ්‍යක්ෂවරුන්ගේ අනුමැතිය සහිතව අදාළ අවදානම් ප්‍රතිපත්ති අත්පොත් ඇත. | | නැත |
| (ඇ) ප්‍රධාන අවදානම් හඳුනාගැනීම හා විචක්ෂණශීලීව එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට සහතික වීම. | අනුකූල වී ඇත<br><br>අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ඇතුළුව අවදානම් කළමනාකරණ ව්‍යුහයක් ස්ථාපිත කර ඇති අතර අවදානම් රුචිකත්ව හා දරා ගැනීම් මට්ටම් සමග වූ අවදානම් පුවරු තුළින් සියළුම ප්‍රධාන අවදානම් නිරීක්ෂණය කරනු ලැබේ. | | නැත |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| (ඈ) තැන්පතු හිමියන්, ණය හිමියන්, කොටස් හිමියන් සහ ණය ගන්නන් ඇතුළු සියලුම පාර්ශවකරුවන් සමග වන සන්නිවේදන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය. | අනුකූල වී ඇත | | නැත |
| (ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතීන්ගේ හා කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමණාත්මක බව හා නිරවද්‍යතාවය නිරීක්ෂණය කිරීම. | අනුකූල වී ඇත | | නැත |
| (ඊ) අන්තර්ජාතික ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුව (1) ප්‍රතිපත්ති සඳහා දැඩිව බලපෑම් කළ හැකි (11) ඍජු කටයුතු සහ (111) ව්‍යාපාර කටයුතු මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය වැනි තනතුරු දරන ප්‍රධාන කළමනාකරණ පිරිස් හඳුනාගැනීම හා තනතුරට නියම කිරීම. | අනුකූල වී ඇත | | නැත |
| (උ) අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන  කළමනාකරණ පිරිස් වල මූලික වගකීම් හා අධිකාරීත්ව ක්ෂේත්‍ර නිර්ණය කර තිබීම. | අනුකූල වී ඇත | | නැත |
| (ඌ) අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තීන්ට අනුරූපීව ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් සිදුකරන බැංකුවේ කටයුතු සම්බන්ධව යෝග්‍ය සුපරීක්ෂණයක් සිදු කරන බවට තහවුරු කිරීම. | අනුකූල වී ඇත | | නැත |
| (එ) පහත සඳහන් දෑ ඇතුළුව අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ස්වකීය යහපාලන ප්‍රතිපත්ති වල ඵලදායීතාවය වරින් වර තක්සේරු කිරීම.<br>(i) අධ්‍යක්‍ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තෝරා ගැනීම, නම් කිරීම හා ඡන්දයෙන් පත් කර ගැනීම. (ii) බැඳියා පිළිගැටුම් (Conflicts of Interest) කළමනාකරණයල (iii) දුර්වලතා නිර්ණය කිරීම හා අවශ්‍ය සංශෝධන ක්‍රියාවට නැංවීම. | අනුකූල වී ඇත | | නැත |
| (ඒ) ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා වන අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතුවන බව සහතික වීම. | අනුකූල වී ඇත.<br><br>මෙය තවදුරටත් සමාලෝචනය හා යාවත්කාලීව වනු ඇත. | | නැත |
| (ඔ) සාංගමික අරමුණු සඳහා ප්‍රතිපත්ති විමර්ශණය, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ප්‍රගතිය නිරීක්ෂණය සදහා අධ්‍යක්‍ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ අවශ්‍යතාවය පරිදි නිතිපතා රැස්වෙන බවට සහතික වීම. | අනුකූල වී ඇත | | නැත |
| (ඕ) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම හා බැංකුව විසින් නියාමන ආයතන සමඟ සම්බන්ධතා පවත්වා ගෙන යාම. | අනුකූල වී ඇත | | නැත |

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| (ක) බාහිර විගණකවරු පත්කිරීම හා ඔවුන් අධීක්ෂණ ක්‍රියාවලියක් පවත්වාගෙන යෑම. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (ii) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකු නියමයන් අංක 3 (5) අනුව ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් අර්ථ දැක්වීම. | අනුකූල වී ඇත | | නැත |
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | | | |
| 3(1) (iii) අවම වශයෙන් මසක විවේකයක් සහිතව වසරකට අවම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 12 ක් නිතිපතා පවත්වා ගෙන යෑම. ලිඛිත යෝජනාපත්‍ර හා පත්‍ර යොමුකිරීම තුළින් අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත ලබාගැනීම හැකිතාක් වැලැක්වීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (iv) කරුණු හා යෝජනා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ට අවස්ථා ලබා දීමට ක්‍රම වේදයක් පවත්වා ගෙන යෑම. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (v) නිතිපතා පැවත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින 07 ක පූර්ව දැනුම් දීමක් සිදු කිරීම සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පූර්ව දැනුම් දීමක් සිදු කිරීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (vi) ආසන්න මාස 12 කාල සීමාව තුල පැවත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලින් අවම වශයෙන් 2/3 කට හෝ ආසන්න අඛණ්ඩ රැස්වීම් වාර 03 කට සහභාගි නොවූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ අධ්‍යක්ෂධූර අවසාන කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබීම. විකල්ප අධ්‍යක්ෂවරයකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි කරවීම නිසි සහභාගි වීමක් ලෙස පිලිගනු ලැබේ. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (vii) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධි විධාන සපුරාලන සමාගම් ලේකම්වරයෙකු පත් කල යුතු අතර ඔහු / ඇය ගේ මූලික වගකීම වනුයේ අධ්‍යක්ෂ මණ්ඩල හා කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් සේවා සැපයීම හා ව්‍යවස්ථාවේ හා අනෙකුත් රෙගුලාසි විසින් සඳහන් කර ඇති අනෙකුත් කාර්යයන් ඉටු කර දීමයි. | අනුකූල වී ඇත | | නැත |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(1) (viii) සියලුම අදාළ නීති හා රෙගුලාසි සහ අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි අනුගමනය කරන බව සහතික කරගැනීම සමඟ සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගමේ ලේකම් වරයාට උපදෙස් දීමට හා සේවාවන් ලබා ගැනීමට ඉඩ කඩ පැවතීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (ix) සමාගම් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් යෝජනා නිසියාකාරව පවත්වාගෙන යාම සහ එම ඕනෑම වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට නිසි දැනුම්දීමක් මත විමර්ෂණයක් සඳහා හෝ සාධාරණ වේලාවක් පිරික්සා බැලීමට විවෘතව තැබීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (x) සාංගමික යහපාලනය මත බැංකුකරණ පනතේ නියමයන් වල අවශ්‍යතාවයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් යෝජනා වල ප්‍රමාණවත් තොරතුරු ඇතුලත් විය යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (xi) යෝග්‍ය කරුණක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ වරයෙකු යම් ස්වාධීන වෘත්තිකයෙකුගේ උපදෙස් බැංකුවේ වියදමින් ලබා ගැනීමට සාධරණ ඉල්ලීමක් කල විට එයට ඉඩකඩ ලබාදීමේ පිලිවෙලකට තිබීම. අදාළ අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරුන්ට බැංකුව වෙනුවෙන් තම කාර්යයන් ඉටුකිරීම සඳහා  ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීමට අවස්ථාව අධ්‍යක්ෂ මණ්ඩලය උදාකර දිය යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (xii) වෙනත් ආයතන හෝ සම්බන්ධිත පාර්ශව සමඟ සිදුකරන ගණුදෙනු හෝ බැඳීම් නිසා අධ්‍යක්ෂවරුන්ට අදළ බැඳියා පිළිගැටුම් හෝ ගැටුම් ඇති බව පෙන්නුම් කිරීමෙන් වැලකිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණාත්මක යැයි හෝ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් තුළ සාකච්ඡා කල යුතු යැයි සලකන බැඳියා පිළිගැටුමක් අධ්‍යක්ෂවරයෙකුට ඇත්නම් එම රැස්වීමට එම ගණුදෙනුව සම්බන්ධයෙන් කිසිදු ප්‍රමාණාත්මක ඇල්මක් නැති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු (මෙම නියෝග වල 3 :2) (iv) ට අනුව) සිටිය යුතුය. යම් අධ්‍යක්ෂවරයෙකුට හෝ ඔහුගේ ඇයගේ සම්බන්ධිත ගණුදෙනුවකට හෝ අධ්‍යක්ෂවරයාට සැලකිය යුතු ඇල්මක් ඇති කරුණකට අදල අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකට ඡන්දය දීම සම්බන්ධයෙන් එම අධ්‍යක්ෂවරයා වැලකී සිටිය යුතු අතර එම අදල අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ න්‍යාය පත්‍ර අයිතමය තුල සනපූර්ණයෙන් බැහැර වේ. | අනුකූල වී ඇත | | නැත |

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(1) (iii) බැංකුවේ පාලනය හා දිශාව සම්පූර්ණයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරීත්වය යටතේ පැවතීම සහතික කිරීම සඳහා විශේෂ කරුණු සඳහා තීරණ ගැනීම සම්බන්ධයෙන් විධිමත් උප ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය සතුවීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (xiv) බැංකුව සතු බැඳීම් නිරාකරණය කිරීමට නොහැකිවීම හෝ තැන්පත් කරුවන්ගේ හා අනෙකුත් ණයහිමියන්ගේ ගෙවීම් අත්හිටුවීම්, බුන්වත්භාවයට පත්වීම් සම්බන්ධව හඳුනාගැනීමට ක්‍රමවේදයක් සැලකීමේදී, ඒ හා සම්බන්ධ තීරණ හෝ ක්‍රියා මාර්ග ගැනීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය පිලිබඳ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂවරයා දැනුවත් කල යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (xv) මුදල් මණ්ඩලය නියම කොට ඇති ප්‍රාග්ධන මට්ටම් හා වෙනත් විචක්ෂණ පදනම් බැංකුවට ලඟාකරගත හැකි බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වීම. | අනුකූල වී ඇත<br><br>2016.12.31 දිනට ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සඳහා 147 පිටුව පරිශීලනය කරන්න. | | නැත |
| 3(1) (xvi) මෙම විධානවල 3 වන විධානයට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික සාංගමික යහපාලන වාර්තාවක් වාර්ෂික වාර්තාව තුල පල කල යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(1) (xvii) එක් එක් අධ්‍යක්ෂවරයාගේ කාර්යභාර්ය පිලිබඳ වාර්ෂිකව ස්වයං තක්සේරුවකට ලක්කොට ඒ පිලිබඳ වාර්තා තබා ගැනීමේ ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුගමනය කිරීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(2) අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය | | | |
| 3(2) (i) අධ්‍යක්ෂ මණ්ඩලය 07 දෙනෙකුට නොඅඩු 13 කට නොවැඩි සාමාජික සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය. | අනුකූල වී ඇත<br><br>අ) නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතට අනුව අධක්‍ෂ මණ්ඩලය තුළ අධ්‍යක්ෂවරු වර්ග තුනක් අන්තර්ගත වේ.<br>(i) නිලතලයෙන් පත්වන අධ්‍යක්ෂවරු- භාණ්ඩාගාරය සහ නිවාස අමාත්‍යංශය නියෝජනය කරන<br>(ii) නම්කල අධ්‍යක්ෂවරු - මුදල් අමාත්‍යංශය සහ කම්කරු හා නිවාස අමාත්‍යංශය නියෝජනය කරන<br>(ii) කොටස්හිමි අධ්‍යක්ෂවරු | | නැත |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| | (අ) සමාලෝචනයට ලක්වන කාලච්ඡේදය තුළදී පහත පරිදි අධ්‍යක්ෂවරු 12 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට අන්තර්ගත වේ. (කලින් කලට)<br><br>01. ආර්. ජේ. සිල්වා මහතා<br>02. එම්. සුරේන්ද්‍රන් මහතා<br>03. ප්‍රසාද් ගල්හේන මහතා<br>04. බී. ජී. එස්. ගුණතිලක මහත්මිය (2016.07.26 දින ඉවත් වූ)<br>05. ආර්. එම්. ජේ රත්නායක මහතා (2016 ජූනි මස ඉවත් වූ)<br>06. ආර්. එච්. මීවක්කල මහතා<br>07. එල්. එස්. පලන්සූරිය මහතා<br>08. පී. එස්. පුංචිහේවා මහතා<br>09. එස්. එම්. ජී. ජයරත්න මහතා<br>10. ඩී. පී. විමලසේන මහතා<br>11. එල්. ජයසිංහ මහතා<br>12. ආර්. ඒ. චූලානන්ද මහත්මිය<br><br>(ආ)වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩල විස්තර වාර්ෂික වාර්තාවේ පිටු 92 සිට 95 දක්වා අන්තර්ගත වේ. | | |
| 3(2) (ii)(අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන්ගේ මුළු සේවා කාලය වර්ෂ 09 ක් නොයික්ම විය යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(2) (ii)(ආ) යම් අධ්‍යක්ෂවරයෙක් වර්ෂ 09 ක් ඉක්මවා සේවය කරයි නම් සංක්‍රාන්ති ප්‍රතිපාදන වලට අනුකූල විය යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(2) (iii) බැංකුවේ සේවකයකු බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු (විධායක අධ්‍යක්ෂ) ලෙස පත්කළ, තෝරාගත යුතු හෝ නම් කල හැකිය. | අනුකූල වී ඇත<br><br>HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක නොවන අධ්‍යක්ෂවරු පමණක් අන්තර්ගත වේ. | | නැත |

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(2) (iv) අධ්‍යක්ෂ මණ්ඩලය තුල අවම වශයෙන් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් 03 දෙනක් හෝ මුළු අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් 1/3 හෝ දෙකෙන් වැඩි සංඛ්‍යාවක් සිටිය යුතුය | අනුකූල වී ඇත<br><br>සමාලෝචනයට ලක්වන කාලච්ඡේදය තුලදී අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය අනුව අධ්‍යක්ෂ මණ්ඩල අන්තර්ගතය පහත පරිදි වේ<br><br>(අ) ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ<br>01. ආර්. ජේ සිල්වා මහතා (සභාපති)<br>02. ප්‍රසාද් ගල්හේන මහතා<br>03. බී.ජී.එස් ගුණතිලක මහත්මිය (2016.07.26 දින ඉවත් වූ)<br>04. ආර්.එම්.ජේ රත්නායක මහතා (2016 ජූනි මස ඉවත් වූ)<br>05. ආර්. එච් මීවක්කල මහතා<br>06. එස්.එම් ජී ජයරත්න මහතා<br>07. ඩී. පී විමලසේන මහතා<br>08. එල් ජයසිංහ මහතා<br>09. ආර්.ඒ චූලානන්ද මහත්මිය<br><br>(ආ) ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ<br>01. එම් සුරේන්ද්‍රන් මහතා<br>02. එල්. එස් පලන්සූරිය මහතා<br>03. පී. එස් පුංචිහේවා මහතා | | නැත |
| 3(2) (v) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයකු පත් කර ඇති අවස්ථාවක දී එසේ පත්වන පුද්ගලයා සම්බන්ධයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදළ කොන්දේසි ක්‍රියාත්මක වේ | පත්වීම් නොමැත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 3(2) (vi) ස්වාධීන අධ්‍යක්ෂවරුන් විශ්වසනීය පුද්ගලයින් විය යුතු අතර උපායමාර්ග, කාර්යඵල හා සම්පත් සම්බන්ධයෙන් වූ ගැටළු වලදී ස්වාධීන විනිශ්චයක් ලබාදීමට අවශ්‍ය දක්ෂතාවක් සහ පළපුරුද්දක් ඇති අය විය යුතුය. | අනුකූල වී ඇත | | නැත |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(2) (vii) රැස්වීමකට සනපූර්ණය සඳහා සහභාගී විය යුතු අධ්‍යක්ෂවරු සංඛ්‍යාව සම්පූර්ණ කලද එම රැස්වීමට සහභාගි වූ විධායක නොවන අධ්‍යක්ෂවරු ගණන හරි අඩකට වැඩි නොවූ විට රැස්වීමක් නියම ලෙෂ පැවැත්විය නොහැක. මෙම උප නියමය 2011 ජනවාරි 01 දින සිට අදාළ වේ. | අනුකූල වී ඇත | | නැත |
| 3(2) (viii) බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙලිදරව් කරන සෑම සාංගමික සන්නිවේදනයකම ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස හැඳින්විය යුතුය.<br><br>සභාපතිතුමන්ගේ, විධායක අධ්‍යක්ෂවරුන්ගේ, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ හා ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නාමයන් ද සහිතව අධ්‍යක්ෂ වර්ගය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය වාර්ෂිකව සාංගමික යහපාලන වාර්තාව තුලින් අනාවරණය කල යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(2) (ix) අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරයකු පත් කිරීමට විධිමත්, විනිවිද ක්‍රමවේදයක් පැවතිය යුතුය. එසේම අධ්‍යක්ෂවරු පත්කිරීම සඳහා නිසි අනුප්‍රාප්තික සැලැස්මක් සඳහා ක්‍රමවේදයක් පැවතිය යුතුය. | අනුකූල වී ඇත (නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතට අනුව) | | නැත |
| 3(2) (x) අනියම් පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සියලුම අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් ඊට පසුව යෙදෙන පළමු මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ ඡන්දයට යටත් වේ. | | අදාළ නොවේ | අදාළ නොවේ |
| 3(2) (xi) අධ්‍යක්ෂවරයකු ඉල්ලා අස් වූ විටක හෝ නිලයෙන් පහ කල විටක දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින්: (අ) එම අධ්‍යක්ෂවරයා ඉල්ලා අස්වීමට හෝ නිලයෙන් පහ කිරීමට හේතු සහ බැංකුව සමඟ කටයුතු කිරීමට නොඑකඟවූ කරුණු වලට අදළ තොරතුරු ඇතුලුව ඉල්ලා අස්වීම හෝ නිලයෙන් පහ කිරීම නිවේදනය කිරීම. (ආ) කොටස් හිමියන්ගේ අවධානයට යොමු කල යුතු කරුණු වේද නැද්ද යන්න තහවුරු කරමින් ප්‍රකාශයක් නිකුත් කිරීම. | අනුකූල වී ඇත | | නැත |

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(2) (xii) බැංකුවේ අධ්‍යක්ෂවරයකු හෝ සේවකයකු තවත් බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස පත්කොට, තෝරාගෙන හෝ නම් කොට නොතිබීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(3) අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අදල වන නිර්නායක. (1988 අංක 30 දරන බැංකුකරණ පනත 76H වගන්තිය සමඟ කියවිය යුතු 42 වගන්තියට අමතරව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමේදී පුද්ගලයකුගේ යෝග්‍යතාවය තීරණය කිරීමට පහත කරුණු අදාළ වේ) | | | |
| 3(3) (i) අධ්‍යක්ෂවරයකු ලෙස සේවය ලබා දෙන අයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(3) (ii) කිසිදු පුද්ගලයෙකුට බැංකුවේ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් ද ඇතුලුව සමාගම්/ ආයතන 20 කට වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂ ධූරය දැරිය නොහැකි අතර එම සමාගම් 20 න් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරන හා විගණන ප්‍රමිත පනතට අනුව වූ විශේෂ ව්‍යාපාර ඒකක වර්ගයට අයත් සමාගම් ගණන 10 ට නොවැඩි විය යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(4) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන කළමනාකරණ කටයුතු. | | | |
| 3(4) (i) බලතල පැවරීමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යයනය කල යුතු අතර ඒවා පිළිබඳ නිසි අවබෝධයක් තිබිය යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(4) (ii) අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්ථයක් ලෙස තම කාර්යයන් ඉටු කිරීමට ඇති හැකියාව අඩු කරන හෝ බාධා කිරීම් කරන බලතල පැවරීම් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වලට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරුන්ට හෝ ප්‍රධාන කළමනාකරණ පිරිස් වලට නොකළ යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(4) (iii) බලතල පැවරීමේ ක්‍රියාවලි තවදුරටත් බැංකුවේ අවශ්‍යතාවයට අදළ වේද යන්න සහතික කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කලට බලතල පැවරීමේ ක්‍රියාවලි සමාලෝචනය කිරීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(5) සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී | | | |
| 3(5) (i) සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරීගේ භූමිකාව එකිනෙකට වෙනස් වන අතර එම තනතුරු එකම පුද්ගලයා නොදරන බව. | අනුකූල වී ඇත<br><br>නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතට අනුව සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරු වෙන වෙනම නිර්වචනය කර ඇත. | | නැත |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(5) (ii) සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුද විය හැක. | අනුකූල වී ඇත | | නැත |
| 3(5) (iii) සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරීගේ හඳුනාගැනීමේ තොරතුරු සහ සභාපතිවරයා හා ප්‍රධාන විධායක නිලධාරී අතර යම් සම්බන්ධතාවයක් (මූල්‍ය/ව්‍යාපාරික/ පවුල් හෝ වෙනත් ප්‍රමාණාත්මක) ඇත්නම් සහ ඔවුන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර කුමන හෝ සබඳතාවයක් ඇත්නම් ඒවා වාර්ෂික සාංගමික යහපාලන වාර්තා තුල එය හෙලිදරව් කල යුතුය. | අනුකූල වී ඇත<br><br>කිසිදු ආකාරයක සබඳතාවක් නොමැත. | | නැත |
| 3(5) (iv) සභාපතිතුමා විසින්: (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබාදීම, (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය කාර්යක්‍ෂමව කටයුතු කරමින් සිය වගකීම් ඉටු කරන බව සහ (ඇ) සියලුම මූලික හා අදාළ ගැටළු කාලීනව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කරන බවට සහතික කළ යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(5) (v) අනෙක් අධ්‍යක්ෂවරුන්ද න්‍යාය පත්‍රයට ඇතුල් කිරීම සඳහා කල යෝජනාවන්ද අදාළ ලෙස සැලකිල්ලට ගනිමින් සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම න්‍යාය පත්‍රය සකස් කිරීමේ සහ අනුමත කිරීමේ මූලික වගකීම සභාපතිවරයා සතු වන අතර න්‍යාය පත්‍රය සකස් කිරීම සඳහා සමාගම් ලේකම් වෙත බලතල පැවරීමට සභාපතිවරයාට හැකියාව ඇත. | අනුකූල වී ඇත | | නැත |
| 3(5) (vi) නිසි කලට කරුණු ඉදිරිපත් කිරීම තුලින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී පැන නගින ගැටළු පිළිබඳව අධ්‍යක්ෂවරුන් නිසි ලෙස දැනුවත් වන බවට සහ ප්‍රමාණවත් තොරතුරු ලැබෙන බවට සභාපති විසින් සහතික වීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(5) (vii) සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සම්පූර්ණ හා ක්‍රියාකාරී දායකත්වය ලබාදීමට දිරිගැන්වීම සහ බැංකුවේ යහපත උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාකරන බවට සහතික වීමට නායකත්වය ගත යුතුය. | අනුකූල වී ඇත | | නැත |

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(5) (viii) විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය ලබාගැනීමට සභාපතිතුමා පහසුකම් සැලසිය යුතු අතර විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර ශක්තිමත් සබඳතාවක් සහතික කළ යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(5) (ix) ප්‍රධාන කළමනාකරණ පිරිස් වල සෘජු නිරීක්ෂණයන්ට අදාළ කටයුතු වලට හෝ කවර හෝ විධායක රාජකාරීන් සඳහා සභාපතිවරයා සම්බන්ධ නොවිය යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| 3(5) (x) අධ්‍යක්ෂ මණ්ඩලය කොටස්හිමියන් සමඟ සන්නිවේදනයක් වන ආකාරයේ ඵලදායී සන්නිවේදනය ක්‍රියාවලියක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සභාපතිවරයා සහතික කළ යුතුය. | අනුකූල වී ඇත<br><br>(අ) වාර්ෂික මහා රැස්වීමට කොටස් හිමියන්ගේ සහභාගීත්වය<br>(ආ) සමාගමේ සියලුම කටයුතු ඇතුලත් ප්‍රධාන ලියවිල්ල වාර්ෂික වාර්තාව වේ. | | නැත |
| 33(5) (xi) බැංකුවේ දෛනික මෙහෙයුම් හා ව්‍යාපාර කටයුතු කළමනාකරණයේ විධායකය භාර ප්‍රමුඛයා ලෙස ප්‍රධාන විධායක නිලධාරී කටයුතු කරයි. | අනුකූල වී ඇත | | නැත |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(6) අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ කල කමිටු | | | |
| 3(6) (i) බැංකුව විසින් අවම වශයෙන් මහබැංකු නියමයන් (3)(6)(ii) (3)(6)(iii) (3)(6)(iv) සහ (3)(6)(v) දැක්වෙන කමිටු 04 වත් ස්ථාපිත කළ යුතු අතර එම කමිටු වාර්තා සෘජුවම අධ්‍යක්‍ෂ මණ්ඩලයට වාර්තා කල යුතුවේ. කමිටු සභාපතිවරයාගේ සුපරීක්‍ෂණය යටතේ රැස්වීම් කටයුතු සකස් කිරීම සහ යෝජනා වාර්තාවන් පවත්වාගැනීමට ලේකම්වරයකු පත් කරගැනීමට සියළු කමිටු වලට හැකියාව ඇත. එක් එක් කමිටුවේ භූමිකාව, කාර්යභාරය හා කාර්ය සාධනය අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ දක්වා තිබීම. | අනුකූල වී ඇත<br><br>පහත සඳහන් කමිටු ක්‍රියාත්මක වේ.<br><br>(i) අධ්‍යක්‍ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව<br>(ii) අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව<br>(iii) අධ්‍යක්‍ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව<br>(iv) අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව<br>(v) අධ්‍යක්‍ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශව ගණුදෙනු නීරීක්‍ෂණ කමිටුව<br>(vi) අධ්‍යක්‍ෂ මණ්ඩල අයකරගැනීම් උප කමිටුව<br>(vii) භාණ්ඩාගාර කළමනාකරණ උපදේශන කමිටුව | | නැත |
| අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව | | | |
| 3(6) (ii) නියමය යටතේ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවට අදාළ වගකීම් වෙනමම නිර්වචනය කර ඇත. | අනුකූල වී ඇත<br><br>වැඩිදුර තොරතුරු සඳහා පිටු අංක 57 සිට 58 දක්වා වූ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු සහ සාමාජිකත්වය සඳහා පිටු අංක 57 පරිශීලනය කරන්න. | | නැත |
| අධ්‍යක්‍ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව | | | |
| 3(6) (ii) නියමය යටතේ අධ්‍යක්‍ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට අදාළ වගකීම් වෙනමම නිර්වචනය කර ඇත. | අනුකූල වී ඇත<br><br>වැඩිදුර තොරතුරු සඳහා පිටු අංක 50 සිට 51 දක්වා වූ අධ්‍යක්‍ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව සහ සාමාජිකත්වය සඳහා පිටු අංක 37 පරිශීලනය කරන්න. | | නැත |

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව | | | |
| 3(6) (iv) නියමය යටතේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට අදාළ වගකීම් වෙනමම නිර්වචනය කර ඇත. | අනුකූල වී ඇත<br><br>ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ ප්‍රධාන විධායක නිලධාරියා සඳහා ඇගයීම, තෝරාගැනීම හා සුදුසුකම් ලැබීමේ නිර්ණායක සඳහා බැංකුවේ පවතින ප්‍රතිපත්තිය තවදුරටත් උසස් වනු ඇත.<br><br>වැඩිදුර තොරතුරු සඳහා පිටු අංක 52 දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටු වාර්තාව සහ සාමාජිකත්වය සඳහා පිටු අංක 37 පරිශීලනය කරන්න. | | නැත |
| අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව | | | |
| 3(6) (v) නියමය යටතේ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට අදාළ වගකීම් වෙනමම නිර්වචනය කර ඇත. | අනුකූල වී ඇත<br><br>වැඩිදුර තොරතුරු සඳහා පිටු අංක 53 සිට 54 දක්වා වූ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව සහ අධ්‍යක්ෂවරුන්ගේ සාමාජිකත්වය සඳහා පිටු අංක 38 පරිශීලනය කරන්න.<br><br>ඊට අමතරව සාමාන්‍යාධිකාරී/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර සාමාන්‍යාධිකාරිව/ ප්‍රධාන අභ්‍යන්තර විගණක/ ප්‍රධාන කළමනාකාර (භාණ්ඩාගාර)/ ණය අංශ ප්‍රධානී/ අනුකූලතා නිලධාරී/ අවදානම් නිලධාරී කමිටුවට අන්තර්ගත වේ. | | නැත |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| අධ්‍යක්‍ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශව ගණුදෙනු නීරීක්‍ෂණ කමිටුව | | | |
| | වැඩිදුර තොරතුරු සඳහා පිටු අංක 55 සිට 56 දක්වා වූ අධ්‍යක්‍ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශව ගණුදෙනු නීරීක්‍ෂණ කමිටු වාර්තාව සහ අධ්‍යක්‍ෂවරුන්ගේ සාමාජිකත්වය සඳහා පිටු අංක 39 පරිශීලනය කරන්න. | | |
| 3(7) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු | | | |
| 3(7) (i) සහ (ii) මෙම නියමයේ අරමුණ සඳහා, සම්බන්ධිත පාර්ශවයන් වශයෙන් සැලකිය හැකි පහත සඳහන් කාණ්ඩ වලට අයත් ඕනෑම පුද්ගලයන් හෝ පාර්ශව සමඟ බැංකුව සිදුකරන ඕනෑම ගනුදෙනුවක් නිසා ඇතිවිය හැකි බැඳියා පිලිගැටුම් වලක්වා ගැනීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය<br><br>(අ) බැංකුවේ ඕනෑම පරිපාලිත සමාගමක්;<br>(ආ) බැංකුවේ ඕනෑම ආශ්‍රිත සමාගමක්;<br>(ඇ) බැංකුවේ ඕනෑම අධ්‍යක්‍ෂවරයෙක්;<br>(ඈ) බැංකුවේ ඕනෑම ප්‍රධාන කළමනාකරණ පුද්ගලයකු;<br>(ඉ) බැංකුවේ අධ්‍යක්‍ෂවරයකු හෝ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයකුගේ ලඟම ඥාතියකු;<br>(ඊ) බැංකුවේ සැලකිය යුතු කොටස් හිමිකාරිත්වයක් දරන කොටස් හිමියකු;<br>(උ) බැංකුවේ ඕනෑම අධ්‍යක්‍ෂවරයකුට හෝ බැංකු අධ්‍යක්‍ෂවරයකුගේ ලඟම ඥාතිවරයකුට හෝ සැලකිය යුතු කොටස් හිමියකුට සැලකිය යුතු සම්බන්ධයක් පවතින ව්‍යවසායක්; | අනුකූල වී ඇත<br><br>වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධිත පාර්ශව ගණුදෙනු කමිටු වාර්තාව සහ පිටු අංක 141 හි මූල්‍ය ප්‍රකාශන සටහන් 32 පරිශීලනය කරන්න. | | 2017 වර්ෂය තුළදී සම්බන්ධිත පාර්ශව ප්‍රතිපත්තිය නිකුත් කර ඇත. |
| 3(7) (iii) යම් සමාන ගණුදෙනුවකදී බැංකුවේ සාමාන්‍ය ගණුදෙනුකරුවෙකුට ලබාදෙන සැලකිල්ලට වඩා වාසිදයක සැලකිල්ලක් ලබා දෙමින් 3 (7) (ස) නියමයේ සඳහන් සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගණුදෙනු බැංකුව සිදුනොකරන බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය සහතික වීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(7) (iv) ඕනෑම අධ්‍යක්‍ෂවරයෙකු හෝ ලඟම ඥාතියෙකු සඳහා ණය පහසුකම් ප්‍රදානය කිරීමේදී එම ණය පහසුකමට අදළ අධ්‍යක්‍ෂවරුන්ගේ හැර අනෙක් අධ්‍යක්‍ෂවරුන්ගේ 2/3 ක කැමත්තෙන් අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කිරීමෙන් තොරව ණය ලබා නොදිය යුතුය. මෙම ණය මුදල් මණ්ඩලය වරින් වර තීරණය කරන සුරැකුම් මගින් සුරක්ෂිත කළ යුතුය. | අනුකූල වී ඇත | | නැත |

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3 (7) (v) (අ) යම් පුද්ගලයකුට හෝ පුද්ගලයකුගේ ලඟම ඥාතියකුට හෝ එම පුද්ගලයාගේ සැලකිය යුතු හිමිකාරීත්වයක් ඇති ඕනෑම ව්‍යාපාරයකට බැංකුව විසින් මුදල් ණයට දීමක් සිදු කර ඇති විටක එම පුද්ගලයා පසුකාලීනව බැංකුවේ අධ්‍යක්‍ෂවරයෙක් ලෙස පත්කළේ නම් බැංකුව විසින් මුදල් මණ්ඩලය මඟින් එම කටයුත්ත සඳහා අනුමත කර ඇති සුරැකුම්, එම පුද්ගලයා අධ්‍යක්‍ෂවරයකු වශයෙන් පත් කල දින සිට වසරක් ඇතුලත ලබාගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| (ආ) 3 (7) (v) (අ) නියමයේ සඳහන් ආකාරයට එවැනි සුරැකුම් සපයා නොමැති නම් ලැබිය යුතු මුදලක් වේ නම් එය අදාළ පොලියද සමඟ එම ණය ප්‍රදානය කිරීමේදී නිශ්චය කල කාලසීමාව හෝ එලෙස එම පුද්ගලයා අධ්‍යක්‍ෂවරයෙකු ලෙස පත් කර මාස 18 ක් යන දෙකෙන් කලින් යෙදෙන දිනට අය කර ගැනීමට බැංකුව විසින් පියවර ගත යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| (ඇ) ඉහත අනුවිධානය සමඟ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම අධ්‍යක්‍ෂවරයකු ඔහුගේ නිලය අතහැර ගියා සේ සලකන අතර ඒ බව බැංකුව මහජනතාවට හෙළිදරව් කල යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| (ඈ) බැංකුව ණය ප්‍රදානය කරන අවස්ථාවේදී අදළ අධ්‍යක්‍ෂවරයා බැංකුවේ සේවකයෙක් නම් සහ ණය ප්‍රදනය කර ඇත්තේ බැංකුවේ සියලුම සේවකයින්ට පොදු වූ යෝජනා ක්‍රමයකට නම් එම අනු විධානය එවැනි අධ්‍යක්‍ෂවරයකුට අදළ නොවේ. | අනුකූල වී ඇත | | නැත |
| 3 (7) (vi) බැංකුවේ සේවකයින්ට පොදු වූ යෝජනා ක්‍රමයක් මත හෝ ඉහත 3 (7) (v) විධානයේ සඳහන් පරිදි මුදල් ණයට දීමේදී මුදල් මණ්ඩලය අනුමත කර ඇති සුරැකුම් මඟින් සුරක්ෂිත කර ඇති විට හැර බැංකුවේ ඕනෑම සේවකයකුට, එවැනි සේවකයකුගේ ලඟම ඥාතියෙකුට හෝ සේවකයා හෝ ලඟම ඥාතියා සමඟ ප්‍රමාණවත් බැඳියාවක් ඇති ඕනෑම පාර්ශවයකට මුදල් ණයට දීමක් හෝ ගාස්තු සහ කොමිස් අත හැර පක්‍ෂග්‍රාහී වාසිදයක සැලකිල්ලක් බැංකුව විසින් නොකල යුතුය. | අනුකූල වී ඇත | | නැත |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| 3(7) (vii) බැංකුව විසින් 3 (7) (v) සහ 3 (7) (vi) යටතේ ලබාදෙන ඕනෑම ප්‍රදානයකට මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය තිබිය යුතු අතර එවැනි ප්‍රදානයක කොටසක් හෝ එහි පොලිය හෝ මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව ප්‍රේෂණය කල නොහැක. එවැනි අනුමැතියක් නොමැතිව කරන ඕනෑම ප්‍රේෂණයක් අවලංගු හා බල රහිත එකක් වන්නේය. | | අදාළ නොවේ. | අදාළ නොවේ. |
| 3(8) අනාවරණයන් | | | |
| 3(8) (i) අධ්‍යක්ෂ මණ්ඩලය පහත දෑ හෙලිදරව් කර ඇති බව සහතික වීම.<br>(අ) අධීක්ෂණ හා නියාමන ආයතන විසින් නියම කරන ලද අකෘතීන්ට සහ අදළ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ප්‍රසිද්ධ කිරීමත්. | අනුකූල වී ඇත | | නැත |
| (ආ) එම මූල්‍ය වාර්තා පුවත්පත් වල සංක්ෂිප්ත ස්වරූපයෙන් සිංහල දමිල හා ඉංග්‍රීසි භාෂා වලින් ප්‍රසිද්ධ කිරීම. | අනුකූල වී ඇත | | නැත |
| 3(8) (ii) පහත අවම හෙලිදරව් කිරීම් වාර්ෂික වාර්තාවේ සිදුකරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වීම.<br>(අ) අදළ ගිණුම්කරන ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව විශේෂ හෙලිදරව් කිරීම් ද ඇතුලත්ව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කර ඇති බව සඳහන් ප්‍රකාශයක්. | අනුකූල වී ඇත<br><br>වාර්ෂික වාර්තාවේ පිටු අංක 104 සිට 105 දක්වා වූ මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය පරිශීලනය කරන්න. | | නැත |
| (ආ) මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසවන්තභාවය පිළිබද සාධාරණ සහතිකයක් ලැබෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බවත් අදළ ගිනුම්කරණ ප්‍රමිතීන් හා නියාමන අවශ්‍යතාවයන්ට අනුව බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශණ පිලියෙළ කර ඇති බවත් සහතික කරන්නාවූ බැංකු අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිලිබඳව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්. | අනුකූල වී ඇත<br><br>වාර්ෂික වාර්තාවේ පිටු අංක 46 සිට 47 දක්වා පරිශීලනය කරන්න. | | නැත |
| (ඇ) 2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව සකස් කරන හෝ ප්‍රසිද්ධ කරන ඕනෑම ප්‍රකාශනයකට අදාළව ඉහත 3(8)(ii)(ආ) හි සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායීත්වය පිලිබඳ බාහිර විගණකයින්ගෙන් වාර්තාවක් ලබා ගත යුතුය. | අනුකූල වී ඇත | | නැත |

| මාර්ගෝපදේශය | අනුකූලතාවය | අදාළ නොවේ | විගණකවරුන්ගේ සොයාගැනීම් |
|---|---|---|---|
| (ඇ) අධ්‍යක්‍ෂවරුන්ගේ නම්, සුදුසුකම්, යෝග්‍යතාවය, බැංකුව සමග කල ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවන ලද මුලු පාරිශ්‍රමික ඇතුලත් අධ්‍යක්‍ෂවරුන්ගේ විස්තරය. | අනුකූල වී ඇත | | නැත |
| (ඉ) 3(7) (iii) හි අර්ථ දක්වා ඇති එකිනෙක වර්ගයේ සම්බන්ධිත පාර්ශවයන්ට ප්‍රදනය කල මුළු ශුද්ධ ණය පහසුකම්. එකිනෙක වර්ගයේ සම්බන්ධිත පර්ශවයන්ට ප්‍රදානය කළ ශුද්ධ මුළු ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රග්ධනයේ ප්‍රතිශතයක් ලෙස හෙලිදරව් කල යුතුය. | අනුකූල වී ඇත | | නැත |
| (ඊ) පාරිශ්‍රමික ගෙවීම්, ප්‍රදානය කල ණය පහසුකම් සහ තැන්පතු හෝ බැංකුවේ කර ඇති ආයෝජන යනාදී පුළුල් කාණ්ඩයන් යටතේ බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ගෙවූ පාරිශ්‍රමික වල මුළු එකතුව සහ බැංකුව සමග ප්‍රධාන කළමනාකරණ පිරිස් සිදු කල ගනුදෙනු වල මුළු වටිනාකම. | අනුකූල වී ඇත<br><br>පිටු අංක 121 හි මූල්‍ය ප්‍රකාශන වල සටහන් 6.1 පරිශීලනය කරන්න. | | නැත |
| (උ) 2016 ජනවාරි 01 දිනෙන් පසුව ප්‍රසිද්ධ කළ වාර්ෂික සාංග මික යහපාලන වාර්තාවල මෙම විධානයන්ට අනුකූල බවට බාහිර විගණකවරුන්ගේ සහතිකයක්. | අනුකූල වී ඇත | | නැත |
| (ඌ) විචක්‍ෂණශීලි අවශ්‍යතා, නියාමන, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමග අනුකූල බවට සහ ප්‍රමාණාත්මක අනුකූල නොවීම් නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර ඇතුලත් වාර්තාවක්. | අනුකූල වී ඇත<br><br>පිළිවෙළින් වාර්ෂික වාර්තාවේ පිටු අංක 41 සිට 45 දක්වා, 104 සිට 105 දක්වා සහ 46 සිට 47 දක්වා වූ අධ්‍යක්‍ෂවරුන්ගේ වාර්තාව, මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය සහ අභ්‍යන්තර පාලනයන් මත ප්‍රකාශනය පරිශීලනය කරන්න. | | නැත |
| (එ) මුදල් මණ්ඩලය විසින් මහජනතාවට හෙලිදරව් කලයුතු බවට විධානය කර ඇත්නම්, බැංකු අධීක්‍ෂණ අධ්‍යක්‍ෂ විසින් පෙන්වා දී ඇති බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුපාඩු සම්බන්ධ නියාමන හා අධීක්‍ෂණ සැලකිල්ලට යොමු වූ කරුණු සහ එවැනි සලකා බැලීම් නිවැරදි කිරීමට ගත් පියවරයන් ඇතුලත් වාර්තාවක්. | | අදාළ නොවේ | අදාළ නොවේ |

# අනුකූලතා සමාලෝචනය

**දෙවන කොටස**

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඒකාබද්ධව නිකුත් කරන ලද සාංගමික යහපාලනය සම්බන්ධයෙන් වූ මනා පරිචයන් පිළිබඳ සංග්‍රහයට HDFC බැංකුවේ අනුකූලතාවය

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| A. අධ්‍යක්ෂවරු | | | | |
| A.1 අධ්‍යක්ෂ මණ්ඩලය | අනුකූල වී ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක නොවන අධ්‍යක්ෂවරු පමණක් ඇතුළත් වේ. නිවැරැදි නායකත්වයක් ලබා දිය හැකි පිළිගත් පුද්ගලයින්ගෙන් සැදුම්ලත් සමබර මිශ්‍රණයක් අධ්‍යක්ෂ මණ්ඩලය තුළ පවත්වා ගනී. කරුණාකර අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු පැතිකඩ පරිශීලනය කරන්න. | | | |
| A.1.1<br>1. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | අනුකූල වී ඇත.<br><br>3(1)(iii) ශ්‍රී ලංකා මහ බැංකු නියමය සඳහා වූ අනුකූලතා තත්ත්වය පරිශීලනය කරන්න. | | | |
| A.1.2<br>2. අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් | අනුකූල වී ඇත.<br><br>බැංකුවේ සමස්ථ යහපාලනය සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. එයට තිරසාර ව්‍යාපාර උපායමාර්ග නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධති පවත්වාගැනීම, වෘත්තීය අත්දැකීම් හා විශේෂඥ දැනුම සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් බඳවා ගැනීම, නීති,නියාමන හා ප්‍රමිතීන් සමග අනුකූල වීම, කොටස් හිමියන්ගේ කැමැත්ත සඳහා සාංග මික තීරණ ගැනීමේදී වූ විනිවිද යාන්ත්‍රණ වැනි දෑ ඇතුලත් වේ. | | | |
| A.1.3<br>3. ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම | අනුකූල වී ඇත. | | | |

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| A.1.4<br>4 . අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | අනුකූල වී ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සමාගම සහ කොටස් හිමියන් අතර අතරමැදි භූමිකාවක් දරන අතර බැංකුවට අදාළ වන්නා වූ නීති වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාමාර්ග දියත් වන බව සහතික කිරීම සඳහා සියළු අධ්‍යක්ෂවරුන්ට උපදෙස් හෝ සේවා ලබාගත හැක. ඇය නීතිඥවරියෙකි. | | | |
| A.1.5<br>5. ස්වාධීන විනිශ්චය | අනුකූල වී ඇත. | | | |
| A.1.6<br>6. අධ්‍යක්ෂ මණ්ඩලය හා මණ්ඩල කමිටු ප්‍රමාණවත් කාලයක් වැය කිරීම හා මහන්සියක් දැරීම | අනුකූල වී ඇත. | | | |
| A.1.7<br>7. නව අධ්‍යක්ෂවරු සඳහා පුහුණුව | අනුකූල වී ඇත. | | | |
| A.2 සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී | | | | |
| A.2.1<br>8. සභාපතිවරයාගේ හා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ වගකීම් බෙදා වෙන්කිරීම | අනුකූල වී ඇත. | | | |
| A.3 සභාපතිවරයාගේ භූමිකාව | | | | |
| A.3.1<br>9. සභාපතිවරයාගේ භූමිකාව | අනුකූල වී ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩල හා කොටස්හිමි රැස්වීම් සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබේ. | | | |
| A.4 මූල්‍ය විචක්ෂණභාවය | | | | |
| A.4<br>10. ප්‍රමාණවත් මූල්‍ය විචක්ෂණභාවයක් හා දැනුමක් තිබෙන බව | අනුකූල වී ඇත. | | | |
| A.5 අධ්‍යක්ෂ මණ්ඩල තුලනාත්මකතාවය | | | | |
| A.5.1<br>11. අධ්‍යක්ෂ මණ්ඩලය තුළ ශක්තිමත් ස්වාධීන අංගයක් තිබීම. | අනුකූල වී ඇත. | | | |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| A.5.2<br>A.5.3<br>12. ස්වාධීන අධ්‍යක්ෂවරු | අනුකූල වී ඇත. | | | |
| A.5.4<br>13. විධායක නොවන අධ්‍යක්ෂවරු විසින් අත්සන් කළ ස්වාධීනභාවය පිළිබඳ ප්‍රකාශය | අනුකූල වී ඇත. | | | |
| A.5.5<br>14. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ වරුන්ගේ ස්වාධීනභාවය නිර්ණය කිරීම | අනුකූල වී ඇත.<br><br>සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු පහත පරිදි වේ.<br><br>01. ආර්. ජේ. සිල්වා මහතා (සභාපති)<br>02. ප්‍රසාද් ගල්හේන මහතා<br>03. බී. ජී. එස්. ගුණතිලක මහත්මිය (2016.07.26 දින ඉවත් වූ)<br>04. ආර්. එම්. ජේ රත්නායක මහතා (2016 ජූනි මස ඉවත් වූ)<br>05. ආර්. එච්. මීවක්කල මහතා<br>06. එස්. එම්. ජී. ජයරත්න මහතා<br>07. ඩී. පී. විමලසේන මහතා<br>08. එල්. ජයසිංහ මහතා<br>09. ආර්. ඒ. චූලානන්ද මහත්මිය | | | |
| A.5.6<br>15. ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරු | | | | අදාළ නොවේ. |
| A.5.7<br>16. ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරු සමග රහස්‍ය සාකච්ඡා | | | | අදාළ නොවේ. |
| A.5.8<br>17. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් | අනුකූල වී ඇත. | | | |
| A.5.9<br>18. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා වල වැදගත් කරුණු වාර්තා කිරීම. | අනුකූල වී ඇත. | | | |

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| A.6 තොරතුරු සැපයීම | | | | |
| A.6.1<br>19. කළමනාකරණය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට තොරතුරු ලබාදීම | අනුකූල වී ඇත.<br><br>සාකච්ඡා කිරීමට හා සමාලෝචනය කිරීමට ප්‍රමාණවත් කාලයක් සහිතව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර කාලීන, නිවැරදි, අදාළ සහ විස්තීර්ණ තොරතුරු අධ්‍යක්ෂවරුන්ට සපයනු ලැබේ. | | | |
| A.6.2<br>20. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ප්‍රමාණවත් කාලය | අනුකූල වී ඇත. | | | |
| අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් | | | | |
| අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් | අනුකූල වී ඇත. | | | |
| A.7.1<br>21. නාම යෝජනා කමිටුව | අනුකූල වී ඇත.<br><br>වැඩිදුර තොරතුරු සඳහා පිටු අංක 52 හි වූ නාම යෝජනා කමිටු වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| A.7.2<br>22. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය තක්සේරුව | අනුකූල වී ඇත.<br><br>නාම යෝජනා කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සමාලෝචනය කරන අතර අවශ්‍ය නිර්දේශයන් කරනු ලැබේ. | | | |
| A.7.3<br>23. නව අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු කොටස් හිමියන්ට අනාවරණය කිරීම | අනුකූල වී ඇත.<br><br>සියළු අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කර ඇත. | | | |
| A.8 නැවත පත්වීම | | | | |
| A.8.1<br>24. විධායක නොවන අධ්‍යක්ෂවරුන් පත්කිරීම | අනුකූල වී ඇත.<br><br>1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතට (2003 අංක 15 සහ 2011 අංක 45 දරන පනත් මඟින් සංශෝධිත) අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සකස් වී ඇත. | | | |
| A.8.2<br>25. කොටස්හිමියන් විසින් අධ්‍යක්ෂවරුන් තෝරා පත්කිරීම | අනුකූල වී ඇත.<br><br>නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතට අනුව සෑම කොටස් හිමි අධ්‍යක්ෂවරයෙක්ම සෑම වසර තුනකට වරක්ම නැවත පත්විය යුතුය | | | |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| අධ්‍යක්‍ෂ මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම් | | | | |
| A.9 අධ්‍යක්‍ෂ මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම් | | | | |
| A.9.1<br>26. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම් | අනුකූල වී ඇත. | | | |
| A.9.2<br>27. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ හා එහි කමිටු වල වාර්ෂික ස්වයං ඇගයීම | අනුකූල වී ඇත. | | | |
| A.9.3<br>28. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ හා එහි උපකමිටු වල කාර්යසාධන ඇගයීම් ක්‍රම අනාවරණය | අනුකූල වී ඇත. | | | |
| අධ්‍යක්‍ෂවරු සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කිරීම | | | | |
| A.10<br>අධ්‍යක්‍ෂවරු සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කිරීම | අනුකූල වී ඇත. | | | |
| A.10.1<br>29. අධ්‍යක්‍ෂවරුන් සම්බන්ධ තොරතුරු | අනුකූල වී ඇත.<br><br>වාර්ෂික වාර්තාවේ පිටු අංක 92 සිට 95 දක්වා වූ අධ්‍යක්‍ෂ මණ්ඩල තොරතුරු පැතිකඩයන්හි අධ්‍යක්‍ෂවරුන්ට අදාළ තොරතුරු සපයා ඇත. | | | |
| ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී පිළිබඳ ඇගයීම | | | | |
| A.11<br>ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී පිළිබඳ ඇගයීම | අනුකූල වී ඇත. | | | |
| A.11.1<br>30. ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී සඳහා මූල්‍ය ඉලක්ක | අනුකූල වී ඇත.<br><br>බැංකුවේ සාංගමික සැලැස්මට සමගාමීව | | | |
| A.11.2<br>31. ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යසාධන ඇගයීම | අනුකූල වී ඇත. | | | |

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| B අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | | | | |
| B.1 පාරිශ්‍රමික ක්‍රියාපටිපාටි | අනුකූල වී ඇත.<br><br>බැංකුවේ අධ්‍යක්ෂවරු පාරිතෝෂික සඳහා හිමිකම් නොලබන අතර මුදල් අමාත්‍යංශය නියම කර ඇති පරිදි දීමනාවක් ලැබෙනු ඇත. | | | |
| B.1.1<br>32. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව | අනුකූල වී ඇත.<br><br>මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පාරිශ්‍රමික ප්‍රතිපත්තිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට උපකාරී වේ. | | | |
| B.1.2<br>33. මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සංයුතිය | අනුකූල වී ඇත.<br><br>වාර්ෂික වාර්තාවේ පිටු අංක 50 සිට 51 දක්වා වූ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| B.1.4<br>34. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | | | | අදාළ නොවේ. කරුණාකර B.1 පරිශීලනය කරන්න |
| B.1.5<br>35. සභාපතිවරයාගේ උපදේශනය සහ වෘත්තීය උපදෙස් සඳහා පිවිසීම | අනුකූල වී ඇත.<br><br>අවශ්‍යතාවය මත බාහිර වෘත්තීමය උපදෙස් ලබාගන්නා ලදී. | | | |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| පාරිශ්‍රමික මට්ටම් හා සැකැස්ම | | | | |
| B.2 පාරිශ්‍රමික මට්ටම් හා සැකැස්ම<br>B.2.1<br>36. විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මට්ටම් හා සැකැස්ම<br><br>B.2.2<br>37. අනෙකුත් සමාගම් සමග පාරිශ්‍රමික සැසඳීම<br><br>B.2.3<br>38. සමූහයේ අනෙකුත් සමාගම් සමග පාරිශ්‍රමික සැසඳීම<br><br>B.2.4<br>39. විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට කාර්යසාධනයට අදාළ ගෙවීම්<br><br>B.2.5<br>40. අධ්‍යක්ෂවරු සඳහා විධායක කොටස් යෝජනා ක්‍රම<br><br>B.2.6<br>41. විධායක අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සැකසීම<br><br>B.2.7<br>42. අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රතිලාභ කලින් නතර කිරීම්<br><br>B.2.8<br>43. අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රතිලාභ කලින් නතර කිරීම් (මූලික ගිවිසුමේ ඇතුලත් කර නැති)<br><br>B.2.9<br>44. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මට්ටම | | | | අදාළ නොවේ. කරුණාකර B.1 හි අදහස් පරිශීලනය කරන්න |

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| B.3 පාරිශ්‍රමික අනාවරණය කිරීම | | | | |
| B.3.1<br>45. පාරිශ්‍රමික අනාවරණය කිරීම | අනුකූල වී ඇත.<br><br>කරුණාකර B.1 අදහස පරිශීලනය කරන්න | | | |
| C කොටස්හිමියන් සමඟ සම්බන්ධතා | | | | |
| C.1<br>වාර්ෂික මහා සභා රැස්වීමේ ඵලදායී භාවිතය හා රැස්වීම් පැවැත්වීම | අනුකූල වී ඇත. | | | |
| C.1.1<br>46. පෙරකලාසි ඡන්දය භාවිතා කිරීම | අනුකූල වී ඇත.<br><br>සියළුම පෙරකලාසි ඡන්ද වාර්තා කිරීමේ ක්‍රමයක් බැංකුව සතුව ක්‍රම වේදයක් ඇති අතර සෑම යෝජනාවක් වෙනුවෙන් කොටස් හිමියන් පෙරකලාසි ඡන්ද තැන්පත් කරනු ලැබේ. | | | |
| C.1.2<br>47. වෙන් වෙන් කරුණු සඳහා වෙන් වෙන් යෝජනා ඉදිරිපත් කිරීම | අනුකූල වී ඇත. | | | |
| C.1.3<br>48. සියළුම උපකමිටු සභාපතිවරුන් වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වීම | අනුකූල වී ඇත. | | | |
| C.1.4<br>49. වාර්ෂික මහා සභා රැස්වීම සඳහා ප්‍රමාණවත් දැනුම්දීමක් සිදුකිරීම | අනුකූල වී ඇත. | | | |
| C.1.5<br>50. මහා සභා රැස්වීමේදී ඡන්ද දෙන ක්‍රියාපිලිවෙත් | අනුකූල වී ඇත. | | | |
| ප්‍රධාන ගණුදෙනු | | | | |
| C.2<br>ප්‍රධාන ගණුදෙනු | අනුකූල වී ඇත. | | | |
| C.2.1<br>51. ප්‍රධාන ගණුදෙනු | අනුකූල වී ඇත.<br><br>2007 අංක 07 දරන සමාගම් පනතේ 185 වගන්තිය නිර්වචනය කරන ඍෲ බැංකුවේ ශුද්ධ වත්කම් පදනම සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කළ හැකි ප්‍රධාන ගණුදෙනු සිදුවී නොමැත. | | | |
| D. විගණනය හා වගවීම | | | | |
| D.1 මූල්‍ය වාර්තාකරණය | අනුකූල වී ඇත. | | | |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| D.1.1<br>52. ව්‍යවස්ථාපිත හා නියාමන වාර්තාකරණය | අනුකූල වී ඇත.<br><br>2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සහ 2016 වර්ෂයේ සෑම කාර්තුවක් අවසානයේම මූල්‍ය තත්වය පිලිබඳව සත්‍ය හා සමබර තක්සේරුවක් ඍෂඤ බැංකුව වාර්තා කර ඇත.<br><br>2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සහ 2016 වර්ෂයේ සෑම කාර්තුවක් අවසානයේම අදාළ මූල්‍ය ප්‍රකාශන අවශ්‍යතාවය පරිදි පුවත්පත් වලින් ප්‍රසිද්ධ කිරීම.<br><br>ශ්‍රී ලංකා විගණකාධිපති HDFC බැංකුවේ බාහිර විගණක වේ. | | | |
| D.1.2<br>53. වාර්ෂික වාර්තාවේ දැක්වෙන අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | අනුකූල වී ඇත.<br><br>වාර්ෂික වාර්තාවේ පිටු අංක 41 සිට 45 දක්වා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව අන්තර්ගත වේ. | | | |
| D.1.3<br>54. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය | අනුකූල වී ඇත.<br><br>වාර්ෂික වාර්තාවේ පිටු අංක 104 සිට 105 දක්වා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනය අන්තර්ගත වේ. | | | |
| D.1.4<br>55. කළමනාකරණ සාකච්ඡා හා විශ්ලේෂණය | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 17 සිට 23 දක්වා පරිශීලනය කරන්න. | | | |
| D.1.5<br>56. ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය | අනුකූල වී ඇත.<br><br>වාර්ෂික වාර්තාවේ පිටු අංක 41 සිට 45 දක්වා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව තුළ මෙය අන්තර්ගත වේ. | | | |
| D.1.6<br>57. බරපතල ප්‍රාග්ධන හානි දැනුම් දීම සඳහා අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම | | | | අදාළ නොවේ |
| අභ්‍යන්තර පාලනය | | | | |
| D.2 අභ්‍යන්තර පාලනය | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 46 සිට 47 දක්වා වූ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් වූ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත වාර්තාව පරිශීලනය කරන්න. | | | |

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| D.2.1<br>58. අභ්‍යන්තර පාලන පද්ධතියේ වාර්ෂික ඇගයීම | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 46 සිට 47 දක්වා වූ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් වූ අධ්‍යක්‍ෂවරුන්ගේ ප්‍රකාශය මත වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| D.2.2<br>59. අභ්‍යන්තර විගණන කටයුතුවල අවශ්‍යතාවය | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 57 සිට 58 දක්වා වූ විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| විගණන කමිටුව | | | | |
| D.3 විගණන කමිටුව | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 57 සිට 58 දක්වා වූ විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| D.3.1<br>60. විගණන කමිටුවේ සංයුතිය සහ නියමයන් හා කොන්දේසි. | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 57 සිට 58 දක්වා වූ විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| D.3.2<br>61. විගණන කමිටුවේ කාර්යයන් | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 57 සිට 58 දක්වා වූ විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| D.3.3<br>62. විගණන කමිටුවේ නියමයන් හා යොමුව | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 57 සිට 58 දක්වා වූ විගණන කමිටු වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| D.3.4<br>63. විගණන කමිටුවේ හෙළිදරව් කිරීම් | අනුකූල වී ඇත.<br><br>සාමාජිකත්වය සඳහා පිටු අංක 57 පරිශීලනය කරන්න. | | | |
| ව්‍යාපාර ආචාරධර්ම හා චර්යා සංග්‍රහය | | | | |
| D.4 ව්‍යාපාර ආචාරධර්ම හා චර්යා සංග්‍රහය | අනුකූල වී ඇත.<br><br>ව්‍යාපාර ආචාරධර්ම හා චර්යා ආවරණය වන පරිදි බොහෝමයක් ප්‍රතිපත්ති බැංකුව යොදාගෙන ඇත. | | | |
| D.4.1<br>64. ව්‍යාපාර ආචාරධර්ම හා චර්යා සංග්‍රහය | අනුකූල වී ඇත. | | | |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| D.4.2<br>65. ව්‍යාපාර ආචාරධර්ම හා චර්යා සංග්‍රහය සහතික කිරීම | | | | අදාළ නොවේ. ඉහත D.4.2 හි සඳහන් කර ඇති ආකාරයට |
| E ආයතනික ආයෝජකයින් | | | | |
| E.1 කොටස් හිමියන්ගේ ඡන්දය භාවිතා කිරීම | අනුකූල වී ඇත.<br><br>ආයතනික කොටස් හිමියන් ඔවුන්ගේ ඡන්දය භාවිතා කිරීම අවශ්‍ය වන අතර ඔවුන්ගේ ඡන්ද අරමුණ ප්‍රායෝගික කල යුතුය. | | | |
| E.1.1<br>66. ආයතනික කොටස් හිමියන් | අනුකූල වී ඇත.<br><br>ඡන්දය භාවිතා කිරීමට ආයතනික කොටස් හිමියන් දිරිමත් කළ යුතු අතර ආයෝජනය සහ ආයෝජනයෙන් ඉවත් වීම පිළිබඳ ස්වාධීන උපදෙස් ලබාගැනීමට දිරිගැන්විය යුතුය. | | | |
| E.2 සාංගමික යහපාලන ක්‍රියාමාර්ග ඇගවීම් | අනුකූල වී ඇත. | | | |
| F වෙනත් ආයෝජකයින් | | | | |
| F.1 ආයෝජනය කිරීමේ/ ආයෝජනයෙන් බැහැරවීමේ තීරණ<br><br>සමාගමේ ඍජුව ආයෝජනය කරන පුද්ගල කොටස් හිමියන්ට ප්‍රමාණවත් විශ්ලේෂණයක් සිදුකිරීමට හෝ ආයෝජනය කිරීමට හෝ ඉන් බැහැර වීම සඳහා ස්වාධීන උපදෙස් ලබාගැනීමට දිරි ගැන්වීම. | අනුකූල වී ඇත. | | | |
| F.2 කොටස් හිමියන්ගේ ඡන්දය භාවිතා කිරීම | අනුකූල වී ඇත. | | | |
| F.2.1<br>67. පුද්ගල කොටස් හිමියන්ගේ ඡන්දය භාවිතා කිරීම | අනුකූල වී ඇත.<br><br>මහාසභා රැස්වීම් වලට පුද්ගල කොටස් හිමියන්ගේ සහභාගීත්වය හා ඔවුන්ගේ ඡන්ද බලය භාවිතා කිරීම බැංකුව අගය කරනු ලැබේ. | | | |

තෙවන කොටස

සාංගමික යහපාලනය මත ලැයිස්තුගත සමාගම් සඳහා කොළඹ කොටස් හුවමාරුව නිකුත් කළ අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ නීති වල 7.10 වගන්තිය සඳහා HDFC බැංකුවේ අනුකූලතාවය.

| මාර්ගෝපදේෂය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| 7.10.1 (a) සිට (c)<br>(i) අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නිවැරදි ගණන තහවුරු කිරීම | අනුකූල වී ඇත. | | | |
| 7.10.2 (a)<br>(ii) අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නිවැරදි ගණන තහවුරු කිරීම | අනුකූල වී ඇත. | | | |
| 7.10.2 (b)<br>(iii) අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන හෝ ස්වාධීන නොවන බව පිළිබඳ වාර්ෂික ප්‍රකාශනය | අනුකූල වී ඇත. | | | |
| 7.10.3 (a)<br>(iv) අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන හෝ ස්වාධීන නොවන බව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික නිර්ණය කිරීම. | අනුකූල වී ඇත. | | | |
| 7.10.3 (b)<br>(v) අධ්‍යක්ෂවරු සම්පූර්ණ නොකළ සුදුසුකම් | | | | අදාළ නොවේ. |
| 7'10'3 (c)<br>(vi) එකිනෙක අධ්‍යක්ෂවරයා පිළිබඳ තොරතුරු සාරාංශය | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 92 සිට 95 දක්වා වූ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු පරිශීලනය කරන්න. | | | |
| පාරිශ්‍රමික වලට අදාළ අනාවරණයන් සහ පාරිශ්‍රමික කමිටුව | | | | |
| 7.10.5 (a)<br>(vii) පාරිශ්‍රමික කමිටුව තුළ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නිවැරදි ගණන | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 37 පරිශීලනය කරන්න. | | | |
| 7.10.5 (a)<br>(viii) වෙන්වූ පාරිශ්‍රමික කමිටුව | අනුකූල වී ඇත. | | | |
| 7.10.5 (c)<br>(ix) පාරිශ්‍රමික කමිටුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 37 පරිශීලනය කරන්න. | | | |

# අනුකූලතා සමාලෝචනය

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| 7.10.5 *(b)*<br>*(x)* පාරිශ්‍රමික කමිටුවේ කාර්යයන් | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 50 සිට 51 දක්වා වූ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| 7.10.5 *(a)*<br>*(xi)* පාරිශ්‍රමික කමිටුවේ සභාපතිවරයා | අනුකූල වී ඇත.<br><br>එම් සුරේන්ද්‍රන් මහතා (විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ) | | | |
| 7.10.5 *(c)*<br>*(xii)* පාරිශ්‍රමික ප්‍රතිපත්තිය | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 50 සිට 51 දක්වා වූ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව පරිශීලනය කරන්න. | | | |
| 7.10.5 *(c)*<br>*(xiii)* විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවූ පාරිශ්‍රමික වල එකතුව (මුදල් සහ මුළු මුදල් නොවන ප්‍රතිලාභද ඇතුළුව) | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 121 හි මූල්‍ය ප්‍රකාශන සටහන් 07 පරිශීලනය කරන්න. | | | |
| විගණන කමිටු වාර්තාව යටතේ අන්තර්ගතය | | | | |
| 7.10.6 *(a)*<br>*(xv)* අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ නිවැරැදි ගණන | අනුකූල වී ඇත.<br><br>නීති 7.10.6 *(a)* ට අනුව අවශ්‍ය කරන විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් ගණනින් විගණන කමිටුව සමන්විත බව HDFC බැංකුව තහවුරු කොට ඇත | | | |
| 7.10.6 *(a)* සහ 7.10.6 *(c)*<br>*(xv)* වෙන්වූ විගණන කමිටුව | අනුකූල වී ඇත.<br><br>HDFC බැංකුව වෙන්වූ විගණන කමිටුවක් පිහිටුවා ඇත. | | | |

| මාර්ගෝපදේශය | සම්පූර්ණ අනුකූලතාවය | අර්ධ අනුකූලතාවය | අනුකූල නොවීම | අදාළ නොවේ |
|---|---|---|---|---|
| *7.10.6 (c)*<br>(xv) විගණන කමිටුව තුළ වූ අධ්‍යක්‍ෂවරුන්ගේ නම් | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 57 සිට 58 දක්වා පරිශීලනය කරන්න. | | | |
| *7.10.6 (b)*<br>විගණන කමිටුවේ කාර්යයන් | අනුකූල වී ඇත.<br><br>විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු නියෝග 3(6) හා මූල්‍ය චක්‍රලේඛන යටතේ අනිවාර්ය කල කාර්යයන්හි නියළී සිටී. | | | |
| *7.10.6 (a)* සහ *7.10.6 (c)*<br>විගණන කමිටුවේ සභාපතිවරයා | අනුකූල වී ඇත.<br><br>එම් සුරේන්ද්‍රන් මහතා (විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්‍ෂ) | | | |
| *7.10.6 (a)* සහ *7.10.6 (c)*<br>සභාපතිවරයාගේ සුදුසුකම් | අනුකූල වී ඇත.<br><br>පිටු අංක 92 සිට 95 දක්වා වූ අධ්‍යක්‍ෂ මණ්ඩල තොරතුරු පරිශීලනය කරන්න. | | | |
| *7.10.6 (a)* සහ 7.10.6 *(c)*<br>කමිටු රැස්වීම් සඳහා ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ පැමිණීම | අනුකූල වී ඇත. | | | |
| *7.10.6 (c)*<br>බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය | | | | අදාළ නොවේ<br><br>ශ්‍රී ලංකා විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ. |

# අධ්‍යක්ෂ මණ්ඩලය













1. ආර්. ජේ සිල්වා මහතා(සභාපති)
   විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ

2. එම් සුරේන්ද්‍රන් මහතා
   විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

3. ආර්.ජ් චූලානන්ද මහත්මිය
   විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ

4. ආර්. එච් මීවක්කල මහතා
   විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ

5. එල් ජයසිංහ මහතා
   විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ

6. එල්. එස් පලන්සූරිය මහතා
   විධායක නොවන/ස්වාධීන නොවන අධ්‍යක්ෂ

7. ප්‍රසාද් ගල්හේන මහතා
   විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ

8. ඩී. පී විමලසේන මහතා
   විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ

9. එස්.එම් ගෝඨාභය ජයරත්න මහතා
   විධායක නොවන/ස්වාධීන අධ්‍යක්ෂ


05


06


07


08


09

# අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු

**ආර්.ජේ ද සිල්වා මහතා (සභාපති)**

**(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)**

සිල්වා මහතා වෘත්තියෙන් නීතිඥයකු වන අතර අපරාධ හා කම්කරු නීතිය පිළිබඳ විද්වතෙකි. එතුමන් 1977 දී ප්‍රථම පන්තියේ ගෞරව සම්මාන සහිතව නීති උපාධිය හිමිකර ගත්තේය.

2015 පෙබරවාරි මාසයේදී HDFC බැංකුවේ සභාපති ධූරයට පත්විය.

එතුමන් 1982 සිට ආයතන ගණනාවක විවිධ ප්‍රධාන තනතුරු දැරූ අයෙකි. මීට පෙර ජාතික ලොතරැයි මණ්ඩලය(1982-1989), ජාතික රක්ෂණ සංස්ථාව (1989-1990) හා රාජ්‍ය ස්කාගාර සංස්ථාව(1990-1992) යන ආයතනවල සභාපතිධුර වල කටයුතු කරන ලදී. රාජ්‍ය ආයතන පුද්ගලීකරණය කිරීමට පෙර අවධියේ පොදු ආයෝජන කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් භාණ්ඩාගාර ලේකම්ගේ විශේෂ අනුමැතිය පරිදි රාජ්‍ය ආයතන 37 ක කළමනාකරණ අධීක්‍ෂණ කටයුතු දැරීම හා පුද්ගලික අංශයේ ක්‍රියාත්මක වූ ක්‍රියාවලීන් එකී ආයතනවලට හඳුන්වාදීම සිදුකොට එම ආයතන පූර්ණ රාජ්‍ය ආයතන බවට පත්කිරීම සඳහා කටයුතු සිදු කළේය. තවද 1994 දී රාජ්‍ය භාණ්ඩාගාරයේ නීති උපදේශක ලෙසද කටයුතු කර ඇත. එම වර්ෂයේම ශ්‍රී ලංකාවේ ප්‍රථම ජීවිත රක්ෂණ සමාගම ආරම්භ කිරීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියාකොට එම සමාගමේ ප්‍රථම කළමනාකරණ අධ්‍යක්‍ෂවරයා ලෙස 1998 අවසාන වන තෙක් එම තනතුරු හෙබවීය. ජනශක්ති ජීවිත රක්ෂණ සමාගම සාර්ථකව මෙහෙයවීමෙන් අනතුරුව එතුමන් 1999-2001 කාලපරිච්ඡේදය තුල හච්සන් ටෙලිකොම් සමාගමෙහි මානව සම්පත් හා නීති කටයුතු පිළිබඳ උපදේශකවරයකු ලෙස ක්‍රියා කළේය. අනතුරුව හූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ තාක්ෂණික සේවා පුද්ගලික සමාගමේ සභාපති ධුර හෙබවූ එතුමන් 2004 දී නිල නොවන නීති සංගමය සඳහා නැවත ඇතුල්විය.

**එම්.සුරේන්ද්‍රන් මහතා**

**(විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ)**

එම්. සුරේන්ද්‍රන් මහතා 2013 ජූනි මස HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ අතර එතැන් සිට මේ දක්වා බැංකුවේ ප්‍රගමනය කෙරෙහි විවිධ අංශ ඔස්සේ සාර්ථක වැඩසටහන් රාශියකට මූලිකත්වය සපයා ඇත.

එම්. සුරේන්ද්‍රන් මහතා අලෙවි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියකු මෙන්ම ව්‍යාපාර කලමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකි. එතුමන් සිය වෘත්තීය ජීවිතය KPMG සමාගම ඔස්සේ ආරම්භ අතර මූල්‍ය ක්ෂේත්‍රයේ මේ දක්වා වසර 25 ක පළපුරුද්දක් ඇත.

එම්. සුරේන්ද්‍රන් මහතා ෆ්‍රී ලංකා ට්‍රේඩිං (පුද්) සමාගමේ ආයෝජන විශ්ලේෂකයකු ලෙස බැදී එහි මූල්‍ය හා අනිකුත් ව්‍යාපාර ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් අවබෝධයක් ලඟාකරගෙන ඇත. එම සමූහය සතුව පැවති අධික පාඩු ලැබ වසා දැමීමට තීරණය වූ ව්‍යාපාරයන් ඉන් මුදවා නැවත සාර්ථක ව්‍යාපර ලෙස හරවා සිය ව්‍යාපාර ශක්‍යතාවය පෙන්නුම්කොට ඇත.

එතුමන් ප(ර්)පෙචුවල් සමූහයේ මූල්‍ය අධ්‍යක්‍ෂධූරය දරන සමයෙහි එම ආයතනයට අයත්ව තිබූ ඩබ්ලිව්. එම් මෙන්ඩිස් සහ සමාගම නැවත ලාභ ලබන ව්‍යාපාරයක් බවට පරිවර්තනය කොට විදේශීය වෙළෙඳපොළට පිවිසීමට එම ක්ෂේත්‍රයේ විදෙස් ගත සුපිරි සන්නාම නාමයක් සහිත බකාඩි සමාගම සමඟ නිෂ්පාදන හා බෝතල් නිමැයුම් කර්මාන්තශාලා ඇතිකිරීමට හවුල්කාරීත්ව එකඟතාවයන් ඇතිකරගත්හ.

එම්. සුරේන්ද්‍රන් මහතා පුද්ගලික අංශයේ ව්‍යාපාර උපායමාර්ග උපදේශනය, ව්‍යාපාර සංකල්ප, ව්‍යාපෘති ඇගයීම්, සාංගමික ප්‍රගමනයන්, පුද්ගලීකරණය, සමාගම් ප්‍රති-ව්‍යුහගතකරණය, තක්සේරු කිරීම් සහ ඒකාබද්ධ කිරීම් හා අත්පත්කරගැනීම් පිළිබඳ හසල දැනුම ඇති අයෙකි.

**ආර්.ජේ චූලානන්ද මහත්මිය**

**(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)**

ආර්. ජේ. චූලානන්ද මහත්මිය 2016 අගෝස්තු මස HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබීය.

ආර්. ජේ. චූලානන්ද මහත්මිය දැනට (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ - ප්‍රථම ශ්‍රේණියේ නිලධාරී) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලෙස කටයුතු කරනු ලබන අතර ඇය රාජ්‍ය පරිපාලනයට එක් වූයේ 1991 දී කොළඹ මහ නගර සභාවේ සහකාර ලේකම්වරියක් ලෙස වැඩ භාර ගනිමිනි.

ඉන් අනතුරුව මෙතුමිය කහවත්ත, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල සහකාර ප්‍රාදේශීය ලේකම්වරිය ලෙසද, සොරන්තොට හා තිබිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ප්‍රාදේශීය ලේකම්වරිය ලෙසද අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර දිස්ත්‍රික් ලේකම්වරිය ලෙසද, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ කාන්තා කාර්යංශයේ අධ්‍යක්ෂවරිය ලෙසද කටයුතු කර ඇත.

මෙතුමිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කලා උපාධිධාරිනියක් වන අතර රජරට විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබාගෙන ඇත.

### ආර්. එච්. මීවක්කල්ල මහතා

**(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)**

මීවක්කල්ල මහතා වෘත්තිය අලෙවිකරුවෙක් වන අතර වරලත් අලෙවිකරණ ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකි. ඒ මහතා අන්තර්ජාතික අලෙවිකරණය පිළිබඳව ස්ට්‍රැච්ක්ලයිඩ් විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධියද, හොනලුලු විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධියද ලැබූවෙකි. අලෙවිකරණය පිළිබඳ වසර 25 ක වෘත්තීය අත්දැකීම් ලබා ඇති මෙතුමා ඉන් වසර 19 ක් සිලෝන් ටොබැකෝ සමාගමේ අලෙවි අධ්‍යක්ෂ වශයෙන් හා විධායක කමිටු සාමාජිකයකු ලෙස සේවය කොට ඇත. එමෙන්ම බ්‍රිටිෂ් - ඇමෙරිකන් ටොබැකෝ සමාගමේ කාම්බෝජයේ හා ලාඕසය යන රටවල සන්නාම අලෙවිකරණ ප්‍රධානියා ලෙස වසර 3 ක අන්තර්ජාතික ව්‍යාපාර පළපුරුද්ද ලබා ඇත. මීට අමතරව එම ආයතනයේ දකුණු ආසියානු අලෙවිකරණ නායකත්ව කණ්ඩායමේ සාමාජිකයකු ලෙසද කටයුතු කර ඇත. 2015 සැප්තැම්බර් මස මෙතුමා සිලෝන් ටොබැකෝ සමාගමෙන් සමුගන්නා අතර එම වසරේම ඔක්තෝබර් මස කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය මගින් පාලනය වන ශාඛා 309 කින් සමන්විත රජය යටතේ වූ ශ්‍රී ලංකාවේ විශාලතම සිල්ලර වෙළඳ ජාලය වන ලංකා සතොස ව්‍යාපාරයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කරනු ලැබීය. ඒ මහතා 2016 නොවැම්බර් මස එම සමාගමෙන්ද ඉවත් වූ අතර අනතුරුව ස්වකීය අලෙවිකරණ උපදේශන සමාගමක් ආරම්භ කරන ලදී.

### එල් ජයසිංහ මහතා

**(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)**

ලයනල් ජයසිංහ මහතා 2016 ජූනි මස HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබීය.

ජයසිංහ මහතා තොරතුරු පද්ධති පිළිබඳ උපදේශකයෙක් වන අතර තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 35 ක වෘත්තීය පළපුරුද්ද ලැබූ අයෙකි. හෙතෙම වෘත්තීය ව්‍යාපෘති කළමණාකරුවෙකු, සුදුසුකම්ලත් තොරතුරු පද්ධති විගණනවරයෙකු හා තොරතුරු පද්ධති විගණන හා නියාමනය පිළිබඳ සංගමයේ ශ්‍රී ලාංකීය ශාඛාවේ හිටපු සභාපතිවරයකු වේ.

ඔහු මෙරට තොරතුරු තාක්ෂණ සමාගම් හි මවු සංගමය වන ඉන්ෆෝ ලංකා සොස(ර්)යටි හි අධ්‍යක්ෂවරයකු ලෙසද කටයුතු කරන ලදී. හෙතෙම ජාතික මට්ටමේ ව්‍යාපෘතීන් වූ ටෙලිකොම් සමාගමේ හා විදුලි බිල්පත් සැකසීමේ තොරතුරු තාක්ෂණික ව්‍යාපෘති සඳහා සිය දායකත්වය සපයා ඇත.

මෙතුමා මෘදුකාංග ගුණාත්මක බව සහතිකකරණය හා මෘදුකාංග ඉංජිනේරු ප්‍රමිතීන් පිළිබඳ විශේෂඥයෙකි. ශ්‍රී ලංකාව තුල ප්‍රථම වරට සී.එම්.එම්. අයි 4 මට්ටමේ ව්‍යාපෘතියක් සාර්ථකව සම්පූර්ණ කිරීමට එතුමන් සමත් විය. ඔහු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සමුළු ගණනාවක තොරතුරු පද්ධති විගණනය, තොරතුරු තාක්ෂණික ව්‍යාපෘති කළමනාකරණය, මෘදුකාංග ගුණාත්මක බව සහතිකකරණය හා තොරතුරු සුරක්ෂිතකරණය පිළිබඳ දේශණ හා වැඩමුළු පවත්වා ඇත.

ඔහු දත්ත සමුදාය ගබඩාකරණය හා තොරතුරු පද්ධති විගණනය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී ශාස්ත්‍රපති උපාධිධාරියෙකි. එමෙන්ම කොළඹ විශ්ව විද්‍යාලයෙන් 1996 දී ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද ලබාගෙන ඇත.

ලයනල් ජයසිංහ මහතා ව්‍යාපෘති කළමනාකරණය ආයතනයේ (යූ.එස්.ඒ) ශ්‍රී ලංකා සංගමයේ ද, තොරතුරු පද්ධති විගණන හා නියාමනය පිළිබඳ සංගමයේ (යූ.එස්.ඒ) ද, බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේද සාමාජිකයකු වේ. මෑතකදී එතුමන් ඕමානයේ මහ බැංකුවේ තොරතුරු විගණන සේවාවන් සඳහා සිය වෘත්තීය දායකත්වය සපයා ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු

## එල් එස් පලන්සූරිය මහතා

**(විධායක නොවන, ස්වාධීන නොවන අධ්‍යක්ෂ)**

ලක්විජය සාගර පලන්සූරිය මහතා පසුගිය දශක තුනකට අධික කාලයක් පුරා නිවාස හා පදිංචි කිරීම් සම්බන්ධ සේවා කටයුතු වල නියැලී ඇත. එතුමා 1984 දී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කළමනාකාරවරයකු ලෙස පත්වීම් ලැබ අනතුරුව ජ්‍යෙෂ්ඨ කළමනාකාර, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා සාමාන්‍යාධිකාරී යන තනතුරු වලට උසස්වීම් ලැබීය.

1985 සිට ඒ මහතා එක්සත් ජාතීන්ගේ වාසභූමි වාර්ෂික සමුළුව සඳහා වන ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සාමාජිකයකු ලෙස එක්වී ඇති අතර පසුගිය වසර 30 ක කාලය තුල නිවාස හා පදිංචි කිරීම් සම්බන්ධව ක්‍රියා කොට ඇත. 2011 වසරේදී ඒ මහතා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ උපදේශකයකු ලෙසද අනතුරුව ජාතික නිවාස ලේකම් කාර්යාලයේ උපදේශකයකු ලෙසද ක්‍රියා කළේය. එම කාල වකවානුව තුළ ජාතික නිවාස ප්‍රතිපත්ති ප්‍රලේඛන කතෘ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කතෘවරයකු ලෙස සිය සේවාව සැපයීය.

වර්තමානයේ ඔහු ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති ලෙසද , නාගරික සංවර්ධන අධිකාරිය, Oceanview Development පුද්ගලික සමාගම, තේ, පොල්, රබර් ඉඩම් කැබලි කිරීම් පාලන මණ්ඩලය, සෙවන කළමනාකරන මණ්ඩලය යන ආයතනවල අධ්‍යක්ෂවරයකු ලෙසද සේවය කරයි.

පලන්සූරිය මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් සාමාන්‍යවේදී උපාධිය (1972) ලබා ඇති අතර 1982 දී කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සේවය කරන කාල වකවානුවේදී පිලිපීනයේ මැනිලා නුවර විශ්ව විද්‍යාලයෙන් කර්මාන්ත සංවර්ධන තොරතුරු පිළිබඳ උසස් ඩිප්ලෝමාව හිමිකරගෙන ඇත.

2005 දී ඒ මහතා Civil College of Singapore ආයතනයේ ඩිප්ලෝමාධාරියකු බවට පත්වීය.

තවද එතුමා 1985 සිට මේ දක්වා නිවාස හා පදිංචි කිරීම් සම්බන්ධව විවිධ ප්‍රකාශන, ලිපි හා වාර්තා රචනා කොට ඇත.

## ප්‍රසාද් ගල්හේන මහතා

**(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)**

ප්‍රසාද් ගල්හේන මහතා මහතා 2013 ජූනි මස HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබීය.

ගල්හේන මහතා එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරන අතර එක්සත් රාජධානියේ වරලත් අළෙවිකරණ ආයතනයේ සියලු ලිඛිත පරීක්ෂණ සමත්ව සිටී. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධියත්, ශාස්ත්‍රපති ව්‍යාපාර පරිපාලනවේදී (විශිෂ්ඨ සාමාර්ථ සහිත) උපාධියත් හිමිකරගෙන ඇත. ඔහු දැනට ඒ.ඒ.අයි.සී.ඕ ප්‍රෝප(ර්)ටි ඩිවලප්මන්ට් සමාග මේ සභාපතිත්වයද, ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයද, පොදු උපයෝගීතා කොමිසමේ සාමාජිකතත්වයද, එස්.එල්.ටී විෂන් කොම් ආයතනයේ අධ්‍යක්ෂධූරයද හොබවයි. ඒ මහතා මින් පෙර තිරසාරත්ව බලශක්ති අධිකාරිය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා නැව් සංස්ථාව හා ලක්සල යන ආයතනයන්හි සභාපතිත්වයද උසුලා ඇත. එමෙන්ම ඔහුට තිරසාරත්ව බලශක්ති, සාංගමික ප්‍රතිව්‍යුහගතකරණය, මූල්‍ය හා ව්‍යාපාර ආකෘතිකරණය යන ක්ෂේත්‍රයන්හි හසල දැනුමක් ලබා ඇත. තවද විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති කිහිපයකටම සිය දායකත්වය සපයා ඇත.

## ඩී. පී. විමලසේන මහතා

**(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)**

ඩී.පී විමලසේන මහතා 2016 ජූනි මස HDFC බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කරනු ලැබීය.

විමලසේන මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවයේ - ප්‍රථම ශ්‍රේණියේ නිලධාරී) 2015 වර්ෂයේ සිට මේ දක්වා මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස කටයුතු කරමින් සිටී. ඔහු දැනට මුදල් අමාත්‍යාංශයේ සමස්ත මූල්‍ය කළමනාකරණ අධීක්ෂණ කටයුතු මෙහයවයි. මීට අමතරව ඔහු මුදල් අමාත්‍යාංශයේ හා එහි පාලනයට යටත් ආයතනවල මූල්‍ය සම්පත් කාර්යක්ෂමව හා සඵලදායිව කළමනාකරණය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් හට සිය සහයෝගය ලබා දී ඇත.

විමලසේන මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී ගෞරව උපාධිය ලබා ඇති අතර මේ වන විට කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යා කලා ශාස්ත්‍රපති උපාධිය හදාරමින් සිටී.

**එස් එම් ගෝඨාභය ජයරත්න මහතා**

**(විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂ)**

ගෝඨාභය ජයරත්න මහතා 2016 පෙබරවාරි මස HDFC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලැබීය.

ගෝඨාභය ජයරත්න මහතා දැනට වෘත්තීය සමිති සබඳතා හා කම්කරු අමාත්‍යංශයේ ලේකම් ලෙස කටයුතු කරයි. ඒ මහතා පසුගිය වසර 32 ක කාල සීමාව තුල රාජ්‍ය සේවයේ විවිධ තනතුරු හොබවා ඇත. මේ අතර කම්කරු දෙපාර්තුමේන්තුවේ සහකාර කොමසාරිස්, සහකාර අධ්‍යක්ෂ (අනුරාධපුර) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සහකාර ලේකම් - උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), සම්බන්ධීකාරක (අනුරාධපුරය), සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)/ පුහුණු හා පර්යේෂණ ග්‍රාමීය දෙපාර්තුමේන්තුව, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)- අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළමනාකරණ උපදේශක- ලෝක බැංකු ව්‍යාපෘති, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) - සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශය, අතිරේක දිස්ත්‍රික් ලේකම්- අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පළාත් ලේකම් - උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය, අධ්‍යක්ෂ ජෙනරාල් (උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය)- උසස් අධ්‍යාපන අමාත්‍යංශය, රජයේ නියෝජිත/ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ලේකම්- ඉදිකිරීම්, ඉංජිනේරු සේවා හා නිවාස පහසුකම් අමාත්‍යංශය, ලේකම්- අධ්‍යාපන අමාත්‍යංශය හා ලේකම්- විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යංශය වේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ)උපාධිය, තායිලන්තයේ බැංකොක් නුවර ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ආයතනයෙන් ප්‍රාදේශීය සැලසුම්කරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (1992), බටහිර ජර්මනියේ ඩෝට්මන්ඩ් විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද වැනි අධ්‍යාපනික සුදුසුකම් රැසක්ද එතුමන් සතු වේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ සහතිකපත්‍රලාභී පාඨමාලාව සම්පූර්ණ කොට ඇත.

ඔහු පහත සදහන් සම්මාන වලින්ද පිදු ලබා ඇත.
ISO 9001 ප්‍රමිති සහතිකය - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් පරිපාලන කුසලතාවය සඳහා - 2008

විශිෂ්ටතම ඵලදායිතා සහතිකය (ඵලදායිතා ලේකම් කාර්යාලය) -මහනුවර දිස්ත්‍රික් ලේඛම් කාර්යාලයේ සඵලතාවය හා කාර්යක්ෂමතාවය වෙනුවෙන් - 2008

රාජ්‍ය අංශය සදහා වූ ආසියානු සම්මානය - තායිලන්තයේ බැංකොක් නුවර ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ආයතනයෙන් විශිෂ්ඨතම වෘත්තීයවේදියා සහ තාක්ෂණික සාධන මට්ටම ළගා කරගැනීම වෙනුවෙන් සහතික සම්මානය - 2007

# සාංගමික කළමනාකරණය



උපාලි හෙට්ටිආරච්චි මහතා
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී



එස් දිසානායක මහතා
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී



ඩබ් එම් ඒ බණ්ඩාර මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරී



ඩී විදාන පතිරණ මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී



ඒ ජේ අතුකෝරාල මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක



ඩබ් ඩබ් ඩී එස් සී පෙරේරා මහත්මිය.
සහකාර සාමාන්‍යාධිකාරී - නීති



එච් එස් ගුණතිලක මහත්මිය.
සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාපාර සංවර්ධන සහ අලෙවිකරණ



සී ආර් පී බාලසූරිය මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාර



ඩී එම් ඩී එම් කේ දිසානායක මහතා
ප්‍රධාන කළමනාකාරී - ණය



කේ ටී ඩී ඩී ද සිල්වා මිය.

බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්/ප්‍රධාන කළමනාකාරී



එච් ඒ අනුර මහතා

ප්‍රධාන කළමනාකාරී - මූල්‍ය



ඩබ් එන් ඩී බොතේජු මිය

ප්‍රධාන කළමනාකාරී - මානව සම්පත් හා පරිපාලන



කේ ආර් එම් අරුණ බණ්ඩාර මහතා

ප්‍රධාන කළමනාකාරී - අනුකූලතා නිලධාරී

# සාංගමික කළමණාකරණයේ තොරතුරු

## උපාලි හෙට්ටිආරච්චි මහතා

**සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී**

M.Com, FCPM, B.Com. (Special), Attorney-at-Law, LLB

පත්වීම් දිනය : 2016 පෙබරවාරි 01

හෙට්ටිආරච්චි මහතා මහ බැංකුකරුවකු වන අතර HDFC බැංකුවට අනුයුක්ත කිරීම් පදනමට සඳහා නිදහස් කරන ලදී. මහ බැංකුව තුළ විවිධ ක්ෂේත්‍ර වල වසර 32 පමණ අද්විතීය රැකියා පලපුරුද්දක් ඔහු සතු විය. HDFC බැංකුවට සම්බන්ධ වීමට පෙර 2013 සිට 2016 ඔහු දකුණු පලාත් ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු ලෙස සේවය කරන ලදී. 2013 වර්ෂයේදී බැංකු නොවන සුපරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානගත සුපරීක්ෂණ අංශය/ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂවරයෙක් ලෙස, 2012-2013 කාලය තුළ බැංකු නොවන සුපරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ආවේක්ෂණ අංශය/ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂවරයෙක් ලෙස, 2010- 2012 කාලය තුළ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති මූල්‍ය අංශ ප්‍රධානී/ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂවරයෙක් ලෙස, 2006- 2010 කාලය තුළ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ණය සුරැකුම් අංශ ප්‍රධානී/ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂවරයෙක් ලෙස, 2004- 2006 කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු/ සහකාර අධ්‍යක්ෂවරයෙක් ලෙස, 2002 - 2004 කාලය තුළ මුදල් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී ලෙස, 1998-2002 කාලය තුළ ලේකම් දෙපාර්තමේන්තුවේ, 1992-1998 කාලය තුළ සේවක අර්ථ සාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සහ 1989 සිට 1992 දක්වා මාතර පලාත් කාර්යාලයේ සේවය කල එතුමා සතුව පුළුල් පරාසයක පලපුරුද්දක් විය

## එස් දිසානායක මහතා

**ප්‍රධාන මෙහෙයුම් නිලධාරී**

*ACA, Bsc.(Management)*

පත්වීම් දිනය: 1995 දෙසැම්බර් 01 දින

දිසානායක මහතාට රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන වල ගිණුම්කරන සහ මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 29 ක පමණ පළපුරුද්දක් ඇත. වසර ගණනාවක් සඳහා රාජ්‍ය අංශයේ ආයතන වල මූල්‍ය අංශ ප්‍රධානී ධූරයද එතුමා දැරීය. සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) ලෙස HDFC බැංකුවට සම්බන්ධ වූ එතුමන් වසර 11 පූරා සේවය කළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුරුට පත්වීමට පෙර මූල්‍ය අංශ ප්‍රධානී තනතුරද දැරීය. 2013 ජනවාරි මස 01 දින සිට ප්‍රධාන මෙහෙයුම් නිලධාරී ලෙස ඒ මහතා පත්කරන ලදී.

## ඩබ් එම් ඒ බණ්ඩාර මහතා

**ප්‍රධාන තොරතුරු නිලධාරී**

*BSc, PGDIP-IT (UK)*

පත්වීම් දිනය : 1997 අගෝස්තු මස 15 දින

වසර 23 පමණ තොරතුරු තාක්ෂණ වෘත්තීය පළපුරුද්දක් ඇති බණ්ඩාර මහතාට වසර 07 පමණ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පදවි වල පළපුරුද්දක් ඇත. පුළුල් පරාසයේ UNIX පදනම් පද්ධති ස්ථාපනය කිරීමේ, සකස් කිරීමේ සහ පවත්වාගැනීමේ හසල පළපුරුද්දක් එතුමා සතු වූ අතර දත්ත ගබඩා හැඩගැස්වීම සහ පවත්වාගැනීම, ජාල පරිපාලනය සහ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ විශේෂඥයෙකි. එතුමන් වසරක කාලයක් ජපානයේ NEC සමාගමෙහිද සේවය කර ඇත.

## ඩී විදාන පතිරණ මහතා

**ප්‍රධාන මූල්‍ය නිලධාරී**

BSc, MBA, FCA, FCMA, FCPM

පත්වීම් දිනය: 2004 සැප්තැම්බර් මස 15 වන දින

පතිරණ මහතාට ශ්‍රී ලංකාවේ සහ විදෙස් රටවල විගණන, ගිණුම්කරන, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපෘති හා ආයෝජන ප්‍රවර්ධනය, කළමනාකරණ ගිණුම්කරනය, ව්‍යපෘති මූල්‍යනය, ව්‍යාපාර සංවර්ධනය හා අලෙවිකරණය, බැංකුකරණය සහ භාණ්ඩාගාර කළමනාකරණය පිළිබඳ වසර 32 පමණ පළපුරුද්දක් ඇත. දැනට එතුමන් බැංකුවේ මූල්‍ය සහ සැලසුම් දෙපාර්තමේන්තුව සඳහා වගකීම දරයි.

## ඒ ජේ අතුකෝරාල මහතා

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

*BSc, ACMA, CISA, CISM, Dip in Computer System Design (NIBM)*

පත්වීම් දිනය: 2009 ජුලි මස 01 වන දින

විගණන ශ්‍රිතයන්ට අදාළව බැංකු ක්ෂේත්‍රයේ වසර 29 ක පමණ විධායක පළපුරුද්දක් අතුකෝරාල මහතා සතුවේ. එසේම රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බැංකු වල සේවා පළපුරුද්දක් එතුමා සතුවේ.

## ඩබ් ඩබ් ඩී එස් සී පෙරේරා මහත්මිය.

**සහකාර සාමාන්‍යාධිකාරී - නීති**

*නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්*

පත්වීම් දිනය: 1992 නොවැම්බර් මස 16 වන දින

පෙරේරා මහත්මිය නීති නිලධාරියකු ලෙස HDFC බැංකුවේ සේවය ආරම්භ කළ අතර 2001 වර්ෂයේදී කළමනාකාරිණි - නීති තනතුරට උසස් වන ලදී. ඇය 2015 වර්ෂයේදී සහකාර සාමාන්‍යාධිකාරී - නීති තනතුරට පත්විය. නිවාස මූල්‍යයනය, බැංකුකරණ සහ නඩු කටයුතු ආශ්‍රිත විශේෂඥතාවක් සහිතව නීති ක්ෂේත්‍රයේ වසර 24 ක පමණ වෘත්තීය පළපුරුද්දක් ඇය සතු විය.

**එච් එස් ගුණතිලක මහත්මිය.**
**සහකාර සාමාන්‍යාධිකාරී - ව්‍යාපාර සංවර්ධන සහ අලෙවිකරණ**
*MBA, PGD in Marketing, PGD in Urban Management (IHS Netherlands), BA (Sri Lanka)*
පත්වීම් දිනය : 1991 ජූනි මස 20 වන දින
ගුණතිලක මහත්මියට රාජ්‍ය සහ පෞද්ගලික අංශ තුළ නිවාස ක්ෂේත්‍රයේ වසර 32 පමණ පළපුරුද්දක් ඇත.

**සී ආර් පී බාලසූරිය මහතා**
**සහකාර සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාර**
*Master in Financial and Economics, B Com (Special), MAAT*
පත්වීම් දිනය : 2004 මාර්තු මස 22 වන දින
බාලසූරිය මහතාට වෙළෙඳ ක්ෂේත්‍රයේ දශක 02 ක පමණ වෘත්තීය පළපුරුද්දක් ඇති අතර බැංකු ක්ෂේත්‍රයේ විශේෂඥයෙකි.

**ඩී එම් ඩී එම් කේ දිසානායක මහතා**
**ප්‍රධාන කළමනාකාරී - ණය**
ACA
පත්වීම් දිනය : 2012 ජූනි මස 18 වන දින
දිසානායක මහතාට ණය සහ මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 18 වැඩි පළපුරුද්දක් ඇත. HDFC බැංකුවට සම්බන්ධ වීමට පෙර පෞද්ගලික අංශයේ මූල්‍ය ආයතන බොහෝමයක ණය නිලධාරී, ගිණුම් කළමනාකාර, ජ්‍යෙෂ්ඨ ගිණුම් කළමනාකාර, ගණකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාර - ණය හා මෙහෙයුම් තනතුරු දරා ඇත. එතුමන්ට විගණනය, මූල්‍ය කළමනාකරණය, බදුකරණය, මෙහෙයුම් සහ ණය කළමනාකරන ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇත.

**කේ ටී ඩී ඩී ද සිල්වා මිය**
**බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්/ප්‍රධාන කළමනාකාරී**
*Attorney at law.*
*Business administration (MBA), LLM- Master of laws*
*Post Attorneys higher diploma in Banking Finance and insurance.*
පත්වීම් දිනය: 1999
සිල්වා මහත්මියට බැංකුකරණ සහ මූල්‍ය ක්ෂේත්‍රයේ නීතිඥවරියක් ලෙස වසර 23 කට වැඩි පළපුරුද්දක් ඇත. ඇය සතුව නඩු කටයුතු, ණය නැවත අයකරගැනීම, මානව සම්පත් වැනි ක්ෂේත්‍ර වල පළපුරුද්දක් ඇත. ඊට අමතරව වර්තමානයේදී ඇය සතුව සමාගම් ලේකම් ක්ෂේත්‍රයේද අත්දැකීම් ඇත.

**එච් ඒ අනුර මහතා**
**ප්‍රධාන කළමනාකාරී - මූල්‍ය**
*MBA,PGDM (RJT), B.Sc. Accy & Fin. MGT (Sp) Degree (USJ), MIPA (Au),MIFA(UK), MAAT, Intermediate of CA Sri Lanka,*
පත්වීම් දිනය: 2004 ඔක්තෝබර් 01 වන දින
අනුර මහතාට බැංකුකරණය, ණය, අයකරගැනීම්, තැන්පතු, ශාඛා මෙහෙයුම්, ගිණුම්කරනය, මූල්‍ය කළමනාකරණය, බදුකරණය, විගණනය, භාණ්ඩාගාර කළමනාකරණය, අනුකූලතා, සාංගමික මූල්‍ය වාර්තාකරණය හා වාර්ෂික වාර්තා අයවැයකරණ සහ මූල්‍ය සැලසුම්කරණ ක්ෂේත්‍ර වල දශක පමණ පළපුරුද්දක් ඇත.

1996 දී එතුමන් BMC සහ ලංකා ධීවර සංස්ථාවේ ගිණුම්කරණ රැකියා වලින් තම වෘත්තීය ආරම්භ කරන ලද අතර 1998 දී විගණන/විධායක නිලධාරී, සහකාර කළමනාකාර වරයෙකු ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට සම්බන්ධ වන ලදී. 2004 වර්ෂයේදී ගම්පහ ශාඛා කළමනාකරු ලෙස HDFC බැංකුවට සම්බන්ධ වූ ඒ මහතා 2007 වර්ෂයේ සිට ගණකාධිකාරී - භාණ්ඩාගාර, ගණකාධිකාරී- මූල්‍ය, ජ්‍යෙෂ්ඨ කළමනාකාර - මූල්‍ය යන තනතුරු හොබවන ලදී.

**ඩබ් එන් ඩී බොතේජු මිය**
**ප්‍රධාන කළමනාකාරී - මානව සම්පත් හා පරිපාලන**
*B.Sc. Business Administration (Special), CBA (CA Sri Lanka), CBF*
පත්වීම් දිනය : 1995 ජූලි මස 01 වන දින
පෞද්ගලික සහ බැංකු අංශවල කළමනාකරණ, මූල්‍ය, මානව සම්පත් සහ වෙනත් ක්ෂේත්‍රයන්හි වසර 22 කට වැඩි පළපුරුද්දක් බොතේජු මිය සතුවේ.

**කේ ආර් එම් අරුණ බණ්ඩාර මහතා**
**ප්‍රධාන කළමනාකාරී - අනුකූලතා නිලධාරී**
*B.Com(Special) ,CBA (CA Sri Lanka) ,SAT( AAT Sri Lanka), CBF*
පත්වීම් දිනය : 1999 මැයි මස 03 වන දින
බණ්ඩාර මහතාට රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන වල විගණන, ගිණුම්කරන ක්ෂේත්‍රයන්හි වසර 27 කට වැඩි පළපුරුද්දක් ඇත. HDFC බැංකුවට සම්බන්ධ වීමට පෙර ඒ මහතා රාජ්‍ය ආයතන සහ විදේශ අරමුදල් ව්‍යාපෘති වල විගණන විශේෂඥයකු ලෙස සේවය කරන ලදී. 2012 ජනවාරි මස 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි එතුමන් අනුකූලතා ප්‍රධානී ලෙස පත්කරන ලදී.

# ප්‍රාදේශීය කළමනාකරුවන්



ආර් ආර් ගුණවර්ධන මහත්මිය
ප්‍රාදේශීය කළමනාකරු
බස්නාහිර දකුණ



ආර් එම් සුගතපාල මහතා
ප්‍රාදේශීය කළමනාකරු
ඌව



ඩබ් ඩී කේ සෙනවිරත්න මහතා
ප්‍රාදේශීය කළමනාකරු
වයඹ



එන් සී රංජිත් මහතා
ප්‍රාදේශීය කළමනාකරු
දකුණ



ආර් ඒ ජේ එන් රණසිංහ
ප්‍රාදේශීය කළමනාකරු
මධ්‍යම



බී ඩබ් එම් සී කුමාරසිරි මහතා
ප්‍රාදේශීය කළමනාකරු
බස්නාහිර උතුර

# ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්



එල් ගුණතිලක මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
අයකරගැනීම්



එල් ඒ එස් සී විජේතුංග මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
දේපළ



පී එස් පිටවෙල මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
පරිපාලන



කේ දිසානායක මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
නීති



කේ ඩබ් වයි ඉන්දිරා මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
නීති



කේ ඩබ් ඉරේෂා මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
නීති



එම් ආර් එස් ප්‍රනාන්දු මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
නීති



ඩී ඩබ් ඩබ් කොඩිතුවක්කු මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
නීති



ඊ ආර් එල් කේ පෙරේරා මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
නීති

# ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්



**කේ එල් එස් මල්කාන්ති මහත්මිය**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
නීති



**ඒ එම් නීලචන්ද්‍ර මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
තොරතුරු තාක්ෂණ *(Application System & Core Bank)*



**අයි නිශාන්ත මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
අවදානම් නිලධාරී



**ටී එච් කේ පී ද සිල්වා මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
තොරතුරු තාක්ෂණ *(IT Operations, User Support & System Security)*



**ඩී එන් ධර්මරත්න මහතා**
ජ්‍යෙෂ්ඨ කළමනාකරු
කල්බදු

# මූල්‍ය ප්‍රකාශන


මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 104
විගණකගේ වාර්තාව 106
ආදායම් ප්‍රකාශනය 108
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 109
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 110
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 111
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 112
ගිණුම්කරන ප්‍රතිපත්ති 113
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 119

# මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මෙම ප්‍රකාශනය තුළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ අන්තර්ගත වේ. බැංකුවේ කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ ස්වරූපයක් පෙන්වන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ බැංකුවේ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මගින් අධ්‍යක්ෂවරුන්ට නියම කර ඇත.

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ මූල්‍ය ප්‍රකාශන සහ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එම අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනට සහ එහි සටහන් ඇතුලත් වාර්ෂික වාර්තාව අප ඉදිරිපත් කරමු.

ඒ අනුව සමාලෝචනයට ලක්වන කාලසීමාව: 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ ප්‍රකාශන දිනට සමාගමේ කටයුතු වල තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපනය වන පරිදි බැංකුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත් කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් ගිණුම් පොත් වලට අනුව සකස් කර ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වල (*SLFRS/LKAS*) සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරන සහ විගණන ප්‍රමිත පනතෙහි අවශ්‍යතා වලට අනුකූල වී ඇත.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු පහත දෑ සහතික කලයුතුය:**

යෝග්‍ය ගිණුම්කරන ප්‍රතිපත්ති තෝරාගෙන නොවෙනස්වන ආකාරයට ක්‍රියාත්මක කිරීම සහ ඉන් බැහැරවීමක් ඇත්නම් ඒවා අනාවරණය කිරීම හා පැහැදිලි කිරීම, සාධාරණ සහ විචක්ෂණශීලී විනිශ්චයන් හා ඇස්තමේන්තු සිදුකිරීම. අදාළ වන්නා වූ සියළුම ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අනුකූලවීම සහ නෛතික හා නියාමන අවශ්‍යතා මත ප්‍රසිද්ධ කළ යුතු තොරතුරු සම්පාදනය සහ ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අමතරව 2007 අංක 07 දරන සමාගම් පනතේ නීතින්ට, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති වලට සහ වෙනත් ඕනෑම නියාමන අධිකාරියක අවශ්‍යතාවයන්ට අනුකූල වෙමින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.

මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට සමාගම සතුව ප්‍රමාණවත් සම්පත් පවතින බවටත් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගෙන ඇති බව හා එහි සාධාරණ බව අධ්‍යක්ෂවරු සහතික කර ඇත. එසේම බැංකුව ප්‍රමාණවත් ගිණුම්කරන වාර්තා පවත්වාගෙන ඇති බවත් සැලකිය යුතු නිරවද්‍යතාවයක් සහිතව සමාගමේ මූල්‍ය තත්ත්වය අනාවරණය කර ඇති බවත් අප සහතික වෙමු.

අධ්‍යක්ෂවරු විසින් සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට, වංචා සහ අයථා කටයුතු හඳුනාගැනීමට සහ වැලැක්වීමටත් වාර්තාවල නිරවද්‍යතාවය සහ විශ්වාසවන්තභාවය ආරක්ෂා කරගැනීම සඳහාත් යෝග්‍ය අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

අධ්‍යක්ෂවරු විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අවශ්‍ය වන අතර මූල්‍ය ප්‍රකාශන මත විගණකවරුන්ගේ විගණන වාර්තාව තුළ ප්‍රකාශ කිරීම අවශ්‍ය යැයි සහ යෝග්‍ය යැයි සලකන අභ්‍යන්තර පාලනයන් මත ඕනෑම සමාලෝචනයක් හෝ නියදි පරීක්ෂාවක් සිදු කිරීමට අවස්ථාව ලබාදීම සමඟ මූල්‍ය ප්‍රකාශන බාහිර විගණකවරුන්ට ලබාදීම.

## අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන්ගේ දැනුමට අනුව ශේෂ පත්‍ර දිනට ගෙවිය යුතු සියළුම බදු, තීරුබදු සහ අයබදු මෙන්ම සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සමාගම ගෙවා හෝ අදාළ ප්‍රතිපාදන සිදුකොට ඇති බව අධ්‍යක්ෂවරු තහවුරු කරනු ලැබේ. ගිණුම්කරන පාලනයන්ගේ තක්සේරුවට අනුව ඒවා ප්‍රමාණවත් බවත් එම පාලනයන්ගේ ක්‍රියාකාරීත්වය ඇණසිටීමට සහ බැංකුවට අලාභයක් ඇතිවීමට හේතුවන කිසිවක් අධ්‍යක්ෂවරුන්ගේ අවධානයට යොමු නොවූ බවත් මෙහෙයුම් කටයුතු නුදුරු අනාගතයක් දක්වා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් පවතින බවට අධ්‍යක්ෂවරු සහතික වී ඇත. අධ්‍යක්ෂවරු ඔවුන්ගේ ඉහත සඳහන් වගකීම් ඉෂ්ඨ කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් බාහිර විගණකවරුන්ගේ වගකීම වාර්ෂික වාර්තාවේ පිටු අංක 106 සිට 107 දක්වා වූ විගණකවරුන්ගේ වාර්තාව තුළ අන්තර්ගත වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගයෙන්



**ආර් ජේ ද සිල්වා**
සභාපති

2017 මැයි මස 24 දින
කොළඹදී

# විගණකවරුන්ගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. }   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date }   22 May 2017

බීඑෆ්/01/සී/එච්ඩීඑෆ්සී/1/16/34 2017 මැයි 22 වන දින

සභාපති
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2003 අංක 15 දරන පනතින් හා 2011 අංක 45 දරන පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ 26(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මණ්ඩලයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

2

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**මූල්‍ය ප්‍රකාශන**

----------------

**මතය**

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**අනෙකුත් නීතිමය හා නියාමනික අවශ්‍යතාවයන්ට අනුව වාර්තා කිරීම**

--------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන 1988 අංක 30 දරන බැංකු කටයුතු පනතින් හා එහි සංශෝධන මගින් අවශ්‍ය වන තොරතුරු ඉදිරිපත් කරයි.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

---------------------------------

මාගේ වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව යථා කාලයේදී පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබේ.



එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# ආදායම් ප්‍රකාශනය

| 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (ශ්‍රී ලංකා රුපියල්) | සටහන් | බැංකුව 2016 | 2015 (ප්‍රතිප්‍රකාශිත) |
|---|---|---|---|
| ආදායම | | **5,927,598,728** | 4,925,332,898 |
| පොළී ආදායම | 1 | 5,472,894,291 | 4,660,182,745 |
| පොළී වියදම | 2 | (3,509,295,782) | (2,539,343,452) |
| **ශුද්ධ පොළී ආදායම** | | **1,963,598,509** | 2,120,839,292 |
| ගාස්තු සහ කොමිස් ආදායම | 3 | **346,974,232** | 253,108,354 |
| ගාස්තු සහ කොමිස් වියදම | | - | - |
| **ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම** | | 346,974,232 | 253,108,354 |
| ශුද්ධ වෙළෙඳ ආදායම/(වියදම) | | - | - |
| ලාභ අලාභ හරහා සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ වලින් ශුද්ධ ලාභය(අලාභය) | | - | - |
| මූල්‍ය ආයෝජන වලින් ශුද්ධ ලාභය (අලාභය) | | - | - |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 4 | 107,730,205 | 12,041,800 |
| මුළු මෙහෙයුම් ආදායම් | | 2,418,302,946 | 2,385,989,446 |
| අඩුකළා: ණය සහ අනෙකුත් පාඩු සඳහා හානිකරණ ගාස්තු | 5 | 160,431,754 | 89,230,366 |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම්** | | **2,257,871,192** | 2,296,759,080 |
| **අඩුකළා: වියදම්** | | | |
| සේවක පිරිවැය | 6 | 895,271,314 | 828,657,754 |
| අස්පෘෂ්‍ය වත්කම් හානිකරණය හා ක්‍රමක්ෂය | | - | - |
| වෙනත් වියදම් | 7 | 514,106,630 | 459,093,247 |
| මුළු වියදම් | | **1,409,377,945** | 1,287,751,001 |
| **එකතු කළ අගය මත බද්දට හා ජාතිය ගොඩනැගීමේ බද්දට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | **848,493,247** | 1,009,008,080 |
| **අඩුකළා: මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද** | 8 | 188,399,073 | 205,741,623 |
| **එකතු කළ අගය මත බද්දට හා ජාතිය ගොඩනැගීමේ බද්දට පසු මෙහෙයුම් ලාභය/(අලාභය)** | | **660,094,175** | 803,266,457 |
| ආශ්‍රිත සහ බද්ධ සමාගම් වල ලාභ කොටස් | | - | - |
| **බදු පෙර ලාභය/(අලාභය)** | | **660,094,175** | 803,266,457 |
| අඩුකළා: බදු වියදම | 9 | 269,838,313 | 294,012,069 |
| **වර්ෂය සඳහා ලාභය** | | **390,255,862** | 509,254,388 |
| **ලාභ මත කොටසක ඉපයුම** | | | |
| මූලික කොටසක ඉපැයුම (රු.) | 10 | **6.03** | 7.87 |
| තාත්විකරණ කොටසක ඉපැයුම (රු.) | | - | - |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (ශ්‍රී ලංකා රුපියල්) | බැංකුව 2016 | 2015 (ප්‍රතිප්‍රකාශිත) |
|---|---|---|
| **වර්ෂය සඳහා ලාභය** | **390,255,862** | 509,254,388 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම)** | | |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන සංචිතයේ වෙනස්වීම (සාධාරණ අගය විකල්පය භාවිතා කළේ නම්) | - | - |
| නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක අලාභ | 40,857,717 | 10,716,906 |
| ලාභ සහ අලාභ (විදේශීය මෙහෙයුම් වල මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීමෙන් ඇතිවූ) | - | - |
| අලෙවිය සඳහා වූ මූල්‍ය වත්කම් නැවත මිනුම්කරණය මත ලාභ සහ අලාභ | (17,763,091) | (16,263,402) |
| වෙනත් මුදල් ප්‍රවාහ හුවමාරු ගිවිසුම් මත ලාභ සහ අලාභ | - | - |
| **බදු වලට ශුද්ධ වූ වර්ෂය සඳහා අනෙකුත් විස්ත්ර්ණ ආදායම්** | 23,094,626 | (5,546,496) |
| **වර්ෂය සඳහා සමස්ත විස්තීරණ ආදායම්** | **413,350,488** | 503,707,892 |
| **වෙන්කළ හැකි :** | | |
| කොටස් හිමියන්ට | 413,350,488 | 503,707,892 |
| පාලනය කළ නොහැකි හිමිකමට | - | - |
| **එකතුව** | **413,350,488** | 503,707,892 |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (ශ්‍රී ලංකා රුපියල්) | සටහන් | බැංකුව 2016 | 2015 (ප්‍රතිප්‍රකාශිත) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති මුදල් සහ ශේෂයන් | 11 | 144,695,297 | 145,099,998 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 12 | 831,544,707 | 55,687,587 |
| බැංකුවල ඇති ශේෂයන් | 13 | 93,925,495 | 63,070,732 |
| අලෙවිය සඳහා පවතින මූල්‍ය වත්කම් | 14 | 2,053,279,082 | 2,043,353,937 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ | 15 | 30,259,872,371 | 26,684,610,922 |
| මූල්‍ය ආයෝජන- පරිණත වීම තෙක් රඳවා ගන්නා | 16 | 10,737,304,235 | 11,588,341,144 |
| දේපළ, පිරියත හා උපකරණ | 17 | 457,323,210 | 413,425,368 |
| අස්පෘෂ්‍ය වත්කම් | 17 | 20,793,892 | 21,467,750 |
| ආයෝජන දේපළ | 18 | 870,549,500 | 786,350,000 |
| විලම්භිත බදු වත්කම් | 19 | - | - |
| වෙනත් වත්කම් | 20 | 152,718,042 | 111,546,873 |
| **මුළු වත්කම්** | | **45,622,005,832** | **41,912,954,310** |
| **වගකීම්** | | | |
| බැංකු සහ වෙනත් ආයතන සඳහා ගෙවිය යුතු දෑ | 21 | 3,318,510,754 | 3,031,112,418 |
| වෙනත් පාරිභෝගිකයින්ට ගෙවිය යුතු දෑ | 22 | 32,122,526,537 | 28,592,674,990 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 23 | 5,544,534,335 | 6,005,671,318 |
| ප්‍රවර්තන බදු වගකීම් | 24 | 189,337,098 | 257,247,956 |
| විලම්භිත බදු වගකීම් | 19 | 36,440,869 | 18,310,267 |
| වෙනත් වගකීම් | 25 | 682,889,401 | 644,112,754 |
| **මුළු වත්කම්** | | **41,894,238,993** | **38,549,129,704** |
| හිමිකම | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 26 | 962,092,936 | 962,092,936 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 27 | 134,943,779 | 115,430,986 |
| රඳවාගත් ඉපයුම් | 28 | 2,444,951,364 | 2,117,457,931 |
| වෙනත් සංචිත | 29 | 185,778,760 | 168,842,753 |
| කොටස් හිමියන්ගේ මුළු හිමිකම | | 3,727,766,839 | 3,363,824,605 |
| පාලනය කළ නොහැකි හිමිකම | | | |
| **මුළු හිමිකම** | | **3,727,766,839** | **3,363,824,605** |
| **මුළු හිමිකම හා වගකීම්** | | **45,622,005,832** | **41,912,954,310** |
| අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම් | 30 | 694,721,449 | 742,928,019 |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | | **694,721,449** | **742,928,019** |
| **කොටසක පොත් අගය (රු.)** | | **57.61** | **51.98** |

පිටු අංක 113 සිට 141 දක්වා ඇතුළත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල වැදගත් කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

**ඩී. වී පතිරණ**
*ප්‍රධාන මූල්‍ය නිලධාරී*

**උපාලි හෙට්ටිආරච්චි**
*සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී*

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ;

**ආර්. ජේ ද සිල්වා**
*සභාපති*

**ආර් සුරේන්ද්‍රන්**
*අධ්‍යක්ෂ*

දිනය : 2017/05/18
කොළඹ

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| (ශ්‍රී ලංකා රුපියල්) | ඡන්දය හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | විශේෂ සංචිත | ආයෝජන අරමුදල | AFS සංචිත | රඳවාගත් ඉපැයුම් | එකතුව | පාලනය කළ නොහැකි හිමිකම | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 106,337 | 32,388 | 89,969 | 3,451 | 140,449 | (7,121) | 1,558,301 | 2,885,866 | - | 2,885,866 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | - | - | 13,952 | 13,952 | - | 13,952 |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | - | - | - | - | - | 509,254 | 509,254 | - | 509,254 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් (බදු වලට ශුද්ධ වූ) | - | - | - | - | - | - | - | (16,263) | 10,717 | (5,546) | - | (5,546) |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | 140,449 | (16,263) | 533,923 | 517,660 | - | 517,660 |
| සෘජුවම හිමිකම තුළ හඳුනාගත් කොටස් හිමියන් සමඟ ගණුදෙනු | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කොටස් නිකුතුන්/පවරන ලද ප්‍රාග්ධනයෙහි වර්ධනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රසාද නිකුතු | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| හිමිකම් නිකුතු | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ආයෝජන අරමුදල් මාරු කිරීම් | - | - | - | - | - | - | (140,449) | - | 140,449 | - | - | - |
| කාලච්ඡේදය තුළ සංචිත වලට මාරු කිරීම් | - | - | 50,925 | - | 25,463 | - | - | - | (76,388) | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | - | - | - | - | - | - | - | (38,826) | (38,826) | - | (38,826) |
| ප්‍රධාන කාර්යාලයට මාරු කළ ලාභ | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභ/(අලාභ) (පිරිවැය ක්‍රමය යොදා ගත්තේ නම්) | - | - | - | (875) | - | - | - | - | - | (875) | - | (875) |
| වෙනත් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කොටස් හිමියන් සමඟ මුළු ගණුදෙනු | - | - | 50,925 | (875) | 25,463 | - | (140,449) | - | 25,235 | (39,702) | - | (39,702) |
| 2015.12.31 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 157,261 | 31,513 | 115,431 | 3,451 | - | (23,385) | 2,117,458 | 3,363,824 | - | 3,363,824 |

| (ශ්‍රී ලංකා රුපියල්) | ඡන්දය හිමි කොටස් ගණන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | පොදු සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | විශේෂ සංචිත | ආයෝජන අරමුදල | AFS සංචිත | රඳවාගත් ඉපැයුම් | එකතුව | පාලනය කළ නොහැකි හිමිකම | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2016.01.01 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 157,261 | 31,513 | 115,431 | 3,451 | - | (23,385) | 2,117,458 | 3,363,825 | - | 3,363,825 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | - | - | - | - | - | 390,256 | 390,256 | - | 390,256 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් (බදු වලට ශුද්ධ වූ) | - | - | - | - | - | - | - | (17,763) | 40,858 | 23,095 | - | 23,095 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | - | (17,763) | 431,114 | 413,350 | - | 413,350 |
| සෘජුවම හිමිකම තුළ හඳුනාගත් කොටස් හිමියන් සමඟ ගණුදෙනු | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කොටස් නිකුතුන්/පවරන ලද ප්‍රාග්ධනයෙහි වර්ධනය | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ප්‍රසාද නිකුතු | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| හිමිකම් නිකුතු | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කාලච්ඡේදය තුළ සංචිත වලට මාරු කිරීම් | - | - | 39,026 | - | 19,513 | - | - | - | (58,538) | - | - | - |
| ගෙවූ ලාභාංශ | - | - | - | - | - | - | - | - | (48,533) | (48,533) | - | (48,533) |
| ප්‍රධාන කාර්යාලයට මාරු කළ ලාභ | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය මත ලාභ/(අලාභ) (පිරිවැය ක්‍රමය යොදා ගත්තේ නම්) | - | - | - | (875) | - | - | - | - | - | (875) | - | (875) |
| වෙනත් | - | - | - | - | - | (3,451) | - | - | 3,451 | - | - | - |
| කොටස් හිමියන් සමඟ මුළු ගණුදෙනු | - | - | 39,026 | (875) | 19,513 | (3,451) | - | - | (103,620) | (49,408) | - | (49,408) |
| 2016.12.31 දිනට ශේෂය | 64,710,520 | 962,093 | 196,287 | 30,637 | 134,944 | - | - | (41,148) | 2,444,952 | 3,727,766 | - | 3,727,766 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (ශ්‍රී ලංකා රුපියල්) | බැංකුව 2016 | 2015 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| පොළී ලැබීම් | 5,430,478,452 | 4,579,998,884 |
| පොළී ගෙවීම් | (2,941,656,367) | (2,506,970,442) |
| වෙනත් මෙහෙයුම් කටයුතු වලින් ලැබීම් | 349,350,831 | 244,523,942 |
| සේවකයින්ට සහ සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම් | (932,692,526) | (883,019,340) |
| වෙනත් මෙහෙයුම් කටයුතු මත ගෙවීම් | (568,635,999) | (419,276,894) |
| **මෙහෙයුම් වත්කම් වල වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **1,336,844,392** | **1,015,256,150** |
| **මෙහෙයුම් වත්කම් වල (වැඩිවීම)/අඩුවීම** | | |
| ගණුදෙනුකරුවන්ගෙන් අයකරගත් අරමුදල් | 8,377,143,783 | 6,709,440,844 |
| ගණුදෙනුකරුවන්ට දුන් අත්තිකාරම් අරමුදල් | (12,118,244,173) | (10,089,546,808) |
| වෙනත් වත්කම් | (14,351,170) | 21,539,149 |
| | (3,755,451,560) | (3,358,566,815) |
| **මෙහෙයුම් වගකීම් වල වැඩිවීම/(අඩුවීම)** | | |
| ගණුදෙනුකරුවන්ගේ තැන්පතු | 2,963,951,624 | 4,125,887,291 |
| වෙනත් | 2,184,168 | 40,285,609 |
| | 2,966,135,792 | 4,166,172,900 |
| ආදායම් බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් | 547,528,624 | 1,822,862,235 |
| ආදායම් බදු සහ ගෙවූ ලාභාංශ බදු | (222,084,614) | (314,780,629) |
| **මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල්** | 325,444,009 | 1,508,081,606 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| ලද ලාභාංශ | 58,500 | 54,000 |
| ආයෝජන සුරැකුම්පත් විකිණීම/(මිලටගැනීම) | 47,491,552 | (4,113,558,346) |
| දේපල,පිරියත හා උපකරණ මිලට ගැනීම | (123,072,083) | (202,158,051) |
| දේපල,පිරියත හා උපකරණ විකිණීම | 4,538,775 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල්** | (70,983,256) | (4,315,662,397) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| කොටස් නිකුත් කිරීම/(නිදහස් කිරීම) | - | - |
| කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය නිදහස් කිරීම | - | - |
| ණයගැනීම් නැවත ගෙවීම | (1,344,755,960) | (2,093,723,558) |
| ණයගැනීම් වලින් මුදල් ලැබීම | 1,169,278,160 | 4,875,210,006 |
| ගෙවූ ලාභාංශ | (48,532,890) | (38,826,312) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල්** | (224,010,689) | 2,742,660,136 |
| මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | 30,450,064 | (64,920,656) |
| කාලච්ඡේදය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | 208,170,729 | 273,091,386 |
| **කාලච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | 238,620,792 | 208,170,729 |
| **මුදල් සහ මුදල් සමාන දෑ වල සැසඳීම** | | |
| අතැති මුදල් | 144,695,297 | 145,099,998 |
| බැංකුවේ ඇති මුදල් | 93,925,495 | 63,070,732 |
| | 238,620,792 | 208,170,729 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. සාංගමික තොරතුරු

### 1.1 වාර්තාකරණ ඒකකය

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, සමාජය ගොඩනැගීම සඳහා 1956 ජාතික නිවාස පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1984 දී ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලදී. පසුව 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ සංස්ථාවක් බවට පරිවර්තනය කළ අතර 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනත යටතේ විශේෂිත බැංකු කාණ්ඩයට ඇතුලත් වීමට සහ 2011 අංක 45 දරන සංශෝධන පනත මගින් 1988 අංක 30 දරන බැංකු පනතේ උපලේඛන IV හි අඩංගු සියළුම ක්‍රියාකාරකම් සඳහා අයදුම්කිරීමට බලය ලැබිණි. HDFC බැංකුවේ ප්‍රධාන කාර්යාලය ජාතික නිවාස සංවර්ධන අධිකාරී ලේකම් කාර්යාලය, කොළඹ 02, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

අවස්ථානුකූල අවශ්‍යතාවය මත ඓතිහාසික පිරිවැය පදනම මත සහ සාධාරණ අගය ගිණුම්කරනය අදාළ කරගනිමින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

සාමාන්‍යයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන සියළුම විශේෂිත ව්‍යාපාර ඒකක වලට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූල වීම අනිවාර්ය වේ. සංසන්දනාත්මක අගයන්ද ඉහත ප්‍රමිත වලට අනුව නැවත වාර්තා කරනු ලැබේ. එමෙන්ම මෙම මූල්‍ය ප්‍රකාශන වල කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති වල අවශ්‍යතාවය මත අදාළ අනාවරණයන්ද සිදුකර ඇත.

### 2.2 ක්‍රියාත්මක වන සහ සකස් කිරීමේ මුදල් ඒකක

බැංකුවේ මෙහෙයුම් කටයුතු සිදුකරන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 01 - "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" හි අවසරය පරිදි ඉදිරිපත් කරන වෙනස් අකාර වලට හැර අනෙක් සෑම අවස්ථාවකම අවසාන රුපියලට වටයා ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම**

1988 අංක 30 දරන බැංකු පනතෙහි හා එහි සංශෝධන වල මෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් වල වගන්ති වලට අනුව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට සහ ඉදිරිපත් කිරීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.

"මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම" යටතේ සහ මූල්‍ය තත්ත්ව විස්තරය මත පැහැදිලි කිරීම මගින් අධ්‍යවරු ඔවුන්ගේ වගකීම දැනුම් දී ඇත.

### 2.3 ගිණුම් ආකෘතිය සහ පෙර වර්ෂයේ අගයන්

ශ්‍රී ලංකා මහ බැංකුව නියම කළ ගිණුම් ආකෘතියකට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 01 - "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" හි අවසරය පරිදි පසුගිය වර්ෂයේ භාවිතා කළ ගිණුම්කරන ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන ඇත.

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

මූල්‍ය තත්ත්ව විස්තරය තුළ ඉදිරිපත් කර ඇති වත්කම් හා වගකීම් ස්වභාවය අනුව වර්ග කර ඇති අතර ද්‍රවශීලතාවය හා පරිණතභාවය අනුව පෙලගස්වා ඇත. බැංකුවේ වත්කම් හා වගකීම් වල පරිණත රටාවන් පිළිබඳ විශ්ලේෂණයක් පරිණතභාවයේ පරතර විශ්ලේෂණ වාර්තාවක් මගින් ඉදිරිපත් කර ඇත.

හඳුනාගත් වටිනාකම් හිලව්කරණය සඳහා බලාත්මක කළ හැකි නෛතික හිමිකමක් පවතින විට සහ ශුද්ධ පදනම මත පියවීම සඳහා චේතනාවක් ඇතිවිට හෝ වගකීම් පියවීම හා වත්කම් උපලබ්ධිය එක විටම සිදුවීමේදී මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව්කරණය කිරීම හා ශුද්ධ අගයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල වාර්තා කිරීම සිදුකරයි. බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල විශේෂිත අනාවරණයකදී හා ගිණුම්කරණ ප්‍රමිත හෝ විග්‍රහයක අනුමැතිය හා අවශ්‍යතාවයකට හැර ආදායම් ප්‍රකාශනයේ ආදායම් හා වියදම් හිලව්කරණය සිදු නොකරයි.

**ප්‍රමාණාත්මක භාවය සහ ඒකරාශී වීම**

එකිනෙක ප්‍රමාණාත්මක සමාන අයිතම කාණ්ඩ මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම මත වූ ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 01 ට අනුකූලව ඒවා ප්‍රමාණාත්මක නොවේ නම් ස්වභාවයෙන් හා ක්‍රියාකාරිත්වයෙන් අසමාන අයිතමද වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

**සංසන්දනාත්මක තොරතුරු**
වර්තමාන ඉදිරිපත් කිරීමට අනුකූල වීමට අවශ්‍ය විටදී සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලැබේ.

## 3. ප්‍රමාණාත්මක ගිණුම්කරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

### 3.1 අඛණ්ඩ පැවැත්ම
බැංකුවේ කළමණාකාරිත්වය විසින් බැංකුව අඛණ්ඩ පවත්වාගෙන යාමේ හැකියාව පිලිබඳව තක්සේරුවක් කර ඇති අතර පුරෝකථනය කල හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට බැංකුව සතුව සම්පත් පවතින බවට සෑහීමකට පත්වී සිටී. තවද බැංකුවේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව පිලිබඳ යම් සැකයක් පලකරන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් සම්බන්ධයෙන් කළමනාකාරිත්වය දැනුවත් නැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත සකස් කර ඇත.

### 3.2 වත්කම් අගය කිරීම

**3.2.1 ගණුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම්**
අනාගතයේදී විය හැකි ණය පාඩු සඳහා හානිකරණයට පසු ශුද්ධ අගය මත ගණුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලැබේ.

***3.2.1.1 හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන***
ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 39 - "මූල්‍ය උපකරණ: බැංකු තුළ මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මිනුම්කරණය" ට අනුව ගණුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ අත්තිකාරම් අඛණ්ඩව සමාලෝචනය කිරීමේ පදනම මත විය හැකි හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන සිදුකරයි. අවශ්‍යතාවය මත පහත අගය කිරීමේ ක්‍රමවේද භාවිතා කොට ණය වල සාධාරණ අගය ගණනය කරනු ලැබේ.

**01. සමූහ හානිකරණ ක්‍රමය**
**02. කේවල හානිකරණ ක්‍රමය**

*3.2.1.1.1 සමූහ හානිකරණ ක්‍රමය*
ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 39 - "මූල්‍ය උපකරණ: බැංකු තුළ මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මිනුම්කරණය" ට අනුව විය හැකි ණය අලාභ සඳහා සමූහ හානිකරණ ප්‍රතිපාදන සිදුකරනු ලැබේ. කේවල හානිකරණය ප්‍රමාණාත්මක නොවන විට බැංකුව අඩුවන අනුපාත යටතේ සමූහ හානිකරණ ප්‍රතිපාදන සිදුකරයි.

*3.2.1.1.1.1 උකස් සහ ඇපකාර ණය*
හානිකරණ ගැලපීම් සඳහා සැලකිය යුතු කාලසීමාවක් දක්වා කඩකල අඩුවන අනුපාතයක් භාවිතා කරයි. ශුන්‍ය කඩකරන්නන් සඳහා කිසිඳු ප්‍රතිපාදනයක් සිදුනොකරයි.

*3.2.1.1.1.2 මුදල් ආන්තික ණය*
බැංකුවේ අභිමතය පරිදි අයකර ගත හැකි මුදල් මත සැපයූ ණය නිසා මුදල් තැන්පතු ශේෂයක් මත සැපයූ ණය සඳහා කිසිඳු ප්‍රතිපාදනයක් සිදු නොකරයි.

*3.2.1.1.1.3 සේවක අර්ථසාධක අරමුදල් ණය*
සේවක අර්ථසාධක අරමුදල් ණය අගය කිරීම සඳහා සමූහ හානිකරණ ක්‍රමය භාවිතා කරන අතර ශුන්‍ය කඩකරන්නන් සඳහා කිසිඳු ප්‍රතිපාදනයක් සිදුනොකරයි. මාස 0 - 3 සිට 3 - 18 දක්වා වූ පරාසය සඳහා හිඟ ණය වෙනුවෙන් අඩුවන අනුපාත බැංකුව භාවිතා කරයි. කඩකල වර්ගීකරණය මාස 18 ට වැඩි නම් අදාළ වර්ගීකරණයට අදාළ වන්නා වූ අඩුවන අනුපාතය බැංකුව භාවිතා කරයි.

*3.2.1.1.2 කේවල හානිකරණ ප්‍රතිපාදන*
*3.2.1.1.2.1 අලෙවිය සඳහා අත්පත් කරගත් දේපළ*
ණය සහ අත්තිකාරම් තුළ ඇති ණය සඳහා සැලකිය යුතු කාලයක් පාරිභෝගිකයින් ගෙවීම් කඩ කළ හොත් HDFC බැංකුවට ඇපයට තබන ලද දේපල වෙන්දේසි කරනු ලබන අතර වෙන්දේසිය තුල විකිණිය නොහැකි දේපල අත්පත් කරගත් දේපල ලෙස හඳුනාගනී.

එම දේපල අගය කිරීම පහත පරිදි වේ. " ප්‍රමාණාත්මක සහතිකයකින් මූල්‍ය ප්‍රවාහය පුරෝකථනය කල හැකි නම් කේවල හානිකරණය ගණනය කරනු ලබයි ". මුදල් ප්‍රවාහය සඳහා සැලකිය යුතු සහතික කිරීමක් දිය නොහැකි නම් අත්පත් කරගත් දේපලට එරෙහිව ණය සඳහා 100% ක හානිකරණයක් සිදුකරයි.

*3.2.1.1.2.2 ව්‍යාපාති ණය*
ශුන්‍ය කඩකරන්නන් සඳහා කිසිඳු හානිකරණයක් සිදුනොකරන අතර මුදල් අයකරගැනීම සඳහා සැලකිය යුතු සහතිකයක් සහිත කඩකල ණය සඳහා කේවල හානිකරණය සිදුකරයි.

**3.2.2 මූල්‍ය ආයෝජන**
භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර සහ පරිණත වීම තෙක් රඳවා ගන්නා ආයෝජන පිරිවැය හා ලැබිය යුතු පොළිය මත වාර්තා කරන අතර අලෙවිය සඳහා ඇති ආයෝජන පිරිවැය හා ලැබිය යුතු පොළියට හානිකරණ ලාභ (අලාභ) ගැලපීම් මත වාර්තා කරයි.

**3.2.3 දේපල, පිරියත හා උපකරණ**

මූලික වශයෙන් පිරිවැය හා භාවිතයට සුදුසු තත්ත්වයට ගෙන ඒමට දරන වියදම් වල එකතුව මත හෝ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 16 අනුව වත්කමෙහි වටිනාකම සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත්නම් වසර තුනකට නොවැඩි නවතම ඇගයීම් වාර්තාවක් භාවිතා කොට සාධාරණ අගයට වාර්තා කරනු ලැබේ.

***3.2.3.1 හඳුනාගැනීමේ පදනම***

වත්කම හා බැඳි ආර්ථික ප්‍රතිලාභ අනාගතය තුල බැංකුවට ගලා ඒ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනීම සිදුකරයි.

***3.2.3.2 මිනුම්කිරීමේ පදනම***

දේපල හා උපකරණ එහි පිරිවැයෙන් පහත විශේෂිත පදනම් යටතේ වූ සමුච්චිත ක්ෂය අඩුකළ අගය මත වාර්තා කරනු ලැබේ.

***3.2.3.3 ක්ෂය ප්‍රතිපත්තිය***

විවිධ වත්කම් වල ඇස්තමේන්තුගත ජීවකාලය පුරා සරල මාර්ග ක්‍රමය මත පහත අනුපාත යටතේ ක්ෂය සම්පාදනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | වාර්ෂික % |
|---|---|
| ගොඩනැගිලි | 6 2/3 |
| කාර්යාල උපකරණ | 12.5 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10 |
| මොටර් රථ සහ බයිසිකල් | 20 |
| පිරියත හා යන්ත්‍ර | 25 |
| උපාංග හා උපකරණ | 12.5 |

භාවිතා කරන වර්ෂ සඳහා වාර්ෂිකව ක්ෂය සම්පාදන කරන අතර විකුණන වර්ෂය තුළ ක්ෂය සම්පාදනය නොකරයි. විවිධ වත්කම් වර්ග වල භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය ගණනය කිරීමේ ප්‍රායෝගික අපහසුතාවය සලකා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 16 හි 55 වගන්තියෙන් බැහැරව බැංකුව කටයුතු කර ඇත.

**අස්පෘශ්‍ය වත්කම්**

බැංකුවේ අස්පෘශ්‍ය වත්කම් වලට පරිගණක මෘදුකාංග වල වටිනාකම් ඇතුලත් වේ.

**හඳුනාගැනීමේ පදනම**

වත්කමේ පිරිවැය විශ්වාසදායීව අගය කල හැකි සහ වත්කමට අදාල ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒම මත අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීම සිදුවේ.

**මිනුම්කිරීමේ පදනම**

අස්පෘශ්‍ය වත්කම් වෙන වෙනම අත්පත් කරගන්නා අතර මූලික හඳුනාගැනීම පිරිවැයට සිදුවේ. මූලික හඳුනාගැනීමෙන් පසුව සමුච්චිත ක්‍රමක්ෂයන් සමුච්චිත හානිකරණ අලාභ අඩුකොට පිරිවැය මත අස්පෘශ්‍ය වත්කම් පවත්වාගෙන යයි.

**ඵලදායී ආර්ථික ජීවකාලය හා ක්‍රමක්ෂය**

අස්පෘශ්‍ය වත්කම් වල ඵලදයී ජීවකාලය නිශ්චිතව හෝ අවිනිශ්චිතව තක්සේරු කල හැක. නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් එය ඵලදයී ආර්ථික ජීවකාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා වූ ක්‍රමක්ෂය කාල සීමාව හා ක්‍රමක්ෂය ක්‍රමය සමාලෝචනය කල යුතුය. ඵලදායී ජීවකාලයේ හෝ වත්කම් වල අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජනයේ වෙනස් වීම් ක්‍රමක්ෂය ක්‍රමය හෝ කාල පරාස වෙනස් කිරීම මගින් ගණනය කරන අතර ගැලපෙන ලෙස ඒවාට ගිනුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් ආකාරයෙන් හඳුනාගැනීම. නිශ්චිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය වියදම අස්පෘශ්‍ය වත්කමෙහි ශ්‍රිතයන්ට අනුකූලව ආදයම් ප්‍රකාශනයේ වියදම් කාණ්ඩය තුල හඳුනාගනී.

**හඳුනානොගැනීම**

විකිණීමේදී හෝ ඒවා භාවිතයෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති විට අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගනු නොලැබේ. වත්කම හඳුනා නොගැනීම මත වන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකුණුම් වටිනාකම හා වත්කමෙහි ධාරණ අගය අතර වෙනස) වේ නම් එය වත්කම් හඳුනා නොගන්නා වසර තුල ලාභයට හෝ අලාභයට ගැලපිය යුතුය.

බැංකුව සතුව අවිනිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් නොමැත

| වත්කම් වර්ගය | වාර්ෂික % |
|---|---|
| පරිගණක මෘදුකාංග - විදේශීය | 25 |
| පරිගණක මෘදුකාංග - දේශීය | 25 |
| ප්‍රධාන යෙදවුම් මෘදුකාංග | 10 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

**3.2.4 ආයෝජන දේපළ**
ආයෝජන දේපල වර්තමාන වෙළෙඳපොල වටිනාකම මත වාර්තා කරන අතර ධාරණ අගය සහ වෙළෙඳපොල වටිනාකම අතර වෙනස ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් ආදායම් තුළ ඉදිරිපත් කරන අතර මූල්‍ය තත්ත්වය යටතේ වර්ග කරනු ලැබේ.

**3.2.5 ලාභ අලාභ හරහා සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම්.**
මේවාට ගණුදෙනු කල හැකි දෑ ඇතුලත් වේ. සැලකිය යුතු පසුගිය සතියක කාලසීමාවන් තුළ එම ආයෝජන ගණුදෙනු වූයේ නම් එහි ගණුදෙනු මිල ආයෝජනවල සාධාරණ අගය ලෙස සලකනු ලැබේ. අදාළ ආයෝජන සැලකිය යුතු කාලසීමාවක් තුල ගණුදෙනු නොවුයේ නම් මාසයක පොළී අලාභය සාධාරණ අගය ගැලපුම් ලෙස සලකනු ලැබේ.

**මූල්‍ය උපකරණ - අලෙවිය සඳහා පවතින**
මිල සංවේදීතාවය බැංකුවේ ලාභ අලාභ ප්‍රකාශනයට ඍජු බලපෑමක් නොමැති අවස්ථාවක වත්කම් හඳුනානොගන්නා තෙක් අලෙවිය සඳහා පවතින කළඹෙහි සාධාරණ අගය වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගනී. අලෙවිය සඳහා පවතින කළඹ තුළ ලැයිස්තුගත ණයකර සහ ඒකක භාර ඇත. ඇගයීම් ශිල්ප ක්‍රම 3.2.5 සමාන වේ.

**සාධාරණ අගය තීරණය කිරීම සහ සාධාරණ අගය ධූරාවලිය**
ඇගයීම් ශිල්ප ක්‍රම මඟින් සාධාරණ අගය තීරණය කිරීම සහ අනාවරණය කිරීම සඳහා බැංකුව පහත ධූරාවලිය භාවිතා කරනු ලැබේ.

මට්ටම් 01: හඳුනා ගත හැකි වත්කම් හෝ වගකීම් සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ වල ලැයිස්තුගත (නොගැලපූ ) වෙළෙඳපොළ මිල ගණන්

මට්ටම් 02: ඍජුව හෝ වක්‍රව නිරීක්‍ෂණය කල හැකි සාධාරණ අගය මිණුම්කරණයට සැලකිය යුතු බලපෑමක් ඇති සියළුම යෙදවුම් සඳහා වූ වෙනත් ශිල්ප ක්‍රම

මට්ටම් 03: නිරීක්ෂණය කල හැකි වෙළෙඳපොළ දත්ත මත පදනම් නොවූ වාර්තාකළ සාධාරණ අගය මත සැලකිය යුතු බලපෑමක් ඇති යෙදවුම් භාවිතා කළ ක්‍රමවේද

## 3.3 වගකීම් හා ප්‍රතිපාදන

**3.3.1 වෙනත් ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු අගයන්.**
මේ සඳහා පොළී හරිත තැන්පතු, ඉතුරුම් තැන්පතු, කාලීන තැන්පතු, ඉල්ලීම මත ගෙවිය යුතු තැන්පතු සහ තැන්පතු සහතික අයත් වේ. ඒවා ගෙවිය යුතු අගයන් මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ. මෙම තැන්පතු සඳහා ගෙවිය යුතු පොළී ක්‍රමක්ෂය පිරිවැය පදනම යටතේ ආදායම් ප්‍රකාශනයට කපාහරින අතර අදාළ වගකීම් යටතේ ඉදිරිපත් කරයි.

**3.3.2 ණය ගැනීම්**
ප්‍රතිමූල්‍ය ණය, මුදල් කැඳවීම් ණය සහ මූල්‍ය ආයතන වලින් ලබාගන්නා ණය ඇතුලත් ණයගැනීම් වල ඉතිරි ශේෂයේ දළ අගය පෙන්නුම් කරයි. ගෙවිය යුතු වටිනාකම් මත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරයි. මෙම ණය ගැනීම් සඳහා ගෙවිය යුතු පොළී ක්‍රමක්ෂය පිරිවැය පදනම යටතේ ආදායම් ප්‍රකාශනයට කපාහරිනු ලැබේ.

***3.3.3 විශ්‍රාම ප්‍රතිලාභ***
***3.3.3.1 විශ්‍රාම ප්‍රතිලාභ - නිර්ණය කල ප්‍රතිලාභ සැලසුම්***
1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ බැංකුවට සම්බන්ධ වූ කාලයේ සිට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ. CBEU සාමූහික ගිවිසුමට අනුව වසර 15 කට වැඩි සේවා කාලයක් ඇති විශේෂ සේවකයින් සඳහා ආයුගණක ඇගයීම යටතේ විශේෂ පාරිතෝෂික ප්‍රතිපාදන සිදුකරයි. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව විස්තරයෙහි වෙනත් වගකීම් යටතේ වර්ග කරනු ලැබේ

***3.3.3.2 විශ්‍රාම ප්‍රතිලාභ - නිර්ණය කල දායකත්ව සැලසුම්***
*3.3.3.2.1 සේවක අර්ථසාධක අරමුදල*
සියළුම සේවකයින්ගේ වැටුප මත බැංකුව සහ සේවකයා පිළිවෙලින් 12% ක් හා 8% ක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදල සඳහා අර්ථසාධක අරමුදල කළමණාකරනය කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවනු ලබයි.

*3.3.3.2.2 සේවක භාරකාර අරමුදල*
බැංකුව විසින් සෑම සේවකයෙකුගේ වැටුපින් 3% ක් සේවක භාරකාර අරමුදල කළමණාකරනය කරනු ලබන සේවක භාරකාර මණ්ඩලයට ගෙවනු ලබයි.

*3.3.4 වෙනත් වගකීම්*
ගෙවිය යුතු පාරිතෝෂික/විශ්‍රාම වැටුප් ගාස්තු, වියදම් හා වටිනාකම්ද සහ වෙනත් ප්‍රතිපාදන වෙනත් වගකීම් වලට ඇතුලත් වේ. මූල්‍ය තත්ත්ව දිනට ගෙවීමට අපේක්ෂිත අගයන් මත මෙම වගකීම් වාර්තා කරනු ලැබේ.

### 3.4 ආදායම් හඳුනාගැනීම

**3.4.1 ණය හා අත්තිකාරම් මත පොළී ආදායම**

සියළුම ණය සඳහා සඵල පොළී අනුපාත ක්‍රමය භාවිතා කොට උපචිත පදනමින් පොළී ආදායම හඳුනාගනී.

**3.4.2 හිඟ පොළී ආදායම**

සේවක අර්ථසාධක ණය හැර අනෙක් ණය වාරික ගෙවීම් ප්‍රමාද වීම සඳහා හිඟ පොළිය මුදල් පදනම මත හඳුනාගනී.

### 3.5 වියදම

**3.5.1 තැන්පතු, ණය මත පොළිය**

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 39 යෙහි විධි විධාන වලට අනුව තැන්පතු, ණය මත පොළිය සඵල පොළී අනුපාත ක්‍රමයට හඳුනාගන්නා අතර ආදායම් ප්‍රකාශනයට කපාහරී.

**3.5.2 වෙනත් වියදම්**

සියළුම මෙහෙයුම් වියදම් සහ දේපල, පිරියත සහ උපකරණ ඵලදායී ලෙස පවත්වා ගැනීම සඳහා දරන ලද වියදම් වර්ෂයේ ලාභය හෝ අලාභය ගණනය කිරීමේ දී උපචිත පදනම මත ආදායම් ප්‍රකාශනයට කපාහරී.

**3.5.3 බදුකරණය**

ආදායම් බදු වියදම ප්‍රවර්තන වර්ෂයේ ශුද්ධ බද්දෙන් සහ විලම්භිත බද්දෙන් සැදී ඇත. හිමිකම තුළ හඳුනාගත යුතු අවස්ථාවක සෘජුවම හිමිකම තුළ හඳුනාගන්නා අයිතම හැරුනු විට ආදායම් බදු වියදම් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී.

***3.5.3.1 ප්‍රවර්තන බදුකරණය***

ප්‍රවර්තන හා පෙර වර්ෂ වලට අදාලව බදු අධිකාරීන්ගෙන් අය කරගැනීමට හෝ අධිකාරීන් වෙත ගෙවීමට අපේක්ෂා කරන වටිනාකම් වලින් ප්‍රවර්තන බදු වත්කම් හා වගකීම් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට වලංගු බදු නීති සහ අනුපාත වලට අනුව වටිනාකම් ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. ඒ අනුව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට සහ එහි සංශෝධන වලට අනුව බදුකරණ අරමුණු සඳහා ගලපන ලද වර්ෂය සඳහා ලාභය පදනම් කරගෙන බදුකරණය සඳහා ප්‍රතිපාදන සිදුකරන අතර ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 12- " ආදායම් බදු" ට අනුව සටහන තුළ බදු වියදමෙහි ප්‍රධාන කොටස්, බලපවත්වන බදු අනුපාතය සහ බදු පෙර ලාභය සහ වියදම අතර සැසඳීමක් අඩංගු වේ.

***3.5.3.2 විලම්භිත බදුකරණය***

විලම්භිත බදුකරණය සඳහා වගකීම් ක්‍රමයට ප්‍රතිපාදන සම්පාදනය කරනු ලැබේ. බදුකරණය සඳහා වූ වර්තමාන අනුපාත යටතේ විලම්භිත බදු සඳහා ප්‍රතිපාදන තුළ මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් කාලච්ඡේදයට සාපේක්ෂව වෙනස් කාලච්ඡේදයකදී ආදායම් බදු සඳහා ඉඩ දීම නිසා ඇතිවන කාල වෙනසෙහි බදු බලපෑම ඇතුලත් වේ.

**3.5.3.3 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද**

නිර්දේශ කල අනුපාත යටතේ ගණනය කල ක්ෂය ගැලපූ, සේවකයින් සඳහා ගෙවීම් සහ ආදායම් බදු වලට පෙර ගිණුම්කරන ලාභය මත පදනම්ව මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ගණනය කරයි. එකතු කළ අගය මත බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල කාලච්ඡේදය සඳහා ලාභය මත තීරණය කරනු ලබයි.

### 3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මෙහෙයුම් කටයුතු, ආයෝජන කටයුතු සහ මූල්‍ය කටයුතු මත දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 07 - " මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" ට අනුව "සෘජු ක්‍රමය" භාවිතා කොට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත. දන්නා අගයකට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස් වීමේ අඩු අවදානමක් ඇති කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුක්ත ආයෝජන වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

**3.7.1 ව්‍යවස්ථාපිත සංචිත අරමුදල**

ශ්‍රී ලංකා මහ බැංකු නියමයට අනුව සියළු බෙදාහැරීම් වලට පෙර බදු පසු ශුද්ධ ලාභයෙන් 5% ක් ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කරනු ලබයි.

**3.7.2 පොදු සංචිත අරමුදල**

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතට අනුව ලාභාංශ බෙදා හැරීමට පෙර බදු පසු ශුද්ධ ලාභයෙන් 10% ක් පොදු සංචිත අරමුදලට මාරු කරනු ලබයි.

### 3.8 සාමාන්‍ය කොටස් මත ලාභාංශ

සාමාන්‍ය කොටස් මත ලාභාංශ වගකීමක් ලෙස හඳුනාග න්නා අතර වාර්ෂික මහා සභා රැස්වීමේදී අනුමැතිය ලැබූ විට හිමිකමෙන් අඩු කරනු ලබයි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනෙන් පසුව අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන්ගේ අනුමැතිය සඳහා වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් මත ලාභාංශ නිර්දේශ කරන අතර ඒවා මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන්ව අනාවරණය කරනු ලැබේ.

### 3.9 කොටසක ඉපයුම

බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වෙන් කළ හැකි ලාභය හෝ අලාභය කාලච්ඡේදය තුළ පැවති සාමාන්‍ය කොටස් ගණනෙහි බර තබන ලද සාමාන්‍යයෙන් බෙදා මූලික කොටසක ඉපයුම ගණනය කරනු ලැබේ. සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වෙන් කළ හැකි ලාභය හෝ අලාභය කාලච්ඡේදය තුළ පැවති සාමාන්‍ය කොටස් ගණනෙහි බර තබන ලද සාමාන්‍යයට විය හැකි සියළු තනුක අවස්ථාවන් ගලපා බෙදීමෙන් තනුක කොටසක ඉපයුම ගණනය කල හැකිය.

### 3.10 තොග අගය කිරීම

පාරිභෝජනය කල හැකි තොග පිරිවැය මත වාර්තා කරන අතර තොග අයිතම නිකුත් කිරීම පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමයට සිදු කරයි.

### 3.11 අනෙක් ව්‍යපාර ඒකක සඳහා ඇති බැඳීම

ශේෂ පත්‍ර දිනට අනෙක් ඒකක සඳහා කිසිඳු සැලකිය යුතු බැඳීමක් නොතිබිනි.

### 3.12 නිකුත් කල නමුත් බල නොපවත්වන නව ගිණුම්කරන ප්‍රමිතීන්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 09 - මූල්‍ය උපකරණ
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 - ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම් තුළින් ආදායම්
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 16 - කල්බදු
ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 - ආදායම් බදු ප්‍රමිතියෙහි සංශෝධන
ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතියෙහි සංශෝධන

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. පොළී ආදායම

| රු. | 2016 | 2015 |
|---|---|---|
| පොළී ආදායම | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 81,662,505 | 39,694,272 |
| බැංකු වල ශේෂ | - | - |
| ව්‍යුත්පන්න | - | - |
| අලෙවිය සඳහා පවතින මූල්‍ය වත්කම් | 197,207,866 | 87,172,274 |
| ලාභ අලාභ හරහා සාධාරන අගයට නම් කළ මූල්‍ය වත්කම් | - | - |
| බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ | - | - |
| වෙනත් ගණුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ | 4,129,595,337 | 3,914,187,244 |
| මූල්‍ය ආයෝජන - පරිණත වීම තෙක් තබාගන්නා | 1,064,428,583 | 619,128,955 |
| මූල්‍ය ආයෝජන - අලෙවිය සඳහා පවතින | - | - |
| වෙනත් | - | - |
| **මුළු පොළී ආදායම** | **5,472,894,291** | **4,660,182,745** |

## 2. පොළී වියදම

| රු. | 2016 | 2015 |
|---|---|---|
| බැංකු වලට හිඟ ශේෂ | 87,391,923 | 97,624,960 |
| ව්‍යුත්පන්න | - | - |
| ලාභ අලාභ හරහා සාධාරන අගයට නම් කළ මූල්‍ය වගකීම් | - | - |
| වෙනත් ගණුදෙනුකරුවන්ට හිඟ ශේෂ | 2,594,159,744 | 1,998,587,384 |
| නිකුත් කළ ණය සුරැකුම්පත් | 294,475,409 | 307,960,169 |
| වෙනත් ණය ගැනීම් | 533,268,707 | 135,170,939 |
| **මුළු පොළී වියදම** | **3,509,295,782** | **2,539,343,452** |

## 3. ගාස්තු, කොමිස් ආදායම් සහ වෙනත්

| රු. | 2016 | 2015 |
|---|---|---|
| ගාස්තු හා කොමිස් ආදායම් | 346,974,232 | 253,108,354 |
| වෙනත් | - | - |
| **ගාස්තු හා කොමිස් ආදායම්** | **346,974,232** | **253,108,354** |
| ගිවිසීම | | |
| ණය | 271,077,176 | 216,813,756 |
| කාඩ්පත් | - | - |
| වෙළෙඳ සහ ප්‍රේෂණ | - | - |
| ආයෝජන බැංකුකරණය | - | - |
| තැන්පතු | - | - |
| ඇපවීම් | - | - |
| වෙනත් | 75,897,056 | 36,294,598 |
| ගාස්තු හා කොමිස් ආදායම් | 346,974,232 | 253,108,354 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 4. වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

| රු. | 2016 | 2015 |
|---|---|---|
| ආයෝජන දේපළ ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ) | 111,019,500 | 12,481,500 |
| ආයෝජන දේපළ විකිණීම මත ලාභ/(අලාභ) | (3,289,295) | (439,700) |
| වෙනත් | - | - |
| **වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)** | 107,730,205 | 12,041,800 |

## 5. ණය සහ වෙනත් අලාභයන් සඳහා හානිකරණ ගාස්තු

| රු. | 2016 | 2015 |
|---|---|---|
| ණය සහ ලැබිය යුතු දෑ | | |
| බැංකුවලට | - | - |
| වෙනත් ගණුදෙනුකරුවන්ට | 160,431,754 | 89,230,366 |
| වෙනත් | - | - |
| **එකතුව** | 160,431,754 | 89,230,366 |

### 5.1 වෙනත් ගණුදෙනුකරුවන්ට

| | 2016 | 2015 |
|---|---|---|
| තනි හානිකරණය | (9,077,330) | 255,382 |
| සමූහ හානිකරණය | 169,509,084 | 88,974,983 |
| **එකතුව** | 160,431,754 | 89,230,366 |

## 6. සේවක පිරිවැය

| රු. | 2016 | 2015 |
|---|---|---|
| **වැටුප් සහ අදාළ වියදම්** | | |
| වැටුප් සහ ප්‍රසාද දීමනා | 630,790,948 | 599,910,289 |
| සේවක ණය ප්‍රතිලාභ | 47,823,026 | 42,956,900 |
| සේවක වෛද්‍ය | 34,643,138 | 28,984,670 |
| අතිකාල සහ නිලධාරී දීමනා | 16,169,049 | 12,332,920 |
| වාර්ෂික නිවාඩු මුදල් කිරීම | 23,387,872 | 14,552,470 |
| දිරි දීමනා ගෙවීම් | 21,973,311 | 11,958,132 |
| **අනු එකතුව** | 774,787,345 | 710,695,380 |
| **විශ්‍රාම ප්‍රතිලාභ** | | |
| නිර්ණය කරන ලද දායකත්ව සැලසුම් වලට දායකවීම් | 71,816,470 | 69,574,757 |
| නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් වලට දායකවීම් | 48,667,499 | 48,387,617 |
| **අනු එකතුව** | 120,483,969 | 117,962,374 |
| **එකතුව** | **895,271,314** | **828,657,754** |

### 6.1 ඉහළ කළමණාකරනය සඳහා පාරිශ්‍රමික

| රු. | 2016 | 2015 |
|---|---|---|
| ඉහළ කළමණාකරනය සඳහා මුළු පාරිශ්‍රමික | 52,131,039 | 50,459,298 |
| **එකතුව** | **52,131,039** | **50,459,298** |

### 7. වෙනත් වියදම්

| රු. | 2016 | 2015 |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ වේතන | 2,997,880 | 1,766,320 |
| විගණකයින්ගේ පාරිශ්‍රමික | 507,600 | 685,200 |
| වෘත්තීය වියදම් | 2,778,258 | 2,977,831 |
| නෛතික වියදම් | 925,894 | 514,135 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය | 71,634,219 | 68,133,701 |
| කල්බදු දේපළ ක්‍රමක්ෂය | 364,642 | 364,642 |
| විදුලිය හා ජලය | 26,022,661 | 25,467,491 |
| දුරකථන ගාස්තු | 23,697,332 | 23,733,588 |
| පරිගණක නඩත්තු | 36,177,860 | 24,335,569 |
| කුළී | 69,747,950 | 62,692,471 |
| අළුත්වැඩියා සහ නඩත්තු | 6,540,691 | 6,404,211 |
| ව්‍යාපාර සංවර්ධන සහ ප්‍රචාරණ | 52,617,011 | 52,085,291 |
| වෙනත් කාර්යාල පරිපාලන සහ ආයතනික වියදම් | 220,094,633 | 189,932,798 |
| **එකතුව** | **514,106,630** | **459,093,247** |

### 8. මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු

| රු. | 2016 | 2015 |
|---|---|---|
| මුළු එකතු කළ අගය | 1,442,124,129 | 1,615,048,507 |
| මූල්‍ය සේවා සඳහා ආරෝපණය කල හැකි එකතු කළ අගය | 1,356,088,817 | 1,536,954,427 |
| මූල්‍ය එකතු කළ අගය මත බදු % (අනුපාත වෙනස්වීම නිසා සාමාන්‍ය) | 11.89% | 11.00% |
| වර්ෂය සඳහා මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | 161,491,016 | 169,064,987 |
| පසුගිය වර්ෂයේ ඌන (අධි) වෙන්කිරීම | - | 5,913,674 |
| **මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු එකතුව** | **161,081,452** | **174,978,662** |
| **මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද** | 27,317,620 | 30,762,962 |
| **එකතුව** | **188,399,073** | **205,741,623** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 9. බදු වියදම

| රු. | 2016 | 2015 |
|---|---|---|
| ප්‍රවර්තන බදු වියදම | | |
| ප්‍රවර්තන වර්ෂය | 248,996,146 | 266,812,673 |
| පෙර වර්ෂවල වෙන්කිරීම | 2,711,566 | - |
| විලම්භිත බදු වියදම | 18,130,601 | 27,199,396 |
| **එකතුව** | 269,838,313 | 294,012,070 |

### 9.1 බදු වියදම සැසඳීම

| රු. | 2016 | 2015 |
|---|---|---|
| ගිණුම්කරන ලාභය | 848,493,247 | 1,009,008,080 |
| එකතුකළා: ඉඩනොදෙන වියදම් | 471,251,385 | 308,318,155 |
| අඩුකළා: ඉඩදෙන වියදම් | 430,500,080 | 364,423,830 |
| ගැලපූ බදු පෙර ලාභය | 889,244,552 | 952,902,405 |
| 28% යටතේ ආදායම් බදු | 248,996,146 | 266,812,673 |
| එකතු කළ අගය මත බද්දට පසු ගිණුම්කරන ලාභය | 660,094,175 | 803,266,457 |
| බලපැවැත්වෙන බදු අනුපාතය | 29.35% | 26.44% |
| විලම්භිත බදු සමඟ බලපැවැත්වෙන බදු අනුපාතය | 31.48% | 29.14% |

### 9.2 ගිණුම්කරන ආදායම සහ බදු වියදම අතර සබඳතාවය

| | 2016 | 2015 |
|---|---|---|
| ආදායම් ප්‍රකාශනය අනුව බදු පෙර ලාභය | 848,493,247 | 1,009,008,080 |
| එකතුකළා: ඉඩනොදෙන වියදම් | 471,251,385 | 308,318,155 |
| අඩුකළා : ඉඩදෙන වියදම් | 430,500,080 | 364,423,830 |
| බද්දට යටත් ආදායම | 889,244,552 | 952,902,405 |
| 28% යටතේ බදු | 248,988,475 | 266,812,673 |
| ඌන (අධි) වෙන්කිරීම | 2,711,566 | - |
| අඩුකළා : විලම්භිත බදු ගැලපීම | 18,130,601 | 27,199,396 |
| **ආදායම් බදු සඳහා වෙන්කිරීම** | 269,830,642 | 294,012,070 |

### 9.3 ආදායම් ප්‍රකාශනයෙහි විලම්භිත බදු (බැර)/කපාහැරීම් පහත පරිදි අඩංගු වේ

| | 2016 | 2015 |
|---|---|---|
| විලම්භිත බදු වත්කම් | 1,178,340 | 9,022,831 |
| විලම්භිත බදු වගකීම් | 19,308,941 | 36,222,228 |
| වෙනත් තාවකාලික වෙනස්වීම් | - | - |
| **ආදායම් ප්‍රකාශනයට විලම්භිත බදු (බැර)/කපාහැරීම්** | 18,130,601 | 27,199,396 |

## 10. කොටසක ඉපයුම

| රු. | 2016 | 2015 |
|---|---|---|
| සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වෙන්කළ හැකි ශුද්ධ ලාභය | 390,255,862 | 509,254,388 |
| තනුකයන්හි බලපෑම ගැලපූ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා වෙන්කළ හැකි ශුද්ධ ලාභය | 390,255,862 | 509,254,388 |
| මූලික කොටසක ඉපයුම සඳහා සාමාන්‍ය කොටස් ගණනෙහි බර තබන ලද සාමාන්‍ය | 64,710,520 | 64,710,520 |
| **මූලික කොටසක ඉපයුම (රු.)** | 6.03 | 7.87 |
| **තනුක කොටසක ඉපයුම (රු.)** | - | - |

## 11. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති මුදල් සහ ශේෂයන්

| රු. | 2016 | 2015 |
|---|---|---|
| අතැති මුදල් | 144,695,297 | 145,099,998 |
| **එකතුව** | 144,695,297 | 145,099,998 |

## 12. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

| රු. | 2016 | 2015 |
|---|---|---|
| පරිණත වීම තෙක් රඳවා ගන්නා | | |
| භාණ්ඩාගාර බිල්පත්/ භාණ්ඩාගාර බැඳුම්කර | 531,544,707 | 35,687,587 |
| ප්‍රතිමිලදීගැනුම් ගිවිසුම් යටතේ භාණ්ඩාගාර බිල්පත් | 300,000,000 | 20,000,000 |
| වෙනත් | - | - |
| **එකතුව** | 831,544,707 | 55,687,587 |

## 13. බැංකුවල ඇති ශේෂයන්

| රු. | 2016 | 2015 |
|---|---|---|
| ස්ථානගතකිරීම් | 93,925,495 | 63,070,732 |
| වෙනත් | - | - |
| **එකතුව** | 93,925,495 | 63,070,732 |

## 14. අලෙවිය සඳහා පවතින මූල්‍ය වත්කම්

| රු. | 2016 | 2015 |
|---|---|---|
| ගණුදෙනු කරන ණයකර වල ආයෝජනය | 2,031,029,082 | 2,019,603,937 |
| ඒකක භාර වල ආයෝජනය | 22,250,000 | 23,750,000 |
| **එකතුව** | 2,053,279,082 | 2,043,353,937 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 15. වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ

| රු. | 2016 | 2015 |
|---|---|---|
| දළ ණය සහ ලැබිය යුතු දෑ | 31,051,604,933 | 27,315,911,730 |
| (අඩුකළා) : කේවල හානිකරණ ගාස්තු | (20,983,178) | (30,060,507) |
| සමූහ හානිකරණ ගාස්තු | (770,749,384) | (601,240,300) |
| ඒ අනුව : ණය සහ ලැබිය යුතු දෑ | 30,259,872,371 | 26,684,610,923 |
| ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ | 30,259,872,371 | 26,684,610,923 |

### අ. විශ්ලේෂණය

| රු. | 2016 | 2015 |
|---|---|---|
| නිෂ්පාදන වශයෙන් | | |
| අයිරා | - | - |
| වෙළෙඳ මූල්‍ය | - | - |
| ණයපත් | - | - |
| රත්‍රං | 251,567,151 | 206,385,738 |
| සේවක ණය | 1,176,956,121 | 1,007,209,856 |
| කල්බදු සහ කුළීපිට ගැනුම් | 1,022,779,151 | 749,265,915 |
| කාලීන ණය | - | - |
| කෙටි කාලීන | - | - |
| දිගු කාලීන | 28,600,302,510 | 25,353,050,220 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් | - | - |
| වෙනත් | - | - |
| **දළ එකතුව** | 31,051,604,933 | 27,315,911,730 |
| මුදල් ඒකක වශයෙන් | | |
| ශ්‍රී ලංකා රුපියල් | 31,051,604,933 | 27,315,911,730 |
| ඇමෙරිකානු ඩොලර් | - | - |
| ස්ටර්ලිං පවුන් | - | - |
| වෙනත් | - | - |
| **දළ එකතුව** | 31,051,604,933 | 27,315,911,730 |
| කර්මාන්තය වශයෙන් | | |
| කෘෂිකාර්මික හා ධීවර | - | - |
| නිෂ්පාදන | - | - |
| සංචාරක | - | - |
| ප්‍රවාහන | - | - |
| ඉදිකිරීම් | - | - |
| වෙළෙඳාම් | - | - |
| නව ආර්ථික | 1,006,937,932 | 496,824,323 |
| නිවාස | 30,044,667,001 | 26,819,087,407 |
| **දළ එකතුව** | 31,051,604,933 | 27,315,911,730 |

**ආ. වර්ෂය තුළ කේවල සහ සමූහ හානිකරණ ගාස්තු වල වෙනස් වීම්**

| රු. | 2016 | 2015 |
|---|---|---|
| කේවල හානිකරණ ගාස්තු | | |
| 01/01 දිනට ආරම්භක ශේෂය | 30,060,508 | 29,805,125 |
| වර්ෂය සඳහා අයකිරීම (එකතුකිරීම) | 598,515 | 3,188,349 |
| ආදායමට අයකිරීම (ආපසු) | (9,675,846) | (2,932,966) |
| වෙනත් වෙනස් වීම් | - | - |
| **12/31 දිනට අවසාන ශේෂය** | 20,983,178 | 30,060,508 |
| | | |
| සමූහ හානිකරණ ගාස්තු | | |
| 01/01 දිනට ආරම්භක ශේෂය | 601,240,299 | 512,265,316 |
| වර්ෂය සඳහා අයකිරීම (එකතුකිරීම) | 177,730,571 | 108,580,581 |
| ආදායමට අයකිරීම (ආපසු) | (8,221,486) | (19,605,598) |
| **12/31 දිනට අවසාන ශේෂය** | 770,749,384 | 601,240,299 |
| **මුළු හානිකරණය** | 791,732,562 | 631,300,807 |

### 15.1 ණය කළඹ

| රු. | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| නිවාස ණය | 25,548 | 84.73% | 23,532 | 89.10% |
| ක්ෂුද්‍ර මූල්‍ය | 1,176 | 3.90% | 772 | 2.92% |
| ව්‍යාපාරික ණය | 1,191 | 3.95% | 497 | 1.88% |
| රථවාහන ණය- සේවක | 63 | 0.21% | 25 | 0.10% |
| රත්‍රං | 252 | 0.83% | 206 | 0.78% |
| කල්බදු | 1,023 | 3.39% | 744 | 2.82% |
| ව්‍යාපෘති | 10 | 0.03% | 24 | 0.09% |
| වෙනත් | 888 | 2.90% | 610 | 2.31% |
| දළ ණය සහ අත්තිකාරම් (ලැබිය යුතු පොළී හැර) | 30,151 | 100.00% | 26,410 | 100.00% |

### 16. මූල්‍ය උපකරණ - පරිණත වීම තෙක් රඳවා ගන්නා (ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් හැර)

| රු. | 2016 | 2015 |
|---|---|---|
| හිමිකම් සුරැකුම්පත් | 30,600 | 30,600 |
| ණය සුරැකුම්පත් | - | - |
| ස්ථාවර තැන්පතු | 10,485,476,913 | 10,687,740,340 |
| එක්දින තැන්පතු | - | |
| වාණිජ පත්‍ර | 251,796,723 | 857,065,203 |
| භාර සහතිකපත් | - | 43,505,001 |
| (අඩුකළා) හානිකරණ ගාස්තු | - | - |
| **ශුද්ධ එකතුව** | 10,737,304,235 | 11,588,341,144 |
| ඒ අනුවඃ පරිණත වීම තෙක් රඳවා ගන්නා ආයෝජන ලාභ අලාභ හරහා සාධාරන අගයට නම් කළ | - | - |
| **පරිණත වීම තෙක් රඳවා ගන්නා ආයෝජන** | 10,737,304,235 | 11,588,341,144 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 17. දේපළ, පිරියත හා උපකරණ

රු.

| 2016 | ඉඩම් සහ ගොඩනැගිලි | කල්බදු දේපළ/ රථවාහන | අස්පෘෂ්‍ය වත්කම් | පරිගණක දෘඩාංග/ ATM | කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | | | | | | |
| 2016.01.01 දිනට ආරම්භක ශේෂය | 17,575,000 | 55,592,631 | 72,423,220 | 101,159,521 | 268,247,072 | 218,457,777 | 733,455,222 |
| එකතු කිරීම් | - | 37,060,493 | 13,166,794 | 8,842,792 | 35,271,373 | 31,238,770 | 125,580,221 |
| ඉවත් කිරීම්/කපාහැරීම් | - | 875,364 | 4,469,576 | 16,759,781 | 7,226,454 | 29,331,175 | - |
| විදේශ විනිමය පරතරය | - | - | - | - | - | - | - |
| ගැලපීම් | - | - | - | - | - | - | - |
| **2016.12.31 දිනට අවසාන ශේෂය** | **17,575,000** | **91,777,760** | **85,590,013** | **105,532,737** | **286,758,664** | **242,470,093** | **829,704,268** |
| **අඩුකිරීම්: සමුච්චිත ක්ෂය** | | | | | | | |
| 2016.01.01 දිනට ආරම්භක ශේෂය | 2,074,816 | 5,104,995 | 50,955,470 | 104,976,098 | 111,066,670 | 72,782,704 | 298,562,105 |
| වර්ෂය සඳහා අයකිරීම | - | 5,297,220 | 13,840,651 | 11,935,041 | 28,646,321 | 10,655,179 | 70,374,411 |
| එකතු කිරීම් | - | - | - | - | - | - | - |
| ඉවත් කිරීම් | - | - | - | 2,080,365 | 8,042,530 | 7,226,454 | 17,349,350 |
| විදේශ විනිමය පරතරය | - | - | - | - | - | - | - |
| ගැලපීම් | - | - | - | - | - | - | - |
| **2016.12.31 දිනට අවසාන ශේෂය** | **2,074,816** | **10,402,215** | **64,796,121** | **114,830,774** | **131,670,460** | **76,211,429** | **351,587,166** |
| (අඩුකළා) : හානිකරණ ගාස්තු | - | - | - | - | - | - | - |
| **2016.12.31 දිනට ශුද්ධ පොත් අගය** | **15,500,184** | **81,375,545** | **20,793,892** | **(9,298,037)** | **155,088,205** | **166,258,664** | **478,117,102** |

රු.

| 2015 | ඉඩම් සහ ගොඩනැගිලි | කල්බදු දේපළ/ රථවාහන | අස්පෘෂ්‍ය වත්කම් | පරිගණක දෘඩාංග/ ATM | කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | | | | | | |
| 2015.01.01 දිනට ආරම්භක ශේෂය | 17,574,999 | 56,467,996 | 65,215,288 | 86,116,900 | 211,187,018 | 92,473,231 | 529,035,433 |
| එකතු කිරීම් | - | - | 7,207,932 | 16,589,393 | 61,081,401 | 131,231,146 | 216,109,872 |
| ඉවත් කිරීම් | - | - | 875,363 | 1,546,772 | 4,021,346 | 5,246,600 | 11,690,081 |
| විදේශ විනිමය පරතරය | - | - | - | - | - | - | - |
| ගැලපීම් | - | - | - | - | - | - | - |
| 2015.12.31 දිනට අවසාන ශේෂය | **17,574,999** | **55,592,633** | **72,423,220** | **101,159,521** | **268,247,072** | **218,457,777** | **733,455,223** |
| **අඩුකිරීම්: සමුච්චිත ක්ෂය** | | | | | | | |
| 2015.01.01 දිනට ආරම්භක ශේෂය | 1,556,122 | 6,907,323 | 41,632,884 | 42,095,590 | 85,068,851 | 55,884,720 | 233,145,490 |
| වර්ෂය සඳහා අයකිරීම | 518,695 | 754,493 | 9,322,586 | 12,838,287 | 28,745,099 | 16,911,984 | 69,091,144 |
| එකතු කිරීම් | - | - | - | - | - | - | - |
| ඉවත් කිරීම් | - | - | - | 913,248 | 2,747,280 | 14,000 | 3,674,528 |
| විදේශ විනිමය පරතරය | - | - | - | - | - | - | - |
| ගැලපීම් | - | - | - | - | - | - | - |
| 2015.12.31 දිනට අවසාන ශේෂය | **2,074,817** | **7,661,816** | **50,955,470** | **54,020,629** | **111,066,670** | **72,782,704** | **298,562,106** |
| (අඩුකළා): හානිකරණ ගාස්තු | - | - | - | - | - | - | - |
| 2015.12.31 දිනට ශුද්ධ පොත් අගය | **15,500,182** | **47,930,817** | **21,467,750** | **47,138,893** | **157,180,403** | **145,675,073** | **434,893,117** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 17.1 සම්පූර්ණයෙන් ක්ෂය කළ දේපළ, පිරියත හා උපකරණ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනටත් භාවිතා කළ පිරිවැය සම්පූර්ණයෙන්ම ක්ෂය කළ බැංකුවේ දේපළ, පිරියත හා උපකරණ පහත දැක්වේ.

| 2016 | සම්පූර්ණයෙන්ම ක්ෂය කළ | ක්ෂය කරමින් පවතින | එකතුව |
|---|---|---|---|
| **සින්නක්කර දේපළ, පිරියත හා උපකරණ** | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | - | 17,575,000 | 17,575,000 |
| පරිගණක දෘඩාංග | 12,429,026 | 93,103,711 | 105,532,737 |
| අස්පෘෂ්‍ය වත්කම් | 35,957,973 | 49,632,040 | 85,590,013 |
| කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 16,056,177 | 270,702,488 | 286,758,664 |
| පිරියත හා යන්ත්‍ර | 28,198,933 | 3,023,775 | 31,222,708 |
| උපාංග | 49,425 | 47,270 | 96,695 |
| මෝටර් රථ | 25,613,599 | 41,403,741 | 67,017,340 |
| නොනිමි වැඩ | - | 144,133,350 | 144,133,350 |
| **සින්නක්කර දේපළ, පිරියත හා උපකරණ වල එකතුව** | 118,305,132 | 619,621,375 | 737,926,508 |
| **කල්බදු දේපළ, පිරියත හා උපකරණ** | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | - | 80,127,760 | 80,127,760 |
| මෝටර් රථ | - | 11,650,000 | 11,650,000 |
| කල්බදු දේපළ, පිරියත හා උපකරණ වල එකතුව | - | 91,777,760 | 91,777,760 |
| **මුළු දේපළ, පිරියත හා උපකරණ** | 118,305,132 | 711,399,136 | 829,704,268 |

| 2015 | සම්පූර්ණයෙන්ම ක්ෂය කළ | ක්ෂය කරමින් පවතින | එකතුව |
|---|---|---|---|
| **සින්නක්කර දේපළ, පිරියත හා උපකරණ** | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | - | 17,574,999 | 17,574,999 |
| පරිගණක දෘඩාංග | 37,624,568 | 63,534,953 | 101,159,521 |
| අස්පෘෂ්‍ය වත්කම් | 15,182,580 | 57,240,640 | 72,423,220 |
| කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 12,913,990 | 255,333,083 | 268,247,072 |
| පිරියත හා යන්ත්‍ර | 28,034,033 | 3,125,988 | 31,160,020 |
| උපාංග | 51,925 | - | 51,925 |
| මෝටර් රථ | 25,362,100 | 36,525,458 | 61,887,558 |
| නොනිමි වැඩ | - | - | 125,358,273 |
| **සින්නක්කර දේපළ, පිරියත හා උපකරණ වල එකතුව** | 119,169,195 | 433,335,121 | 677,862,589 |
| **කල්බදු දේපළ, පිරියත හා උපකරණ** | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | - | 55,592,633 | 55,592,633 |
| මෝටර් රථ | - | - | - |
| **කල්බදු දේපළ, පිරියත හා උපකරණ වල එකතුව** | - | 55,592,633 | 55,592,633 |
| මුළු දේපළ, පිරියත හා උපකරණ | 119,169,195 | 488,927,754 | 733,455,222 |

### 17.2 බැංකුවේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ විස්තර

| පිහිටීම | ප්‍රමාණය | ගොඩනැගිලි වර්ග අඩි | ශුද්ධ පොත් අගය | වෙළෙඳපොල වටිනාකම |
|---|---|---|---|---|
| කළුතර ශාඛාව | | | | |
| නො.13, ඥාණෝදය මාවත, කළුතර දකුණ, කළුතර | P 7.535 | 3,420 | 17,575,000 | 29,000,000 |

**තක්සේරු දිනයඃ** 2014 නොවැම්බර් මස 11 වෙනි දින
**තක්සේරුකරුගේ නමඃ** එම්. ඒ ආනන්ද සරත්
**තක්සේරුකරුගේ සුදුසුකම්ඃ** දේපළ කළමණාකරන සහ තක්සේරුකරණ විද්‍යාවේදී (විශේෂ), වරලත් තක්සේරුකරු

### 17.3 බැංකුවේ කල්බදු ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ විස්තර

| පිහිටීම | ප්‍රමාණය | ගොඩනැගිලි වර්ග අඩි | ශුද්ධ පොත් අගය | වෙළෙඳපොල වටිනාකම |
|---|---|---|---|---|
| හයිඩ් පාර්ක් ශාඛාව - නො. 63 , හයිඩ් පාර්ක් කොනර්, කොළඹ 02 (සටහන 01) | P 31 | 1150 | 81,375,545 | 116,000,000 |
| අම්පාර ශාඛාව (සටහන 02) | | | 22,680,345 | - |
| **එකතුව** | | | **104,055,890** | **116,000,000** |

**සටහන 01**
**තක්සේරු දිනයඃ** 2014 නොවැම්බර් මස 13 වෙනි දින
**තක්සේරුකරුගේ නමඃ** එම්. ඒ ආනන්ද සරත්
**තක්සේරුකරුගේ සුදුසුකම්ඃ** දේපළ කළමණාකරන සහ තක්සේරුකරණ විද්‍යාවේදී (විශේෂ),වරලත් තක්සේරුකරු

**සටහන 02**
පිරිවැයට ඇති දේපළ වල ඉදිකිරීම් 2016 සැප්තැම්බර් මස සම්පූර්ණ කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 18. ආයෝජන දේපළ

අ. පිරිවැය/සාධාරණ අගය මත ආයෝජන දේපළ

| රු. | 2016 | 2015 |
|---|---|---|
| **පිරිවැය/සාධාරණ අගය** | | |
| 01. 01 දිනට ආරම්භක ශේෂය | 786,350,000 | 777,648,500 |
| එකතු කිරීම් | - | - |
| ඉවත් කිරීම් | (26,820,000) | (3,780,000) |
| විදේශ විනිමය පරතරය | - | - |
| ගැලපීම්/ ප්‍රත්‍යාගණනය | 111,019,500 | 12,481,500 |
| **12.31 දිනට අවසාන ශේෂය** | 870,549,500 | 786,350,000 |
| **අඩුකිරීම්: සමුච්චිත ක්ෂය** | - | - |
| 01.01 දිනට ආරම්භක ශේෂය | - | - |
| වර්ෂය සඳහා අයකිරීම | - | - |
| එකතු කිරීම් | - | - |
| ඉවත් කිරීම් | - | - |
| විදේශ විනිමය පරතරය | - | - |
| ගැලපීම් | - | - |
| **12.31 දිනට අවසාන ශේෂය** | - | - |
| **(අඩුකළා) : හානිකරණ ගාස්තු** | - | - |
| **12.31 දිනට ශුද්ධ පොත් අගය** | 870,549,500 | 786,350,000 |
| **12.31 දිනට වෙළෙඳපොල අගය** | 870,549,500 | 786,350,000 |

කුලී ආදායම් උපයන්නේ නැති ආයෝජන දේපළ සඳහා දරන අළුත්වැඩියා හා නඩත්තු වියදම් ඇතුළුව මෙහෙයුම් වියදම් තුළ ඇතුළත් කරයි.

### 18.1 ආයෝජන දේපළ වල තක්සේරු විස්තර

| පිහිටීම | ප්‍රමාණය (පර්චස්) | ඔප්පු අංකය | 2016 | 2015 |
|---|---|---|---|---|
| නො. 441, සංඝරාජ මාවත, කොටහේන අළුත්කඩේ නැගෙනහිර | 59.20 | 1127 | 222,000,000 | 207,000,000 |
| නො. 192, ශ්‍රීමත් බණ්ඩාරනායක මාවත, කොටහේන, කොළඹ 13 | 123.20 | 1124 | 493,000,000 | 431,000,000 |
| නො. 192(කොටසක්), ශ්‍රී සංඝරාජ මාවත, කොටහේන, කොළඹ 13 | 15.00 | 1126 | 60,000,000 | 52,500,000 |
| අවිස්සාවේල්ල - නිවාස ව්‍යාපෘතිය | | | 95,549,500 | 95,850,000 |
| **එකතුව** | | | 870,549,500 | 786,350,000 |

### 18.2 ඉඩම් ප්‍රත්‍යාගණනය

නො. 192, සංඝරාජ මාවත, කොටහේන, ඔප්පු අංක 1127
නො. 192, ශ්‍රීමත් බණ්ඩාරනායක මාවත, කොටහේන, කොළඹ 13
නො. 192 (කොටසක්), ශ්‍රී සංඝරාජ මාවත, මාවත, කොටහේන, කොළඹ 13

**තක්සේරුකරුගේ නම** : එම්. ඒ ආනන්ද සරත්
**තක්සේරුකරුගේ සුදුසුකම්** : දේපළ කළමණාකරන සහ තක්සේරුකරණ විද්‍යාවේදී (විශේෂ), වරලත් තක්සේරුකරු
**තක්සේරු දිනය** : 2017 ජනවාරි මස 09 වෙනි දින

### 18.3 අවිස්සාවේල්ල - නිවාස ව්‍යාපෘතිය ප්‍රත්‍යාගණනය

**තක්සේරුකරුගේ නම** : ඩබ්.ඩී සිරිපාල
**තක්සේරුකරුගේ සුදුසුකම්** : වරලත් තක්සේරුකරු
**තක්සේරු දිනය** : 2017 ජනවාරි මස 16 වෙනි දින

### 18.4 ආයෝජන දේපළ මත විභාග වෙමින් පවතින නඩු

ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත 2016 අප්‍රේල් මස 06 වන දින අභියාචනය සඳහා අවසර ලබාදෙන ලෙස ඉල්ලුම් කරමින් අයදුම්පතක් ගොනු කරන ලදී. මෙකී අයදුම්පත ගොනු කරන ලද්දේ HDFC බැංකුවට හිතකර ලෙස බස්නාහිර පළාත් සිවිල් අභියාචනාධිකරණය විසින් නඩු අංක WP/HCCA/COL/180/2012(F) දරන නඩුවේදී ලබාදුන් තීන්දුවට එරෙහිව අභියාචනා කිරීම සඳහා අවසර පතමිනි. 2017 ජනවාරි මස 11 වන දින මෙම අයදුම්පත වෙනුවෙන් කරුණු සලකා බැලූ අවස්ථාවේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් කරන ලද ඉල්ලීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉවත දමන ලදී.

## 19. විලම්භිත බදු වත්කම්/වගකීම්

| රු. | 2016 | 2015 |
|---|---|---|
| විලම්භිත බදු වත්කම් | 88,860,959 | 87,682,619 |
| විලම්භිත බදු වගකීම් | (125,301,828) | (105,992,887) |
| ශුද්ධ එකතුව | (36,440,869) | (18,310,267) |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 19.1 විලම්භිත බදු වත්කම්/වගකීම් තොරතුරු

| රු. | 2016 | 2015 |
|---|---|---|
| **විලම්භිත බදු වත්කම්** | | |
| ගොඩනැගිලි | - | - |
| ගෘහ භාණ්ඩ | - | - |
| පරිගණක මෘදුකාංග - විදේශීය | - | - |
| යන්ත්‍ර සහ උපකරණ | - | 61,745 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 88,860,959 | 87,620,874 |
| **එකතුව** | **88,860,959** | **87,682,619** |
| **විලම්භිත බදු වගකීම්** | | |
| කාර්යාල උපකරණ | 8,937,299 | 7,299,117 |
| සවිකිරීම් | 7,477,548 | 5,110,445 |
| යන්ත්‍ර සහ උපකරණ | 27,864 | - |
| ස්වයං ක්‍රීය ටෙලර් යන්ත්‍ර | 307,364 | 548,061 |
| පරිගණක | 6,898,909 | 7,387,037 |
| පරිගණක මෘදුකාංග - දේශීය | 1,451,353 | 482,320 |
| ගෘහ භාණ්ඩ | 7,080,690 | 7,498,743 |
| විශේෂ වෙන්කිරීම් | 93,120,800 | 77,667,164 |
| **එකතුව** | **125,301,828** | **105,992,887** |

## 20. වෙනත් වත්කම්

| රු. | 2016 | 2015 |
|---|---|---|
| **පිරිවැය** | | |
| ලැබිය යුතු දෑ | 39,853,581 | 8,238,234 |
| තැන්පතු සහ කලින් ගෙවීම් | 43,088,645 | 37,704,452 |
| ණය හා සම්බන්ධ ලැබිය යුතු දෑ | 53,357,933 | 48,866,788 |
| වෙනත් | 16,417,884 | 16,737,400 |
| **එකතුව** | 152,718,042 | 111,546,873 |

## 21. බැංකු සහ වෙනත් ආයතන සඳහා ගෙවිය යුතු දෑ

| රු. | 2016 | 2015 |
|---|---|---|
| බැංකු වලින් ණයගැනීම් | 1,661,716,072 | 1,283,634,282 |
| වෙනත් ආයතන වලින් ණයගැනීම් | 1,656,794,682 | 1,747,478,136 |
| **එකතුව** | 3,318,510,754 | 3,031,112,418 |

## 22. වෙනත් පාරිභෝගිකයින්ට ගෙවිය යුතු දෑ

| රු. | 2016 | 2015 |
|---|---|---|
| ක්‍රමක්ෂය පිරිවැය මත | 32,122,526,537 | 28,592,674,990 |
| **එකතුව** | 32,122,526,537 | 28,592,674,990 |

**අ. විශ්ලේෂණය**

| රු. | 2016 | 2015 |
|---|---|---|
| නිෂ්පාදන වශයෙන් | | |
| ඉතුරුම් තැන්පතු | 5,202,952,736 | 4,183,309,414 |
| ස්ථාවර තැන්පතු | 26,919,573,801 | 24,409,365,576 |
| **එකතුව** | 32,122,526,537 | 28,592,674,990 |
| මුදල් ඒකක වශයෙන් | | |
| ශ්‍රී ලංකා රුපියල් | 32,122,526,537 | 28,592,674,990 |
| **එකතුව** | 32,122,526,537 | 28,592,674,990 |

## 23. නිකුත් කළ ණය සුරැකුම්පත්

| රු. | 2016 | 2015 |
|---|---|---|
| බැංකුව නිකුත් කළ | 5,544,534,335 | 6,005,671,318 |
| වෙනත් පරිපාලිත සමාගම් නිකුත් කළ | - | - |
| **එකතුව** | 5,544,534,335 | 6,005,671,318 |
| වසරක් තුළ ගෙවිය යුතු | - | - |
| වසරකට පසු ගෙවිය යුතු | 5,544,534,335 | 6,005,671,318 |
| **එකතුව** | 5,544,534,335 | 6,005,671,318 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 23.අ. නිකුත් කළ ණය සුරැකුම්පත් වල විස්තර

| වර්ගය | මුහුණත අගය (රු.) | පොළී අනුපාතය | නිකුත් කළ දිනය | පරිණත දිනය | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|
| **බැංකුව නිකුත් කළ** | | | | | | |
| ලැයිස්තුගත, ආරක්ෂිත,නිදහස්කළ හැකි සහ ශ්‍රේණිගත වසර 03 හි ණයකරය | 476,460,000 | 14.50% | 24-Oct-2013 | 23-Oct-2016 | - | 475,332,477 |
| ලැයිස්තුගත, ආරක්ෂිත, නිදහස්කළ හැකි සහ ශ්‍රේණිගත වසර 04 හි ණයකරය | 443,540,000 | 15.00% | 24-Oct-2013 | 23-Oct-2017 | 442,839,667 | 441,704,329 |
| ලැයිස්තුගත, ආරක්ෂිත,නිදහස්කළ හැකි සහ ශ්‍රේණිගත වසර 05 හි ණයකරය | 1,080,000,000 | 15.50% | 24-Oct-2013 | 23-Oct-2018 | 1,077,412,873 | 1,075,193,483 |
| ලැයිස්තුගත, ආරක්ෂිත,නිදහස්කළ හැකි සහ ශ්‍රේණිගති වසර 05 හි ණයකරය (ස්ථාවර අර්ධ) | 2,012,990,000 | 10.50% | 20-Nov-2015 | 20-Nov-2020 | 583,910,751 | 578,966,517 |
| ලැයිස්තුගත, ආරක්ෂිත,නිදහස්කළ හැකි සහ ශ්‍රේණිගත වසර 05 හි ණයකරය (විචල්‍ය කාර්තු) | 578,240,000 | AWPLR+1.5 | 20-Nov-2015 | 20-Nov-2020 | 2,023,460,953 | 2,018,993,653 |
